# වාර්ෂික කාර්ය සාධන වාර්තාව

## வருடாந்தசெயலாற்றுகைஅறிக்கை

## Annual Performance Report

2017



කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය
மகளிர் மற்றும் சிறுவர் விவகார அமைச்சு
Ministry of Women and Child Affairs

# *පටුන*


හැඳින්වීම 03-04

දැක්ම , මෙහෙවර, ආයතන සංයුතිය 05-06

මූලික අපේක්ෂාවන්, ප්‍රධාන උපාය මාර්ග සංවර්ධන අරමුණු, කාර්ය සාධන දර්ශක 07

කාර්ය මණ්ඩල විස්තරය (2016.12.31) 08-09

ජාත්‍යන්තර දින සැමරුම් 10-12

**ආංශීය කාර්ය සාධනය**

පාලන අංශය 13-14

ගිණුම් අංශය 15-17

අභ්‍යන්තර විගණන අංශය 18-20

සැලසුම් අංශය 21-24

සංවර්ධන අංශය 25-37

ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය 38-53

ජාතික කාන්තා කමිටුව 54-70

ළමා ලේකම් කාර්යාලය 71-84

*කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ*

*2017 වර්ෂයේ කාර්ය සාධන වාර්තාව*

*2002 සැප්තැම්බර් 12 දිනැති*

*රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 402 හි*

*උපදෙස් පරිදි පිළියෙල කර ඇත.*

# 01.හැඳින්වීම

කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය ශ්‍රී ලාංකේය කාන්තා හා ළමා පරපුරේ උන්නතිය උදෙසා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2015.09.21 දිනැති අංක 1933/13 දරණ අති විශේෂ ගැසට් නිවේදනයෙන් පවරා දෙන ලද කාර්යයන්, ක්‍රියාවට නැංවීම උදෙසා අදාළ පරිදි අමාත්‍යාංශය වෙත සුවිශේෂී කාර්යය භාරයක් පැවරී ඇත.

ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥාප්තිය හා කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ හිංසනයන් පිටුදැකීම පිළිබඳ සම්මුතියේ සඳහන් කරුණු ඇතුළත්වූ කාන්තා ප්‍රඥාප්තිය පාදක කරගෙන ළමා හා කාන්තා අයිතිවාසිකම් තහවුරු කිරීම, ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා නීති සම්පාදනය,ප්‍රතිපත්ති සකස් කිරීම, වැඩසටහන් මෙහෙයවීම යන කාර්යයන්, අමාත්‍යාංශය හා ඊට අයත් ආයතන විසින් සාර්ථකව ක්‍රියාවට නංවා ඇත.

විශේෂයෙන් තිරසර හා තුලනාත්මක සංවර්ධනයක් තුළින් කාන්තා හා ළමා පරපුර සවිබල ගැන්වීම සඳහා දශක ගණනාවක සිට ඉස්මතුව පැවති අවශ්‍යතාවයන් රැසක් ඉටුකර ගැනීම අරමුණු කර ගනිමින් ජාතික මට්ටමේ උපායමාර්ග හා ප්‍රතිපත්ති සම්පාදනයන් බොහොමයක් අපේක්ෂිත මට්ටමින් ඉටු කිරීමට අප සමත් වූයෙමු. එතුළින් කාන්තාවන් හා ළමුන් සවිබල ගැන්වීම හා ඔවුන් සංවර්ධනයේ ප්‍රධාන පාර්ශවකරුවන් ලෙස සහභාගී කර ගැනීමටත් සංවර්ධනයේ සාධනීය ප්‍රතිඵල ඔවුන් වෙත ගලායාම තහවුරු කිරීමටත් අවස්ථාවන් නිර්මාණය විය.

ඒ අනුව වැන්දඹු හා ගෘහමූලික කාන්තාවන් සඳහා ජාතික ප්‍රතිපත්තිය හඳුන්වා දීම, වැන්දඹු හා ගෘහමූලික කාන්තාවන් සඳහා තුන් අවුරුදු සැලැස්මක් සකස් කිරීම, ස්ත්‍රී-පුරුෂ සමාජභාවය හා ලිංගිකත්වය පදනම් කරගත් හිංසනය වැළැක්වීම සඳහා වන ජාතික ක්‍රියාකාරී සැලැස්ම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීම හා එයට අදාල අංශ යටතේ එහි ක්‍රියාකාරීත්වය අරඹා ඇත. තවද, අමාත්‍යාංශ මට්ටමින් ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය මූලප්‍රවාහකරණ යාන්ත්‍රණය ප්‍රතිව්‍යුහගත කිරීම, ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අයවැයකරණයට අදාල මාර්ගෝපදේශ සැකසීම, ළමා ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම හා පසුවිපරම් ක්‍රියාවලිය ශක්තිමත් කිරීම, දිවා සුරැකුම් මධ්‍යස්ථාන සඳහා මාර්ගෝපදේශ සංග්‍රහයකට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීම හා මුල් ළමාවිය සංවර්ධන ජාතික ප්‍රමිතීන් එළිදැක්වීම හා ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු සංවිධානය කිරීම ද සිදු කෙරිණි.

ඉහත ප්‍රතිපත්ති හා සැලසුම් සම්පාදන ක්‍රියාවලියට අමතරව කාන්තාවන් හා ළමුන් ඉලක්ක කරගත් සංවර්ධන වැඩසටහන් බහුවිධ ප්‍රවේශයන් ඔස්සේ ක්‍රියාවට නැංවීමට අමාත්‍යාංශයට 2017 වසරේ දී හැකිවිය. ශ්‍රී ලංකාවේ කාන්තාවන් සවිබල ගැන්වීමේ ක්‍රියාවලියේ ප්‍රබල අවශ්‍යතාවයක්ව පවතින තීරණ ගැනීමේ ක්‍රියාවලියේ හා දේශපාලනයේ කාන්තා නියෝජනය ඉහළ නැංවීමට විවිධ ප්‍රවේශයන් ඔස්සේ දැනුවත් කිරීමේ වැඩසටහන් දියත් කරන ලදී. එමෙන්ම දිවයිනේ දිස්ත්‍රික් 05 කට බලපෑ ගංවතුර, නායයාම් හා ආපදාවන්ට මුහුණ දුන් කාන්තාවන් හා එම පවුල් නැවත ආර්ථික වශයෙන් බලගැන්වීම උදෙසා රුපියල්

මිලියන 75 කින් යුත් විශේෂ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට ද හැකියාව ලැබුණි. විශේෂයෙන් උතුරු හා නැගෙනහිර පළාත් ඇතුළුව සමස්ත දිවයිනම ආවරණය වන පරිදි වැන්දඹු හා ගෘහමූලික කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබල ගැන්වීමට කෘෂිකාර්මික, ධීවර, සත්ත්ව පාලන, ගෘහ කර්මාන්ත හා වෙළඳ ව්‍යාපාර සඳහා රුපියල් මිලියන 48 ක ප්‍රතිපාදන සලසා දීමට අමාත්‍යාංශයට හැකිවිය.

ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක වන මුල් ළමාවිය සංවර්ධන ව්‍යාපෘතිය මඟින් විශේෂයෙන්ම වතුකරය ද ඇතුළු සමස්ථ දිවයින පුරා පිහිටි සිගිති පෙර පාසල් හා මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානවල භෞතික හා යටිතල පහසුකම් සංවර්ධනය, මානව සම්පත් සංවර්ධනය , අධීක්ෂණය හා පසුවිපරම් ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා කාර්යයන් රැසක් ඉටුකර ඇත. මේ යටතේ මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන 6000 ක් සඳහා ඉගෙනුම් හා ඉගැන්වීම් උපකරණ ලබා දීම, නියමු පුහුණුකරුවන් පුහුණුකිරීම, කෙටිකාලීන සේවාස්ථ පෙරපාසල් ගුරු පුහුණු වැඩසටහන් පැවැත්වීමට ද කටයුතු සිදුකර ඇත.

දිවයිනේ ළමා මන්දපෝෂණය බහුලව පවතින ප්‍රදේශයන් තෝරාගෙන ඒවායෙහි පෙර පාසල් දරුවන් සඳහා උදෑසන පෝෂදායී ආහාර වේලක් ලබා දීමේ වැඩසටහනක් මේ වන විට සාර්ථකව ක්‍රියාත්මක කරමින් පවතී. ගැබිණි හා කිරිදෙන මව්වරුන්ගේ පෝෂණය වර්ධනය සඳහා රුපියල් මිලියන 5500 ක ප්‍රතිපාදන යටතේ විශේෂ පෝෂණ වැඩසටහන් ක්‍රියාත්මක වේ. දිවා සුරැකුම් මධ්‍යස්ථානවල කාර්යමණ්ඩලය සඳහා වෘත්තීය පුහුණු පාඨමාලාවන් පැවැත්වීමට හැකිවීමත්, විපතට පත් පවුල් වල ළමුන් සඳහා ආධාර ලබා දීමේ වැඩසටහන් අඛණ්ඩව පවත්වා ගෙන යාමටත් හැකිවිය. ආරක්ෂක සැලසුම් සකස් කිරීම තුළින් අවදානම් තත්ත්වයෙන් සිටින ළමුන්ගේ රැකවරණය තහවුරු කිරීමට මෙන්ම එම පවුල් සඳහා විශේෂිත සැලසුම් යටතේ පවුල් සවිබල ගැන්වීම් ව්‍යාපෘති ක්‍රියාවට නැංවීමට හැකිවීම සතුටට කරුණකි.

ඒ අනුව 2017 වසරේදී අප රටේ කාන්තාවන් හා දරුවන් උදෙසා වඩාත් ඵලදායී ඉලක්කයක් ලඟා කරගත් අතර 2018 වසරේ දී ද කාන්තා හා ළමා සංවර්ධනයට අදාල ජාතික ඉලක්කයන් කරා ලඟා වීමට ශක්තිමත් ප්‍රවේශයකින් යුතුව කටයුතු කිරීමට අප බලාපොරොත්තු වන්නෙමු.

# 02.දැක්ම හා මෙහෙවර


## දැක්ම

ළමුන් හා කාන්තාවන්ගේ අයිතිවාසිකම් හා ආරක්ෂාව තහවුරු කෙරෙන ඔවුන්ට හිතකර , සංවේදී සමාජයක් බිහි කිරීම

## මෙහෙවර

අභිමානවත් දේශයක් වෙනුවෙන් සමාජ ආර්ථික බලගැන්වීම, සමාජ වටිනාකම් ප්‍රවර්ධනය සහ අදාළ සියලු පාර්ශවයන්ගේ උපාය මාර්ගික ඒකාබද්ධ සහභාගිත්වය ලබාගැනීම මඟින් ළමා හා කාන්තා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා යහපාලන භාවිතාවන් තහවුරු වන පරිදි අදාළ අවශ්‍යතා සම්පාදනය කිරීම සහ ප්‍රතිපත්ති සකස් කිරීම,

# 03.ආයතනික සංයුතිය




## 04.මූලික අරමුණු හා උපාය මාර්ග

## සංවර්ධන අරමුණු

## මූලික අරමුණු

- ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ සංවර්ධනය උදෙසා ජාතික ප්‍රතිපත්තියක් සැකසීම.
- කාන්තා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ සංවර්ධනය උදෙසා ජාතික සැලැස්මක් සකස් කිරීම.
- ළමා හා කාන්තා සංවර්ධනය සඳහා යාන්ත්‍රණයක් සකස් කර ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පහසුකම් සැලසීම.
- රාජ්‍ය ආයතනරාජ්‍ය , නොවන ආයතනවිදේශ ආයතන සහ පෞද්ගලික අංශ සම්බන්ධීකරණය , කරමින් ළමා හා කාන්තා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ළමා හා කාන්තා ආරක්ෂණය සහ සංවර්ධනය සඳහා වූ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- අමාත්‍යාංශය සහ ඊට අයත් නියෝජිත ආයතන මඟින් සිදුකරනු ලැබූ ආරක්ෂණ සහ සංවර්ධන වැඩ සටහන් අධීක්ෂණය කිරීම.
- ළමුන් හා කාන්තාවන් සම්බන්ධව ක්‍රියා කිරීමට ශ්‍රී ලංකාව බැඳීසිටින සියලුම ජාත්‍යන්තර සම්මුතීන් හා එකඟතාවයන් සඳහා නීති ,ප්‍රතිපත්ති හා වැඩසටහන් සම්පාදනය .
- ළමා අපයෝජනය පිටු දැකීමෙහිලා අවශ්‍ය නෛතික හා ජාතික ප්‍රතිපත්තීන්ගෙන් සැදි පරිසරයක් ස්ථාපිත කිරීම.

## උපාය මාර්ග සංවර්ධන අරමුණු

- ඉහළ ගුණාත්මකභාවයකින් යුතු මුල් ළමාවිය සංවර්ධන හා රැකවරණ සේවාවක් තහවුරු කිරීම .
- නිවාසගත ළමුන්ගේ සුබසාධනය උදෙසා අයිතිවාසිකම් තහවුරු කිරීම හා ඔවුන් සමාජගත කිරීම .
- ළමා අපයෝජන වැළැක්වීම හා අවමකිරීම.
- අනාරක්ෂිත කාන්තා පවුල් සංවර්ධනය .
- ළමුන්ගේ හා කාන්තාවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා නීති හා ප්‍රතිපත්තිමය මැදිහත්වීම .

- ශ්‍රී ලංකාව බැඳීසිටින ජාත්‍යන්තර සම්මුතීන්ට ගැලපෙන පරිදි දේශීය ළමා හා කාන්තා සංවර්ධන ක්‍රමෝපායන් ස්ථාපිත කිරීම .

# 05.කාර්ය මණ්ඩල විස්තර

## කාර්ය මණ්ඩල විස්තර (2017.12.31 දිනට)

| අනු අංකය | තනතුර | සේවය | ශ්‍රේණිය පන්තිය | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| | ජ්‍යෙෂ්ඨ මට්ටම | | | | |
| **01.** | ලේකම් | ශ්‍රී.ලං.ප.සේ | | 01 | 01 |
| **02.** | අතිරේක ලේකම් (පාලන හා මුදල්) | ශ්‍රී.ලං.ප.සේ | (විශේෂ) | 01 | 01 |
| **03.** | අතිරේක ලේකම් (සංවර්ධන) | ශ්‍රී.ලං.ප.සේ | (විශේෂ) | 01 | 01 |
| **04.** | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | ශ්‍රී.ලං.ප.සේ | SL-1 | 01 | 01 |
| **05.** | ප්‍රධාන ගණකාධිකාරී | ශ්‍රී.ලං.ග.සේ | SL-1 | 01 | 01 |
| **06.** | ප්‍රධාන අභ්‍යන්තර විගණක | ශ්‍රී.ලං.ග.සේ | SL-1 | 01 | 01 |
| **07.** | අධ්‍යක්ෂ (සංවර්ධන) | ශ්‍රී.ලං.ප.සේ | SL-1 | 02 | 01 |
| **08.** | අධ්‍යක්ෂ (කාන්තා කාර්යාංශය) | ශ්‍රී.ලං.ප.සේ | SL-1 | 01 | 01 |
| **09.** | අධ්‍යක්ෂ(සැලසුම්) | ශ්‍රී.ලං.ක්‍ර.ස.සේ | SL-1 | 01 | 01 |
| 10. | ගණකාධිකාරී | ශ්‍රී.ලං.ග.සේ | SL-11/111 | 02 | 00 |
| 11. | නියෝජ්‍ය අධ්‍යක්ෂ /සහකාර අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.ප.සේ | SL-11/111 | 05 | 05 |
| 12. | නියෝජ්‍ය අධ්‍යක්ෂ /සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) | ශ්‍රී.ලං.ක්‍ර.ස.සේ | SL-11/111 | 02 | 02 |
| 13. | සහකාර ලේකම් | ශ්‍රී.ලං.ප.සේ | SL-1 11/111 | 02 | 02 |
| 14. | සහකාර අධ්‍යක්ෂ (ICT) | ශ්‍රී.ලං.තො.තා.සේ. | 1 පන්තිය 111 ශ්‍රේණිය | 01 | 01 |
| 15. | සහකාර අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.තො.තා.සේ. | 111/11 | 01 | 01 |
| 16. | නීති නිලධාරි | දෙපාර්තමේන්තුගත | 111/11 | 03 | 03 |
| | **තෘතීක මට්ටම** | | | | |
| **17.** | පරිපාලන නිලධාරි | රාජ්‍යකළමනාකරණ සහකාර සේවය (අධිපන්තිය) | MN-07 | 01 | 01 |
| **18.** | පර්යේෂණ නිලධාරි | දෙපාර්තමේන්තුගත | MN-06 | 01 | 01 |
| **19.** | භාෂා පරිවර්තක (සිංහල/ ඉංග්‍රීසි හා දෙමළ/සිංහල | භාෂා පරිවර්තක සේවය | MN-06 | 02 | 01 |
| **20.** | උපදේශන නිලධාරි | දෙපාර්තමේන්තුගත | MN-05 | 13 | 12 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | **ද්වීතීක මට්ටම** | | | | |
| **21.** | සංවර්ධන සහකාර | ආශ්‍රිත සේවා | MN-04 | 24 | 22 |
| **22.** | වනිතා සංවර්ධන නිලධාරි | දෙපාර්තමේන්තුගත | MN-04 | 335 | 282 |
| **23.** | අයවැය සහකාර | ආශ්‍රිත සේවා | MN-04 | 01 | 01 |
| **24.** | සංවර්ධන  නිලධාරි | සංවර්ධන නිලධාරි සේවය | MN-04 | 516 | 336 |
| **25.** | පුස්තකාලයාධිපති | පුස්තකාලයාධිපති සේවය | MN-03 | 01 | - |
| **26.** | රාජ්‍ය කළමනාකරණ සහකාර | රා. ක.ස.සේ. (1,11,111) | MN-02 | 40 | 34 |
| **27.** | පුස්තකාල සහකාර | දෙපාර්තමේන්තුගත | MN-01 | 01 | 01 |
| **28.** | පිළිගැනීමේ නිලධාරි | දෙපාර්තමේන්තුගත | MN-01 | 01 | 01 |
| **29.** | සහන සොයුරි | දෙපාර්තමේන්තුගත | MN-01 | 134 | 124 |
| **30.** | නේවාසිකාගාර පාලිකා | දෙපාර්තමේන්තුගත | MN-01 | 02 | - |
| **31.** | නේවාසිකාගාර පාලිකා (සහකාර) | දෙපාර්තමේන්තුගත | MN-01 | 02 | - |
| **32.** | තොරතුරුතාක්ෂණහාසන්නිවේදන ස. | තො.තා.හා ස.ස | MT-01 | 03 | 02 |
| **33.** | කැමරා ශිල්පි | දෙපාර්තමේන්තුගත | MT-01 | 01 | 01 |
| **34.** | නිශ්චල ඡායාරූප ශිල්පි | තාවකාලික | MT-01 | 01 | 01 |
| | **ප්‍රාථමික මට්ටම** | | | | |
| **35.** | රියදුරු | ඒකාබද්ධ රියදුරු සේ. | PL-03 | 33 | 28 |
| **36.** | කැමරා ශිල්පී සහායක | තාවකාලික | PL-01 | 01 | 01 |
| **37.** | කාර්යාල කාර්ය සහයක | කා.සේ.සේ | PL-01 | 25 | 20 |
| **38.** | උපදේශන සේවා කම්කරු | දෙපාර්තමේන්තුගත | PL-01 | 12 | 11 |
| **39.** | අරක්කැමි | දෙපාර්තමේන්තුගත | PL-01 | 02 | - |
| | **ළමා ලේකම් කාර්යාලය** | | | | |
| **40.** | අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.ප.සේ | SL-1 1 | 01 | 01 |
| **41.** | සහකාර අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.ප.සේ | SL-11/111 | 04 | 04 |
| **42.** | මුල් ළමාවිය සංවර්ධන සහකාර | සං.නි.සේ | MN-04 | 373 | 327 |
| **43.** | රාජ්‍ය කළමනාකරණ සහකාර | රා. ක.ස.සේ. (1,11,111) | MN-02 | 03 | 01 |
| **44.** | රියදුරු | ඒකාබද්ධ රි.සේ | විශේෂ | 02 | 01 |
| **45.** | කාර්යාල කාර්ය සහායක | කා.සේ.සේ | විශේෂ | 03 | 03 |

# 06.ජාත්‍යන්තර දින සැමරුම්

## *ජාත්‍යන්තර කාන්තා දිනය*

2017 ජාත්‍යන්තර කාන්තාදින ජාතික උත්සවය මාර්තු 08 වන දින කාන්තා හා ළමා කටයුතු ගරු අමාත්‍ය චන්ද්‍රාණි බණ්ඩාර මැතිණියගේ ප්‍රධානත්වයෙන් මාතර සනත් ජයසූරිය ක්‍රීඩාංගනයේදී අභිමානවත් ලෙස සමරන ලදී.**"*තුන්කල් දකින්නී-සවියෙන් දිනන්නී*"** මෙවර ජාත්‍යන්තර කාන්තා දිනයේ ප්‍රධාන තේමාව වූ අතර එය ව්‍යවසායක කාන්තාවන් තවදුරටත් දිරිගැන්වීම සඳහා ඉලක්ක කරන ලදී.ජාතික උත්සවයට සමගාමීව දෙදිනක් පුරා මාතර දිස්ත්‍රික්කයේ ව්‍යවසායක කාන්තාවන්ගේ නිෂ්පාදන ඇතුලත් වෙළඳ කුටි 75කින් සමන්විත අලෙවිපොළක් හා නිෂ්පාදන ප්‍රදර්ශණයක් ද කාන්තාවන් උදෙසා සෞඛ්‍ය සේවාවන් හා වෙනත් අත්‍යාවශ්‍ය සේවාවන් ගෙන් සමන්විත ජංගම සේවාවක්ද පවත්වන ලදී. මීට අමතරව 2017.03.01 වන දින ජාත්‍යන්තර කාන්තා දිනයේ වැදගත්කම හා කාන්තාවන්ට එරෙහි සිදුවන හිංසනයන් සම්බන්ධයෙන් ජනතාව උද්දේශණය කිරීමේ අරමුණින් විහාරමහාදේවි උද්‍යාන පරිශ්‍රය වට රවුමේද සිවිල් සංවිධාන ක්‍රියාකාරිනියන් ඇතුළු විශාල කාන්තා සහභාගීත්වයකින් යුතුව පා ගමනක් පවත්වන ලදී.



## *ලෝක ළමා දිනය*

තේමාව- "*මා පිය වැඩිහිටි සෙනෙහස රදවමු-සොදුරු ලොවක් වෙත දරුවන් කැදවමු*"

2017 වර්ෂයේ ලෝක ළමා දින ජාතික උත්සවය 2017 ඔක්තෝබර් මස 01 වන දින කාන්තා හා ළමා කටයුතු ගරු අමාත්‍ය චන්ද්‍රාණි බණ්ඩාර මැතිනියගේ ප්‍රධානත්වයෙන් අනුරාධපුරයේදී පවත්වන ලදී.අනුරාධපුර දිස්ත්‍රික්කයම ආවරණය වන පරිදි තෝරාගත් පාසල් ළමුන් 800ක් ජාතික උත්සවයට සහභාගී වූ අතර විවිධ විෂයන් හා විෂය බාහිර ක්‍රියාකාරකම් සඳහා සුවිශේෂි දක්ෂතා දැක්වූ දරුවන් සඳහා ත්‍යාග හා සහතිකපත් ප්‍රදානයද මෙහිදී සිදුවිය. ජාතික වැඩසටහනට සමගාමීව ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් දැනුවත් කිරීමේ වැඩ සටහන් හා පෙර පාසැල් දරුවන් සඳහා රසවින්දනාත්මක වැඩ සටහන් ද ක්‍රියාත්මක කරන ලදී.



### *ජාත්‍යන්තර ගැහැණු දරුවාගේ දිනය*

ඔක්තෝබර් 11 දිනට යෙදී ඇති මෙම ජාතික දිනය වෙනුවෙන් “***දියණියේ, සුරක්ෂිත ලොවක පරිපූර්ණ වීමට අප ඔබට අත දෙමු !***”යන තේමාව යටතේ පවත්වන ලද ජාතික වැඩසටහන 2017.10.11 දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වන ලද අතර, මෙයට සමගාමීව පාසල් ළමුන් 1000කගේ සහභාගීත්වයෙන් පා ගමනක්ද පවත්වන ලදී.දිස්ත්‍රික් 25 ම ආවරණය වන පරිදි එක දිස්ත්‍රික්කයකින් දුෂ්කර මෙන්ම අඩුපාඩු සහිත පාසල් එක බැගින් තෝරාගෙන එම පාසල් 25ටම අදාල ළමුන්,දෙමාපියන් සහ ගුරුවරුන් දැනුවත්කිරීම සඳහා ගැහැණු ළමයා සවිබල ගැන්වීම තේමා කරගනිමින් සැකසූ විදී නාට්‍යක් ප්‍රදර්ශනයටද කටයුතු කරන ලදී.

# ආංශික කාර්ය සාධනය

[redacted]

## ප්‍රධාන කාර්යභාරය

01. අමාත්‍යාංශයේ කාර්යමණ්ඩලය සම්බන්ධ ආයතනික කටයුතු සම්බන්ධීකරණය හා විනය ,කාර්යයන් පවත්වාගෙන යාම.

02. අමාත්‍යාංශයට අනුමත වූ තනතුරුවල ඇතිවන පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් සිදු කිරීම.

03. අමාත්‍යාංශයේ ව්‍යාපෘති හා කාර්යයන් ඉටු කිරීමට අවශ්‍ය නව තනතුරු මු 71.රෙ.ට අනුව ඇති කිරීමට කටයුතු කිරීම.

04. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ට අනුව දෙපාර්තම 2006/6ේන්තු තනතුරු සඳහා බඳවා ගැනීමේ පරිපාටි / උසස් කිරීමේ පරිපාටි සංශෝධනයන් සකස් කර අනුමත කර ගැනීම හා උසස් කිරීමේ ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම.නව තනතුරු සඳහා බඳවා ගැනීමේ පරිපාටි සකස් කර අනුමත කරවා ගැනීම .

05. අමාත්‍යාංශයට අයත් අංශ ආයතන සමඟ සම්බන්/ධීකරණය වෙමින් පාර්ලිමේන්තු ප්‍රශ්න වලට පිළිතුරු සැපයීම හා වෙනත් සම්බන්ධිත කාර්යයන් සිදු කිරීම අයවැය කාරක) .සභාව ,රාජ්‍ය ගිණුම් කාරක සභාව,මහජන පෙත්සම් කාරක සභාව(කල්තැබීමේ යෝජනා සම්බන්ධයෙන් කටයුතු,

06. අමාත්‍ය මණ්ඩල සංදේශ සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල කාර්යාලය හා සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම.

07. මහජන දුක්ගැනවිලි සම්බන්ධයෙන් ජනාධිපති කාර්යාලය හා අග්‍රාමාත්‍ය කාර්යාලය සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම.

08. අමාත්‍ය කාර්යාලය හා රාජ්‍ය අමාත්‍ය කාර්යාලයට අයත් කාර්යය මණ්ඩලයේ ආයතනික කටයුතු සිදුකිරීම.

09. තැපැල අංශ වලට බෙදා හැරීම හා පිටතට යැවෙන ලිපි තැපැල් කිරීම.

10. සැපයුම් හා සේවා පවත්වාගෙන යාම ,විදුලි බිල්පත් ,පිරිසිදු කිරීම් ,ආරක්ෂක)බිල්පත්,පුවත්පත්, ප්‍රවාහන පහසුකම්සංග්‍ර,දුම්රිය ගමන් බලපත්‍ර ,වේශ පත්‍රදුම්රිය වාර ප්‍ර,දුරකථන ,හ කටයුතු(වාහන රක්ෂණය ,
11. වාහන සංචිතය පවත්වාගෙන යාමඅලුත්වැඩියා කිරීම හා අලුත් වාහන මිලදී , වාහන අපහරණය කිරීම , .ගැනීම
12. ගොඩනැගිලි හා උපකරණ නඩත්තු කටයුතු.
13. අත්තිකාරම් ණයවිශේෂ අත්ති ,උත්සව අත්තිකාරම් ,කාරම්භාර රක්ෂණ දේපල ණය හා අග්‍ර ,ආපදා ණය , ක්‍රමයේ ආයතනික කටයුතු.

14. බියගම කාන්තා සෙවණ නේවාසිකාගාර කටයුතු.
15. අමාත්‍යාශයීය කාර්යය මණ්ඩලය සඳහා ආයතන හා මුල්‍ය කටයුතු පිළිබඳව පුහුණු වැඩ සටහන් පැවැත්වීම.
16. අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන කටයුතු

## ➢ කාර්යමණ්ඩල කටයුතු

2017.12.31 දිනට අමාත්‍යාංශය සඳහා අනුමත මුළු සේවක සංඛ්‍යාව 1561 කි.එදිනට පුරප්පාඩු සංඛ්‍යාව 339 කි. 2017 වසර තුළ රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිලධාරීන්අට දෙනෙකු ලබා ගැනීමට හැකි විය. ඊට අමතරව පර්යේෂණ නිලධාරියෙකු සහ නීති නිලධාරීන් දෙදෙනෙකු බඳවා ගැනීමට හැකි විය.

කාර්ය මණ්ඩලයේ සියලුම නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු ක්‍රමවත්ව පවත්වාගෙන යාම හා යාවත්කාලීන කිරීම, එදිනෙදා නිවාඩු සම්බන්ධ රාජකාරී,වැටුප් වර්ධක ලබා දීම, ස්ථාන මාරුවීම්, විශ්‍රාම ගැන්වීම් ආදී පරිපාලන කටයුතු නිසි පරිදි සිදු කර ඇත.එසේම අමාත්‍ය කාර්ය මණ්ඩලය හා රාජ්‍ය අමාත්‍ය කාර්ය මණ්ඩලයේ ද ආයතන හා පරිපාලන කටයුතු නිසි පරිදි සිදු කර ඇත.

අමාත්‍යාංශයට අයත් සියලුම නිලධාරීන්ගේ දැනුම, කුසලතා හා ආකල්ප සංවර්ධනය, තාක්ෂණික හැකියාව සහ භාෂා ප්‍රවීණතාවය ඉහළ නැංවීම අරමුණු කරගෙන දේශීය හා විදේශීය පුහුණු පාඨමාලා සඳහා නිලධාරීන් අඛණ්ඩව යොමු කර ඇත.

විධායක නිලධාරීන් හා සංවර්ධන නිලධාරීන් විදේශ පුහුණු සඳහා යොමු කර ඇත.

## ➢ අනුබද්ධ ආයතනවල කටයුතු

අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව,ජාතික ළමා ආරක්ෂක අධිකාරිය යන ආයතනවල පරිපාලන කටයුතු සම්බන්ධීකරණය හා මඟපෙන්වීම සම්බන්ධයෙන් පාලන අංශය ක්‍රියාකර ඇත. උක්ත ආයතනවල රා.ප.ව 6/2006 අනුව බඳවා ගැනීමේ පරිපාටි සංශෝධනය,කාර්ය මණ්ඩලයේ තනතුරු ඇති කිරීම,පත් කිරීම,උසස් කිරීම,කාර්ය මණ්ඩලයේ සේවා ගැටළු පිළිබඳව අමාත්‍යාංශයට ඉදිරිපත් කරන පැමිණිලි සම්බන්ධ කටයුතු නිසි පරිදි සිදු කර ඇත.එසේම මෙම ආයතනවල නිලධාරින්ගේ විදේශ සංචාර,ශිෂ්‍යත්ව,පුහුණු පාඨමාලා සඳහා අනුමැතිය ලබා දීමද අදාළ පරිදි නිවාඩු ලබා දීම ද සිදු කර ඇත.

# 08.ගිණුම් අංශය

## ප්‍රධාන කාර්යභාරය

මුදල් විෂය සම්බන්ධයෙන් භාණ්ඩාගාරය සමඟ විධිමත් සම්බන්ධීකරණයක් ඇති කර ගනිමින් එම සැලසුම් ක්‍රියාත්මක කරවීමේ කටයුතු,ව්‍යාපෘති ද ඇතුළුව අමාත්‍යාංශයේ ගිණුම් හා ගෙවීම් කටයුතු සම්බන්ධව මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ගිණුම් හා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත අවශ්‍ය තොරතුරු සම්පාදනය කිරීම,අමාත්‍යාංශයේ අයවැය ඇස්තමේන්තු අත්තිකාරම් "බී" ගිණුම ඇස්තමේන්තු හා පරිපූරක ඇස්තමේන්තු කාලීනව සකස් කර ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම,අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු ව්‍යාපෘති හා ව්‍යවස්ථාපිත ආයතනවල වාර්ෂික අයවැය හා පරිපූරක ඇස්තමේන්තු සකස් කිරීම් සම්බන්ධීකරණය,අමාත්‍යාංශය ඇතුළු ඒ යටතේ ඇති සියලුම ආයතනවල නිල බැංකු ගිණුම් විවෘත කිරීම,මෙහෙයවීම, වසා දැමීම සම්බන්ධ කටයුතු,අනුමත ඇස්තමේන්තු පදනම් කර ගෙන ක්‍රියාකාරී ප්‍රාග්ධන සැලැස්ම සැකසීම හා අක්මුදල් පුරෝකතන ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීම හා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම, සමස්ථ අයවැය ප්‍රතිපාදන කළමනාකරණය කිරීම හා විවිධ ව්‍යාපෘති ඇතුළු අනෙකුත් ආයතන වෙත සැලසුම්ගතව අක්මුදල් නිදහස් කිරීම,විදේශාධාර ව්‍යාපෘති සම්බන්ධයෙන් මූල්‍ය පාලනය,වාර්ෂික විසර්ජන ගිණුම,අත්තිකාරම් ගිණුම,තැන්පත් ගිණුම් හා ව්‍යාපෘතිවල අවසන් ගිණුම් ඉදිරිපත් කිරීම,අමාත්‍යාංශයට අදාළව විගණකාධිපති විසින් යොමු කරන විගණන විමසුම් සඳහා පිළිතුරු යැවීම,වාර්ෂික ගබඩා සමීක්ෂණ කටයුතු සිදු කිරීම.

## විසර්ජන ගිණුම 2017

ශීර්ෂය 120- කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ 2017 වර්ෂය සඳහාවූ 2017.12.13 දිනැති අංක 259/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ සඳහන් ඩීජීඑස්ජ් 1 ආකෘතියේ සිට 10 ආකෘතියද, සටහන (i) සිට සටහන (iv) (අ) හා (ආ) දක්වා වූ තොරතුරු සාරාංශයකින් සමන්විතව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්ට,2016 අංක 24 දරන හා 2016 අංක 23 දරන විසර්ජන (සංශෝධිත) පනත්වලින්සංශෝධිත 2014 අංක 47 දරන විසර්ජන පනත හා වෙනත්ව්‍යවස්ථාපිත විධිවිධානයන්ට,2017 වාර්ෂික අයවැය ඇස්තමේන්තුවට,ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ විධිවිධාන ඇතුලත් රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසි වලට අනුකූලව විසර්ජන ගිණුම සකස්කර නියමිත දිනට ඉදිරිපත් කර ඇත.

### 2017 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය

| වැඩ සටහන් අංකය | වැඩ සටහනේ නම | අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම් | පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම් | මු.රෙ.66 සහ 69 අනුව මාරු කිරීම් | ශුද්ධ වෙන් කිරීම් | මුළු වියදම |
|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. |
| | පුනරාවර්තන | | | | | |
| 1 | මෙහෙයුම් ක්‍රියාකාරකම් | 589,566,000 | 6,320,000 | -1950,000 | 539,936,000 | 487,150,031 |
| 2 | සංවර්ධන ක්‍රියාකාරකම් | 524,616,000 | 5,827,760,000 | 1950,000 | 6,354,326,000 | 6,188,033,062 |
| | උප එකතුව (පුනරාවර්තන) | 1,114,182,000 | 5,834,080,000 | 0 | 6,948,262,000 | 6,675,183,093 |
| | මූලධන | | | | | |
| 1 | මෙහෙයුම් ක්‍රියාකාරකම් | 63,600,000 | 63,881,000 | | 127,481,000 | 114,377,605 |
| 2 | සංවර්ධන ක්‍රියාකාරකම් | 1,212,760,000 | 5,310,000 | | 1,218,070,000 | 847,527,339 |
| | උප එකතුව (මූලධන) | 1,276,360,000 | 69,191,000 | 0 | 1,345,551,000 | 961,904,944 |
| | මුළු එකතුව | 2,390,542,000 | 5,903,271,000 | 0 | 8,293,813,000 | 7,637,088,037 |

### වියදම් මූල්‍යකරණය

| | | වැඩ සටහන 1 | | මුළු එකතුව | | |
|---|---|---|---|---|---|---|
| සංකේතය | සංකේත විස්තරය | ශුද්ධ ප්‍රතිපාදනය | සත්‍ය වියදම | ශුද්ධ ප්‍රතිපාදනය | සත්‍ය වියදම | වියදමේ ප්‍රතිශතය |
| | | රු. | රු. | රු. | රු. | % |
| 11 | දේශීය අරමුදල් | 721,417,000 | 601,527,636 | 721,417,000 | 601,527,636 | 83 |
| | එකතුව | 721,417,000 | 601,527,636 | 721,417,000 | 601,527,636 | 83 |

| | | වැඩ සටහන1හා 2 | | මුළු එකතුව | | |
|---|---|---|---|---|---|---|
| සංකේතය | සංකේත විස්තරය | ශුද්ධ ප්‍රතිපාදනය | සත්‍ය වියදම | ශුද්ධ ප්‍රතිපාදනය | සත්‍ය වියදම | වියදමේ ප්‍රතිශතය |
| | | රු. | රු. | රු. | රු. | % |
| 11 | දේශීය අරමුදල් | 6,641,276,000 | 6,423,643,503 | 6,641,276,000 | 6,423,643,503 | 98 |
| 12 | විදේශ ණය | 750,000,000 | 522,862,987 | 750,000,000 | 522,862,987 | 70 |
| 13 | විදේශ ආධාර-ප්‍රදාන | 179,120,000 | 89,053,911 | 179,120,000 | 89,053,911 | 50 |
| | එකතුව | 7,572,396,000 | 7,035,560,401 | 7,572,396,000 | 7,035,560,401 | |

රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බි "ගිණුම

| විස්තරය | උපරිම වියදම් සීමාව රු. | අවම ලැබීම් සීමාව රු. | උපරිම හර ශේෂ සීමාව රු. |
|---|---|---|---|
| විසර්ජන පනත මඟින් බලය දෙනු ලැබූ සීමාවන් | 32,000,000.00 | 19,000,000.00 | 90,000,000.00 |

# 09.අභ්‍යන්තර විගණන අංශය

## ප්‍රධාන කාර්යභාරය

- අමාත්‍යාංශය හා අමත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘතිවල මුදල් හා ආයතන කටයුතු විගණනය හා වාර්තා කිරීම.
- වැරදි හා වංචා වැළැක්වීම සඳහා අමාත්‍යාංශය තුළ ක්‍රියාත්මක වන පාලන ක්‍රමසාර්ථක , .පිළිබඳ නිරීක්ෂණ හා යෝජනා ඉදිරිපත් කිරීම දැයි සොයාබැලීම හා ඒ
- අමාත්‍යාශයේ ගිණුම් හා වෙනත් වාර්තාවල විශ්වාසනීයත්වය විනිශ්චය කිරීම හා අමාත්‍යාංශයේ වත්කම් සියලුම ආකාරයේ අලාභහානි වලින් උපරිම වශයෙන් ආරක්ෂා කර ඇත්දැයි යන්න සොයා බැලීම හා වාර්තා කිරීම.
- අමාත්‍යාංශය යටතේ ඇති අංශවල පහත සඳහන් කටයුතු සම්බන්ධව ප්‍රගති සමාලෝචනය කිරීම සඳහා මාස තුනකට වරක් විගණන හා කළමනාකරණ ක (03)මිටු රැස්වීම් පැවැත්වීම

    - වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ ප්‍රගති සමාලෝචනය කිරීම හා දුර්වල කාර්ය සාධනයන් මගහරවා ගැනීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ඉදිරිපත් කිරීම.
    - විගණකාධිපති විසින් නිකුත් කරන විගණන විමසුම්විගණන වාර්තා / .සඳහා පිළිතුරු සැපයීම
    - වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම
    - වාර්ෂික වාර්තාකාර්ය සාධන වාර්තා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් / .කිරීම
    - වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම පිළිබඳ විගණනය

2017 වර්ෂයට අදාළව කළමනාකරණ හා විගණන කමිටු,පළමුවන කාර්තුවට 2017.04.25 දින ද, දෙවන කාර්තුවට 2017.08.08 දිනද, තුන්වන කාර්තුවට 2017.10.24 දිනද, සිව්වන කාර්තුවට 2018.01.26 දිනද පවත්වා ඇත.

| අනු අංකය | දිනය | විගණන විමසුම් අංකය | විගණන විමසුම |
|---|---|---|---|
| 1. | 2017.01.11 | CDWA/09/H-01/2016 | අභ්‍යන්තර විගණන පරීක්ෂාව - බැංකු සැසඳුම් ප්‍රකාශ ( 00007040514 - 2016 නොවැම්බර් ) |
| 2. | 2017.01.21 | WA/09/T-26/2017 | SAIVAC සම්බන්ධ බාහිර විගණන වාර්තාව |
| 3. | 2017.01.26 | MWCA/09/H-18/2017 | ප්‍රසම්පාදන සැළැස්ම - 2017 |
| 4. | 2017.01.26 | WCA/09/N-23/2016 | ගෙවීම් වවුචර් පරීක්ෂාව - 2016 ජූනි ( පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව ) |
| 5. | 2017.02.03 | WCA/09/N-23/2016 | ගෙවීම් වවුචර් පරීක්ෂාව - 2016 අගෝස්තු ( පරිවාස දෙපාර්තමේන්තුව ) |

| | | | |
|---|---|---|---|
| 6. | 2017.02.13 | WCA/09/N-23/2016 | ගෙවීම් වවුචර් පරීක්ෂාව - 2016ජූලි ( පරිවාස දෙපාර්තමේන්තුව ) |
| | 2017.02.17 | WA/09/0-4/2015 | ගෙවීම් වවුචර් පරීක්ෂාව - 2016 අප්‍රේල් ( අමාත්‍යාශය ) |
| 7. | 2017.02.17 | WA/09/0-4/2015 | ගෙවීම් වවුචර් පරීක්ෂාව - 2016 මැයි (අමාත්‍යාශය ) |
| | 2017.02.27 | WA/09/T-26/2017 | අවදානම් දරුවන් වෙනුවෙන් ආරක්ෂණ සැළසුම් සකස් කිරීම හා ඒ පිළිබඳව පුහුණු වැඩ පැවැත්වීම - 2016 |
| 8. | 2017.03.07 | MWCA/09/H-19/2017 | UNDP ව්‍යාපෘතිය |
| 9. | 2017.04.19 | WA/09/T-16/2015 | ළමා ලේකම් කාර්යාලය සඳහා වෙබ් පිටුවක් නිර්මාණය කිරීම පිළිබඳ පසුවිපරම් පරීක්ෂාව |
| 10. | 2017.04.20 | MWCA/09/H-21/2017 | වවුචර්පත් පරීක්ෂාව - 2016 පෙබරවාරි - මාර්තු |
| 11. | 2017.04.20 | MWCA/09/H-21/2017 | වවුචර්පත් පරීක්ෂාව - 2016 අප්‍රේල් - ජූලි |
| 12. | 2017.04.24 | MWCA/09/H-01/2017 | අභ්‍යන්තර විගණන පරීක්ෂාව - බැංකු සැසඳුම් ප්‍රකාශ ( 00007040514 - 2017 මාර්තු ) |
| 13. | 2017.05.22 | WCA/09/N-23/2016 | ගෙවීම් වවුචර් පරීක්ෂාව - 2016 ( පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව ) |
| 14. | 2017.06.07 | MWCA/09/T-28/2017 | Maintaining safe homes for Humen Trafficking and Violence 2017 |
| 15. | 2017.07.11 | MWCA/09/H-21/2017 | 2016 වර්ෂයේ ප්‍රතිපාදන ඉතිරි වීම |
| 16. | 2017.08.02 | MWCA/09/T-28/2017 | ජාත්‍යන්තර කාන්තා දින ජාතික උත්සවය පිලිබඳ සිදුකළ විගණනය |
| 17. | 2017.08.03 | WA/09/0-5/2016 | ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පිළිබඳ සිදුකළ විගණනය |
| 18. | 2017.08.21 | | අභ්‍යන්තර විගණන පරීක්ෂාව - බැංකු සැසඳුම් ප්‍රකාශ ( 174-1-001-3-9026267 - 2017 ජූනි ) |
| 19. | 2017.09.27 | WA/09/N-03/2015 | ආදර්ශ ගම්මාන පිහිටුවීම |

| | | | |
|---|---|---|---|
| 20. | 2017.09.28 | WA/09/0-4/2015 | ගෙවීම් වවුචර් පරීක්ෂාව - 2017 ජනවාරි/ පෙබරවාරි ( අමාත්‍යාශය ) |
| 21. | 2017.10.09 | | සාධනීය මිතුරු ගමක් ව්‍යාපෘතිය - 2017 |

# 10.සැලසුම් අංශය

## මෙහෙවර

ළමුන් හා කාන්තාවන් සවිබල ගැන්වීමට හා පූර්ණ සංවර්ධනයකට යොමු කිරීම සඳහා අමාත්‍යාංශය මඟින් සපයන සේවා වඩාත් ඵලදායී හා කාර්යක්ෂමව සිදු කිරීමට අවශ්‍ය සැලසුම් මෙහෙයුම් හා ව්‍යාපෘති කළමනාකරණ අවශ්‍යතාවයන් ශක්තිමත්ව සපුරාලීම සැලසුම් අංශයේ මෙහෙවර වේ.

## කාර්යභාරය

1) ළමා හා කාන්තා ක්ෂේත්‍රයට අදාල ජාතික සැලසුම් සම්පාදනය කිරීම හා අවශ්‍ය දායකත්වය ලබා දීම.
2) අමාත්‍යාංශයේ සියළු අංශ/ දෙපාර්තමේන්තුවල තොරතුරු ඒකාබද්ධ කර වාර්ෂික ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම.

# ක්‍රියාත්මක කළ ප්‍රධාන වැඩසටහන් - 2017

## 1. සැලසුම්කරණය

- 2017 වර්ෂයේ කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම හා අදාල පාර්ශව ආයතනයන් වෙත බෙදාහැරීම.

- අමාත්‍යාංශයේ එක් එක් අංශ මඟින් දිස්ත්‍රික් මට්ටමින් 2017 වර්ෂයේදී ක්‍රියාවට නංවන සියළු සංවර්ධන වැඩසටහන් ඇතුළත් කළ ඒකාබද්ධ දිස්ත්‍රික් සංවර්ධන සැලසුම් 25 ක් සකස් කිරීම හා ජාතික මට්ටමේ සිටින දිස්ත්‍රික් සම්බන්ධීකරණ මාණ්ඩලික නිලධාරීන් හා සියළු දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත ලබා දීම.

- සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන් සඳහා ළමා හා කාන්තා සංවර්ධන ඒකාබද්ධ සැලසුම් 331ක් සකස් කිරීම සඳහා ප්‍රාදේශීය මට්ටමේ ළමා හා කාන්තා සංවර්ධන ඒකකවල ක්ෂේත්‍ර නිලධාරීන්ට අවශ්‍ය මූලික මඟපෙන්වීම් ලබා දීම හා සකස් කල ප්‍රාදේශීය සැලසුම් අමාත්‍යාංශයට ගෙන්වා අවශ්‍ය සංශෝධන හා වැඩිදියුණු කිරීම් සිදු කිරීම හා ක්‍රියාත්මක වෙමින් පවතින වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම.

- අමාත්‍යාංශය මඟින් වැන්දඹු හා ගෘහමූලික කාන්තාවන් සඳහා තුන් අවුරුදු ජාතික ක්‍රියාකාරී සැලැස්මක් කෙටුම්පත් කළ අතර, ඒ සඳහා සැලසුම් අංශයේ දායකත්වය ලබා දෙන ලදී.

## 2. ප්‍රගති වාර්තාකරණය

කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය වෙත වෙන් කරනු ලබන වාර්ෂික ප්‍රතිපාදනයන්ගේ ප්‍රශස්ථ ප්‍රගතිය ලඟා කර ගැනීම තහවුරු කිරීම සඳහා සැලසුම් අංශය මඟින් ප්‍රගති සමාලෝචන සාකච්ඡාවන් හා ප්‍රගති වාර්තාකරණයන් සිදු කරණු ඇත.

# 2017 වර්ෂයේදී,

1) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව අංශ / දෙපාර්තමේන්තු මට්ටමින් මාසික හා කාර්තු ප්‍රගති වාර්තාකරණය

2) ජාතික මට්ටමින් ත්‍රෛමාසික ප්‍රගති සමාලෝචන රැස්වීම් 02 ක් පැවැත්වීම හා අතර මැද විශේෂ ප්‍රගති සමාලෝචන රැස්වීම් 03 ක් පැවැත්වීම.

3) ආර්ථික කළමනාකරණ පිළිබඳ අමාත්‍ය මණ්ඩල කමිටුවේ තීරණයන්ට අදාලව කාර්තු ප්‍රගති වාර්තාකරණය.

4) ළමා අපයෝජන වැලැක්වීම සඳහා වන තුන් අවුරුදු උපාය මාර්ගික සැලැස්මට අනුව වාර්ෂිකව ප්‍රගති වාර්තාකරණය.

5) දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචන රැස්වීම් සම්බන්ධීකරණය හා සාරාංශ ප්‍රගති වාර්තාකරණය - දිස්ත්‍රික් මට්ටමේ ළමා හා කාන්තා සංවර්ධන වැඩසටහන්හි ප්‍රගතිය අමාත්‍යාංශයේ මාණ්ඩලික නිලධාරීන්ගේ සහභාගීත්වය ඇතිව දිස්ත්‍රික් 25 තුළම වසරකට දෙවරක් පැවැත්වීම මඟින් ප්‍රාදේශීය මට්ටමේදී අමාත්‍යාංශ ප්‍රතිපාදනයන්හි උපරිම ප්‍රතිඵල අත්කර ගැනීම තහවුරු කර ඇත.

## 3. සංවර්ධන වැඩසටහන් ඇගයීම හා මෙහෙයුම්කරණය

2017 වර්ෂයේ දී අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත සිදු කළ ව්‍යාපෘතීන් කිහිපයක වර්තමාන තත්ත්වය / එම ව්‍යාපෘතීන්හි යෝග්‍යතාව විමර්ෂණය කිරීම සඳහා විටින් විට ක්ෂේත්‍ර ඇගයීම් වැඩසටහන් කිහිපයක් සැලසුම් අංශය මඟින් පවත්වා වාර්තා ලබා දී ඇත.

මෙසේ ජාතික මට්ටමින් වැඩසටහන්වල ඇගයීම් සිදු කිරීමෙන් ලබා දෙන නිර්දේශ හා නිගමනයන් ඉදිරි වැඩසටහන් තවදුරටත් සාර්ථක කර ගැනීමට පිටුවහලක් වනු ඇත.

1) දිවා සුරැකුම්/ පෙර පාසැල් පරිශ්‍රය නිරීක්ෂණය - කොලොන්නාව සාලමුල්ල "ලක්සඳ සෙවන" නිවාස සංකීර්ණය.
2) මඩකලපුව දිස්ත්‍රික්කයේ කළුවාංචිකුඩි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඉදිකිරීමට අපේක්ෂිත දිවා සුරැකුම් මධ්‍යස්ථානය.
3) පුත්තලම දිස්ත්‍රික්කයේ මුන්දලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඉද්දමල් වගා ව්‍යාපෘතිය.

## 4. පුහුණු හා දැනුවත්කිරීමේ වැඩසටහන්

පොදු විෂය ක්ෂේත්‍රයන් පිළිබඳ/කාලීන මාතෘකා යටතේ ක්ෂේත්‍ර නිලධාරීන් දැනුවත් කිරීම සඳහා සැලසුම් අංශය පහත වැඩසටහන් 2017 වර්ෂයේ ඉටුකර ඇත.
ඒ යටතේ,

- මත්ද්‍රව්‍ය උවදුරින් ළමා හා කාන්තා පරපුර මුදවා ගැනීම සඳහා "ආලෝකය" නමින් මෙම අමාත්‍යාංශය දියත් කරන වැඩසටහන හා සමගාමීව අදාල පාර්ශව ආයතන හා ඒකාබද්ධව සාකච්ඡා වට කිහිපයක් ජාතික මට්ටමින් පවත්වා මත්ද්‍රව්‍ය නිවාරණ ජාතික වැඩසටහන යටතේ විවිධ ආයතන මඟින් මත්ද්‍රව්‍ය නිවාරණයට ගෙන ඇති ක්‍රියාමාර්ග හා ප්‍රතිපත්ති පිළිබඳ සමාලෝචනයක් සිදු කරන ලදී.

එමෙන්ම වැඩිහිටියන් මත්ද්‍රව්‍ය භාවිතයට පෙළඹීම අවම කිරීම, සිවිල් සංවිධාන හා ප්‍රජාවගේ ඒ පිළිබඳ අවබෝධය, කැපවීම හා ක්‍රියාකාරී දායකත්වය ප්‍රවර්ධනය කිරීම මෙන්ම රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන හා ඒකාබද්ධ ප්‍රවේශයකින් මත්ද්‍රව්‍ය නිවාරණය සඳහා ක්‍රියාත්මක වීම තහවුරු කිරීම උදෙසා දිස්ත්‍රික් මට්ටමින්ද ක්ෂේත්‍ර නිලධාරීන් ඇතුළු පාර්ශව ආයතන නිලධාරීන් දැනුවත් කිරීමේ හා පුහුණු කරුවන් පුහුණු කිරීමේ එක් දින වැඩමුළු 03 ක් ගම්පහ, කුරුණෑගල හා කළුතර යන දිස්ත්‍රික්කවල පවත්වන ලදී.

තවද ජාඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ හා නියාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කාන්තා කාර්ය සාමාජිකාවන් ඉලක්ක කර ගත් දැනුවත් කිරීමේ වැඩසටහන් 02 ක් ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක කරන ලදී. දිවයින පුරා අවදානම් කණ්ඩායම් බහුල දිස්ත්‍රික්වල මෙම වැඩසටහන ඉදිරියේදී ව්‍යාප්ත කිරීමට අපේක්ෂිතයි.

- එමෙන්ම ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ එක් දින පුහුණු වැඩමුළුවක් තෝරා ගත් දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරීන් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ළමා හා කාන්තා ක්ෂේත්‍රයේ නිලධාරීන් සඳහා නොවැම්බර් මස කොළඹදී පැවැත්වීමට කටයුතු යොදා ඇත. මෙම වැඩසටහනේ අරමුණ වන්නේ කාන්තා හා ළමා ක්ෂේත්‍රයේ ප්‍රමුඛ අවශ්‍යතාවයන් හා ගැටළු සඳහා ඵලදායී විසඳුම් ලබා දීමට සුදුසු ව්‍යාපෘති හඳුනා ගැනීම, සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පසු විපරම් කිරීමට අවශ්‍ය දැනුම හා අත්දැකීම් ලබා දීමයි.

# 11.සංවර්ධන අංශය

## කාර්යභාරය

**අමාත්‍යාංශයේ සංවර්ධන අංශයේ ප්‍රධාන කාර්යයභාරය වන්නේ කාන්තාවන්ගේ හා දරුවන්ගේ අයිතිවාසිකම් හා සංවර්ධනය තහවුරු කෙරෙන ඔවුනට හිංසනයෙන් තොරව ජීවත්වීමේ පරිසරයකින් යුතු සංවේදී සමාජයක් බිහි කිරීම උදෙසා අමාත්‍යාංශය යටතේ ඇති සියළු ආයතන හා අංශ මඟින් ක්‍රියාත්මක කරන සංවර්ධන වැඩසටහන් සම්බන්ධීකරණය, ළමා හා කාන්තා සංවර්ධනයට අදාල ජාතික මට්ටමේ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, පසුවිපරම් කිරීම හා ඇගයීම සිදු කිරීමයි.**

# ක්‍රියාත්මක කළ ප්‍රධාන සංවර්ධන වැඩසටහන් 2017

## 01. පාරිසරික සංචාරක කර්මාන්ත ක්ෂේත්‍රය සඳහා කාන්තාවන් දිරිගැන්වීම සහ ඔවුන් සවිබල ගැන්වීම

පරිසර හිතකාමී සංචාරක ව්‍යාපාරය සමඟ සම්බන්ධ වෙමින් දේශීය අමුද්‍රව්‍ය යොදා නිෂ්පාදනය කරන නිමැවුම් විශේෂයෙන්ම දේශීය ඖෂධ, කාබනික පොහොර යොදා ගෙන කරනු ලබන බෝග නිෂ්පාදනය හා අහිතකර රසකාරක නොමැතිව ආහාරපාන සකස් කිරීම මෙමඟින් දිරිගැන්වේ.

මේ තුළින් ඉතා අඩු ආදායම් මට්ටමක ජීවත්වන ව්‍යවසායක කාන්තාවන්ගේ නිෂ්පාදනයන් ප්‍රචලිත කිරීමත්, එම නිෂ්පාදන සඳහා විධිමත් වෙළඳපොලක් ඇති කිරීමත්, ශ්‍රම සූරාකෑම, කාන්තා හිංසනය වැනි සංචාරක කර්මාන්තය හා සම්බන්ධව පැන නගින ගැටළු වලක්වා ගැනීමත් අපේක්ෂා කෙරේ.

කාන්තාවන්ගේ නිෂ්පාදන පහසුවෙන් අලෙවි කිරීම සඳහා කතරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පූජා භූමිය කේන්ද්‍ර කරගනිමින්ද මහව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේද පුත්තලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේද මෙවැනි අලෙවි මධ්‍යස්ථාන 03ක් ඉදිකිරීමට කටයුතු කර ඇත.



ස්වයංරැකියා උපකරණ

## 02. මාධ්‍ය වැඩසටහන

සමාජයේ ප්‍රගමනයට මෙන්ම එහි පසුබෑමටද විශාල බලපෑමක් විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය, විශේෂයෙන්ම සමාජ ජාලා හා වෙබ් අඩවි තුළින් වර්තමානයේ සිදු කරනු ලබයි. **"කාන්තාව"** මේ සියලු මාධ්‍ය තුළින් නිරූපණය කෙරෙන කේන්ද්‍ර චරිතයක් බවට පත්වී ඇත. ඒ අනුව කාන්තාවන්ගේ සවිබල ගැන්වීම සහ ඇයගේ සුරැකීම උදෙසා අමාත්‍යාංශය විසින් දියත් කරනු ලබන වැඩසටහන්/ ව්‍යාපෘති/ ක්‍රියාකාරකම් පිළිබඳව සමාජය සංවේදී කිරීමත් දැනුවත් කිරීමත් සඳහා මෙම මාධ්‍යයන්හි දායකත්වය ලබා ගැනීම සිදු කරනු ලබයි.

1982 පැරිසියේදී පැවති "කාන්තාව සහ ජනමාධ්‍ය සමුළුව" හා 1995 බීජිංහි පැවති "සිව්වන ජගත් කාන්තා සම්මේලනය" විසින් සැකසූ ක්‍රියාකාරී සැලැස්මෙහි සඳහන් ප්‍රධාන ක්‍රියාකාරකමක් වන්නේ "කාන්තාවන්ගේ අභිවෘද්ධිය සඳහා මාධ්‍ය කාර්යභාරයයි." මෙය සාක්ෂාත් කර ගැනීමේ අරමුණින් පහත සඳහන් කාර්යයන් සිදු කරන ලදී.

- කාන්තාවන් හා දරුවන් උදෙසා ජාත්‍යන්තර වශයෙන් වෙන්ව ඇති දිනයන්හීදී ඒ පිළිබඳව සමාජය සංවේදී කිරීම සඳහා විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය තුළින් ප්‍රවෘත්ති, සම්මුඛ සාකච්ඡා, පුවත්පත් අතිරේකයන් ආදීය තුළින් ප්‍රචාරණ කටයුතු සිදු කිරීම

- අඩුවයස් දරුවන් ගැබ් ගැනීම පිළිබඳව " පැදි දිය " නමින් ටෙලි නාට්‍යයක් නිර්මාණය කිරීම

- අමාත්‍යාංශයේ කාර්යයභාරය හා ක්‍රියාකාරකම් පිළිබඳව කෙටි වාර්තාමය චිත්‍රපටයක් නිර්මාණය කිරීම

- ITN, FM ගුවන් විදුලියේ සෑම සති අන්තයේදීම උදෑසන 6 -7 වූ කාලය තුළ දරුවන්ගේ රැකවරණය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් කිරීම.

- අඩු පහසුකම් සහිතව වුවද කාර්යක්ෂම සේවයක් සිදු කරන අමාත්‍යාංශයේ මාධ්‍ය ඒකකයට නවීන පහසුකම් ලබාදී ශක්තිමත් කිරීම.
- සෙනෙහස නමින් පුවත්පතක් අමාත්‍යාංශය මඟින් ප්‍රකාශයට පත්කර බෙදාහැරීම.

## 03. තොරතුරු තාක්ෂණ ඒකකය

කාන්තාව ආර්ථික හා සාමාජයීය වශයෙන් සවිබල ගන්වමින් ඔවුන් සංවර්ධනයට දායක කර ගැනීමේදී සහ ඔවුන්ට ඇති අභියෝග ජයගැනීම සඳහාත් කාන්තාව සම්බන්ධ වූ නිවැරදි දත්ත තිබීම තුළින් එම කාර්යයන් වඩාත් විශ්වාසනීයත්වයෙන් යුතුව සිදු කිරීමට පහසු වේ. එම අරමුණින් අමාත්‍යාංශය තුළ මෙම ඒකකය ක්‍රියාත්මක වේ. එහිදී පහත සඳහන් ක්‍රියාකාරකම් සිදු කරනු ලබයි.

3.1දිවයිනේ සියලුම දිස්ත්‍රික්ක හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි පිහිටි ළමා හා කාන්තා සංවර්ධන ඒකක අමාත්‍යාංශයේ තොරතුරු තාක්ෂණ ඒකකය සමඟ ජාලගත කිරීම

3.2මේවායේ සිටින ක්ෂේත්‍ර නිලධාරීන් මෙම කාර්යය සඳහා අනුයුක්ත කිරීම හා ඔවුනට අවශ්‍ය තාක්ෂණික මෙවලම් )Dongle, Pendrive) සැපයීම

3.3අමාත්‍යාංශයීය අවශ්‍යතාවයන් අනුව දත්ත පද්ධති හා මෘදුකාංග පද්ධති නිර්මාණය



- E-women සංකල්පය යටතේ ජාතික වශයෙන් වැදගත් වන වැන්දඹු හා ගෘහමූලික කාන්තා දත්ත පද්ධතිය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කර ගත් හිංසනය පිළිබඳ දත්ත පද්ධති නිර්මාණය.
- අමාත්‍යාංශයේ විවිධ අංශවල අවශ්‍යතා අනුව දත්ත පද්ධති නිර්මාණය
- සුහුරු ලිය වැඩසටහන අදාල මෘදුකාංගය ක්‍රියාත්මක කිරීම
- අමාත්‍යාංශයේ වෙබ් පිටුව යාවත්කාලීන කර පවත්වාගෙන යාම

3.4 තොරතුරු තාක්ෂණය පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම.

- අමාත්‍යාංශය හා ඊට සම්බන්ධ සියළුම ආයතනවල නිලධාරීන්ගේ තොරතුරු තාක්ෂණ සාක්ෂරතාවය ඉහළ නැංවීම සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම.

3.5 අමාත්‍යාංශය හා ක්ෂේත්‍ර නිලධාරීන් අතර සන්නිවේදනය පහසු කිරීම.

- අමාත්‍යාංශය, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල ජාලගත කිරීමේ අරමුණින් ජාලගත පද්ධතියක් (APN Solution) ස්ථාපිත කිරීම.
- මේ යටතේ සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල පිහිටුවා ඇති ළමා හා කාන්තා සංවර්ධන ඒකකවලට ඩොංගල් ලබා දීම.
- අමාත්‍යාංශය, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල අතර අභ්‍යන්තර ඊමේල් පද්ධතියක් ස්ථාපිත කිරීම.

3.6 අමාත්‍යාංශයේ තොරතුරු තාක්ෂණ සම්පත් කාර්යක්ෂමව ප්‍රයෝජනයට ගැනීම



- මධ්‍යම ප්‍රතිවෛරස් මෘදුකාංග පද්ධතියක් (Central Virus Guard System) ස්ථාපිත කිරීම.
- මෘදුකාංග, දෘඩාංග හා ජාල පද්ධති නඩත්තුව.

3.7 අමාත්‍යාංශ නිල වෙබ් අඩවිය පවත්වාගෙන යාම.

3.8 නිර්මාණාත්මක දායකත්වය

- ජාත්‍යන්තර කාන්තා දිනය වෙනුවෙන් 'සුව සවි ලිය' ශරීර සුවතා ජංගම දුරකථන යෙදුම හා වාර්තාමය වැඩසටහන නිෂ්පාදනය
- ICTA and Dialog ආයතන සමඟ එකතු වී 'සුහුරු ලිය' හා 'සුහුරු කථා' වැඩසටහන් පැවැත්වීමට අවශ්‍ය වැඩ කටයුතු සිදු කිරීම
- ජාතික උත්සව අවස්ථාවන්හිදී කාන්තාව හා දරුවන්ගේ අභිමානය ඔප්නැංවෙන සේ ආරාධනා පත්‍ර/ දැන්වීම්/ මුල්දින කවර/ මුද්දර ආකෘතීන්/ අත්පත්‍රිකා නිර්මාණය

## 04. ළමා හා කාන්තා සංවර්ධන ඒකක පිහිටුවීම

දිවයිනේ සියළුම දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල තුළ අප අමාත්‍යාංශයේ සේවාවන් සපයනු ලබන්නේ වනිතා සංවර්ධන නිලධාරි/ උපදේශන නිලධාරි/ උපදේශන සහකාර නිලධාරි/

ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරි/ මුල් ළමාවිය සංවර්ධන සහකාර/ ළමාරක්ෂක හා මනෝ සමාජයීය නිලධාරි හා සහන සොයුරිය යන නිලධාරින් විසිනි. එම නිලධාරින් එක් ඒකකයක් ලෙස ස්ථානගතව සිටීමෙන් කාන්තාවන්ට හා දරුවන්ට සිදුවන අපයෝජනයන් හා හිංසන අවම කිරීමටත් ඔවුන් මුහුණ දෙන අභියෝග/ ගැටළු ආදී අවස්ථාවන්හීදී රාජ්‍ය යාන්ත්‍රණයෙන් ලැබිය යුතු ආරක්ෂාව, රැකවරණය හා මඟ පෙන්වීම ආදී සේවාවන් එකම ස්ථානයකින් සැපයීම මෙන්ම එම සේවාලාභීන් පිළිබඳව නිරන්තර අවධානය යොමු කිරීම ද පහසුවේ. මෙම ඒකකය තුළ තොරතුරු ඒකරාශී කිරීමේ මධ්‍යස්ථානයක් හා උපදේශන මධ්‍යස්ථානයක්ද ක්‍රියාත්මක වේ.

එසේම කාන්තාවන් හා ළමුන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් දිවයිනේ සෑම පොලිස් ස්ථානයකම පිහිටුවා ඇති පොලිස් ළමා හා කාන්තා කාර්යාංශයන් සමඟ මෙන්ම රජයේ මූලික රෝහල්වල පිහිටි “මිතුරු පියස” යන සේවා පියස සමඟද අනෙකුත් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන සමඟද ඒකාබද්ධව කටයුතු කරනු ලබයි. මේ වසරේදී ඒකක 7ක් ඉදිකිරීමටද ඒකක 26ක් සඳහා කාර්යාලීය උපකරණ ලබා දීමටද කටයුතු සලසා ඇත.




බියගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඒකකය




හොරොව්පතාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඒකකය

## 05. ස්ත්‍රී පුරුෂ සමාජභාවීය මූලප්‍රවාහකරණය හා කාන්තා අයිතිවාසිකම් පිළිබඳ වැඩසටහන

### 5.1 ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමසාධාරණත්වය උදෙසා සමාජය සංවේදී කිරීම හා අමාත්‍යාංශ මට්ටමින් ස්ත්‍රී පුරුෂ සමාජභාවීය මූලප්‍රවාහකරණ වැඩසටහන් ස්ථාපනය කිරීම

ස්ත්‍රී පුරුෂ සමාජභාවය හේතුවෙන් කාන්තාවන්ට සිදුවන හිංසන ක්‍රියාවන් හා පීඩාවන්ගෙන් ඇයව මුදවාලීමත්, ඇය කෙරෙහි ඇති විවිධ දුර්මතයන් හා නොසලකා හැරීම් පිළිබඳව සමාජය සංවේදී කිරීමත් ඒ සඳහා පෙළගැසී කටයුතු කරන කණ්ඩායම් උද්දේශනය කිරීමේ අරමුණින් මෙම වැඩසටහන ක්‍රියාත්මක වේ.

දැනුවත් කිරීමේ වැඩසටහන්, දේශන හා වැඩමුළු සහ සංගීතමය වැඩසටහන් තුළින් වැඩසටහනේ අරමුණ සමාජගත කිරීම සිදු කරනු ලබයි. මේ වසර තුළ වැඩසටහන් 23 ක් මේ වන විට පවත්වා ඇති අතර තවත් වැඩසටහන් 15ක් ඉදිරියේ දී පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත.



ප්‍රජාව දැනුවත් කිරීම

ස්ත්‍රී පුරුෂ සමාජභාවීය මූලප්‍රවාහකරණයේදී ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයටම සමානාත්මතාවයකින් හා සම සාධාරණත්වයෙන් යුතුව කටයුතු කිරීමටත්, තිරසාර සංවර්ධන අරමුණු කරා ළඟාවීමටත් , රාජ්‍ය ආයතන තුළ කාන්තාවන්ට සිදු වන හිංසනයන් අවම කිරීමත් යන අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා අංක 16/2523/740/013 හා 2016.12.06 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා පහත සඳහන් ක්‍රියාකාරම් ඉටු කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගන්නා ලදී.

i. කාන්තාවන්ට හා ගැහැනු දරුවන්ට සිදුවන වෙනස්කොට සැලකීම් පිටු දැකීම සඳහා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් වන ප්‍රතිපත්ති හා භාවිතයන් ප්‍රවර්ධනය කිරීම.

ii. කාන්තාවන්ට හා පුරුෂයින්ට සමානාත්මතාවයකින් කටයුතු කිරීමට හැකිවන පරිදි ව්‍යාපෘති හා වැඩසටහන් නිර්මාණය කිරීම හා පවත්වා ගෙන යාම.

iii. ස්ත්‍රී පුරුෂ සමාජභාවීය තුලනයන් පවත්වා ගැනීම හා ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අයවැයකරණය ක්‍රියාත්මක කිරීම.

iv. ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනයන් සිදුවීම අවම කිරීම සඳහා වැඩසටහන් පද්ධතීන් හා ක්‍රියාමාර්ග සකස් කිරීම.

අදාල නිලධාරීන් මේ සඳහා දැනුවත් කිරීමටත්/ පුහුණු කිරීමටත් අවශ්‍ය පහත ක්‍රියාමාර්ග සියළු අමාත්‍යාංශවල සහයෝගීතාවයෙන් දියත් කිරීමට කටයුතු යොදා ඇත.

- අමාත්‍යාංශ ලේකම්වරුන් සඳහා මූලික දැනුවත්භාවය ලබා දීම.
- නිලධාරීන් පුහුණු කිරීමට විශේෂඥ උපදෙස් පරිදි පුහුණු මොඩියුලයක් සකස් කිරීම.
- අමාත්‍යාංශ මට්ටමින් මෙම ක්‍රියාදාමය පිළිබඳව නිලධාරීන් දැනුවත් කිරීම
- අත්පත්‍රිකා / පෝස්ටර් ආදිය මුද්‍රණය



ප්‍රජාව දැනුවත් දැනුවත් කිරීම



අතිරේක ලේකම්වරුන්/අධ්‍යක්ෂවරුන් සඳහා වන පුහුණු වැඩමුළුව

## 06. කාන්තාවන්ට හිතකාමී හා උපකාරී ආදර්ශ ගම්මාන වැඩසටහන

කාන්තාවන් ආර්ථික වශයෙන් සවිමත්, එකිනෙකාට ගෞරවයෙන් බැඳුණු සුන්දර ස්ථානයක් බවට පවුල පත් කිරීමත්, එවැනි පවුල් රාශියක් ඒකරාශී කර ගත් සතුට පෙරදැරි කරගත් ආරක්ෂාකාරී ගමක් නිර්මාණය කිරීමත් මෙම වැඩසටහනේ මුලික අරමුණ වේ. ගම්මාන තෝරා ගැනීමේ දී වැන්දඹු, ගෘහමූලික කාන්තාවන් වැඩි පිරිසක් සිටින/ අඩු ආදායම්ලාභී පවුල් වැඩි ප්‍රමාණයක් සිටින කාන්තා හිංසන හා ළමා අපයෝජන වැඩි වශයෙන් වාර්තා වන/ විදෙස්ගත කාන්තාවන් වැඩි ප්‍රමාණයක් සිටින/ කාන්තා කාර්ය සංවිධානයක් පිහිටුවා ඇති/ භෞතික පහසුකම් අඩු ගම්මානයන් තෝරා ගැනේ.

එසේ තෝරා ගන්නා ලද ගම්මානයන්හි පොදු ගැටළු සහ අවශ්‍යතාවයන් වෙනුවෙන් අදාල මැදිහත්වීම්, සහ ඊට අදාල පහසුකම් සැපයීමද සමාජයීය හා ආර්ථික වශයෙන් කාන්තාවන් සවිබල ගැන්වීමද සිදු කරනු ලබයි. මෙහි ක්‍රියාකාරී කණ්ඩායම ලෙස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ රාජ්‍ය, රාජ්‍ය නොවන සංවිධාන සහ සියළු වගකිව යුතු නිලධාරීන්ගෙන් සැදුම් ලත් කණ්ඩායමක් විසින් ඒකාබද්ධව මෙය ක්‍රියාත්මක කරනු ලබයි. 2017 වර්ෂයේ දී ගම්මාන කිහිපයක මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී.

මේ වන විට හඳුනාගත් මුලික ගැටළු සඳහා මැදිහත් වීමට අමාත්‍යාංශය කටයුතු කර ඇත. දිවා සුරැකුම් මධ්‍යස්ථාන හා පෙර පාසල් ඉදිකිරීම , ව්‍යවසායක කාන්තාවන් හඳුනාගැනීම හා ඔවුන් ඒ සඳහා තව දුරටත් පුහුණු කිරීම හා ආධාර ලබා දීම, පුස්තකාල පහසුකම් වැඩිදියුණු කිරීම, මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන්, දැනුවත්භාවීය වැඩසටහන් ආදිය අදාළ ගම්මානයන් තුළ ක්‍රියාත්මක කර ඇත.

ප්‍රජාව දැනුවත් කිරීම



ආර්ථික සවිබල ගැන්වීම

යටිතල පහසුකම් සැලසීම

## 07. ළමා අපයෝජන හා කාන්තා හිංසන වැළැක්වීමේ විශේෂ වැඩසටහන

2014 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන මෙම විශේෂ ව්‍යාපෘතිය සඳහා 2017 වර්ෂය සඳහා රුපියල් මිලියන 50 ක ප්‍රතිපාදන වෙන් වී ඇත. ඒ අනුව 2017 වසර තුළදී ළමා අපයෝජන හා කාන්තා හිංසන වැළැක්වීමේත්, වින්දිතයින් වෙත අවශ්‍ය සහන සැපයීම වඩාත් කාර්යක්ෂම කිරීමේ අරමුණින් පහත සඳහන් ක්‍රියාකාරකම් මේ වන විට ක්‍රියාත්මක කරමින් පවතී.

## 7.1 පොලිස් ළමා හා කාන්තා කාර්යාංශ ශක්තිමත් කිරීම.

ළමුන් හා කාන්තාවන්ට සිදුවන හිංසනයන් අවම කර ගැනීම උදෙසා පොලිස් ස්ථානයන්හි පිහිටි පොලිස් ළමා හා කාන්තා කාර්යාංශ ශක්තිමත් කිරීමේ අරමුණින් මේ වන විට නව කාර්යාංශ 28ක් ඉදිකර අවශ්‍ය කාර්යාලීය උපකරණද සහිතව කාන්තාවන්ගේ හා දරුවන්ගේ සුභ සාධනය සඳහා පොලිස් දෙපාර්තමේන්තුවට භාරදී ඇත. 2017

වර්ෂයේ කාර්යාංශයන් 06ක් ඉදිකිරීමට අවශ්‍ය මුල්‍ය ප්‍රතිපාදනයන් මේ වන විටත් අදාළ දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත මුදා හැර ඇති අතර එම ඉදිකිරීම් කාර්යයන් ආරම්භ කර ඇත.

මීට අමතරව තඹුත්තේගම සහ ගම්පහ පොලිස් ස්ථානයන්හි ඇති කාර්යාංශයන් සඳහා අවශ්‍ය කාර්යාලීය උපකරණ ලබා දීමට අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර ඇත.



කන්දකැටිය පොලිස් කාර්යාංශය විවෘත කිරීම





මාතර කොට්ඨාශ පොලිස් කාර්යාංශයේ ඉදිකිරීම් ආරම්භ කිරීම

## 7.2 කාන්තා රැකවරණ මධ්‍යස්ථාන ක්‍රියාත්මක කිරීම.

ගෘහස්ථ හිංසනය හා වෙනත් හේතූන් නිසා ප්‍රචණ්ඩත්වයට ලක් වූ කාන්තාවන් හා ඔවුන්ගේ කුඩා දරුවන් සඳහා නීතිමය සහනය සහ ආරක්ෂාව සැලසෙන තෙක් ඔවුන්ට තාවකාලිකව රැකවරණය සලසාදීම සඳහා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරේ. දැනට අමාත්‍යාංශය විසින් යාපනය , මුලතිව්, රත්නපුරය, හා මඩකලපුව යන දිස්ත්‍රික්කයන්හි ඉදි කර ඇති තාවකාලික කාන්තා රැකවරණ මධ්‍යස්ථාන ක්‍රියාත්මක කිරීම සඳහා අංක අමප/17/0234/740/001 හා 2017-02-07 අමාත්‍ය මණ්ඩල අනුමැතිය යටතේ රාජ්‍ය නොවන සංවිධාන සමඟ එක්ව කටයුතු කෙරේ. මෙම මධ්‍යස්ථානය තුළින් ඔවුනට අවශ්‍ය නීතිමය සහාය,

උපදේශනය, වෛද්‍ය පහසුකම් ලබා දීම මෙන්ම ඔවුන් පුනරුත්ථාපනය කිරීමත්, ඔවුන් තුළ ස්වයං විශ්වාසය ගොඩනංවමින් වින්දිතයින් බලගැන්වීමත් සිදු කරනු ලබයි.





මඩකලපුව දිස්ත්‍රික්කයේ ඉදිකරණ ලද රැකවරණ මධ්‍යස්ථානය



රැකවරණ මධ්‍යස්ථාන පරිපාලනය පිළිබඳ රාජ්‍ය නොවන සංවිධානය සමඟ අවබෝධතා ගිවිසුමට අත්සන් කිරීම

## 7.3 ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනයන් වැළැක්වීම හා ඊට ප්‍රතිචාර දැක්වීම සඳහා රාජ්‍ය හා රාජ්‍ය නොවන යාන්ත්‍රණ ඒකාබද්ධ කෙරෙන වැඩසටහන

ජාත්‍යන්තර කාන්තා දිනයට සමගාමී වන ලෙස මාතර දිස්ත්‍රික්කය කේන්ද්‍ර කර ගනිමින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. මෙහිදී ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනයන් වැළැක්වීම හා ඊට ප්‍රතිචාර දැක්වීම සඳහා එම දිස්ත්‍රික්කයේ සියළු රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන ඒකරාශී කරමින් එම ක්‍රියාවන් අවම කිරීමත්, වින්දිතයින් උදෙසා අවශ්‍ය සේවා සැපයීමත් සහ එකිනෙක අංශයන් මේ සඳහා කෙසේ සහාය දැක්විය යුතු ආකාරයත් හඳුනා ගැනීම සහ මැදිහත්වීම පිළිබඳව සාකච්ඡා කරන ලදී.

## 7.4 අපයෝජනයට හා හිංසනයට පත් වූ වින්දිතයින් සඳහා රෝහල් තුළ තාවකාලික රැඳවුම් නිවාසය ස්ථාපනය කිරීම

පසුගිය වසරේ මොණරාගල දිස්ත්‍රික්කයේ පැවැත්වූ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනයන් වැළැක්වීම හා ඊට ප්‍රතිචාර දැක්වීම සඳහා රාජ්‍ය හා රාජ්‍ය නොවන යාන්ත්‍රණ ඒකාබද්ධ කෙරෙන වැඩසටහන සඳහා සහභාගී වූ පාර්ශවකරුවන්ගේ ඉල්ලීමක් වූයේ හිංසනයෙන් හෝ අපයෝජනයෙන් පීඩාවට පත් වූ දරුවන් හා කාන්තාවන් රෝහල්ගත කර සාමාන්‍ය රෝගීන් සමඟ එකම ස්ථානයක නේවාසිකව ප්‍රතිකාර ලබා දීමේදී වින්දිතයින් විවිධාකාරයේ මානසික පීඩනයන්ට තව තවත් භාජනය වන බවය.

එබැවින් මෙම පුද්ගලයින් සඳහා රෝහල් පරිශ්‍රයේම වෛද්‍ය කාර්යමණ්ඩලයේ පූර්ණ අධීක්ෂණය හා ප්‍රතිකාර යටතේ වෙනම ස්ථානයක් තිබීම ඔවුනගේ කායික හා මානසික සෞඛ්‍ය නැවත ස්ථාපනය කිරීමට ඉවහල් වන බවය. ඒ අනුව මොණරාගල දිස්ත්‍රික් රෝහල් භූමියේ තාවකාලික රැඳවුම් මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීමට මේ වන විට කටයුතු ආරම්භ කර ඇත.

## 08. ස්ත්‍රී පුරුෂ සමාජභාවීය හිංසනය අවම කිරීම සඳහා වූ ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම (2016- 2020)



ස්ත්‍රී පුරුෂ සමාජභාවීය හිංසනය අවම කිරීමට විවිධ පැතිකඩයන් ඔස්සේ ආමන්ත්‍රණය කරන ලද ස්ත්‍රී පුරුෂ සමාජභාවීය හිංසනය අවම කිරීම සඳහා වූ ජාතික ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රධාන අංශ 09 වන්නේ ළමා කටයුතු, ආපදා කළමණාකරණය, ආර්ථික සංවර්ධන හා රැකියා, අධ්‍යාපනය, කාන්තා බලගැන්වීම හා නිවාරනය, විදේශ රැකියා, සෞඛ්‍ය, අධිකරණ හා නිති ප්‍රතිසංස්කරණ සහ මාධ්‍ය වන අතර උප අංශ 02 යටතේ උසස් අධ්‍යාපන සහ වෘත්තීය පුහුණු අධ්‍යාපනය ඇතුලත් වේ. 2017 වසරේ සිට මෙම ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක වේ.

මෙම සැලැස්මට අධ්‍යාපන, සෞඛ්‍ය, ආර්ථික නගා සිටුවීම හා හිංසනය වැළැක්වීම/මැදිහත්වීම, රැකියා ස්ථානය/සංක්‍රමණික කාන්තාවන්ට සිදුවන හිංසන ක්‍රියා සම්බන්ධයෙන් ආමන්ත්‍රණය කිරීම, ආරක්ෂාව සහ නීතිය බලාත්මක කිරීම , අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ, මාධ්‍ය, ආපදා කළමණාකරණය යනාදී ක්ෂේත්‍රයන් ඇතුළත්ය.

මෙම සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන 2017-2019 දක්වා වූ මධ්‍යකාලීන අයවැය රාමුව යටතේ ලබා දීමට අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව එක් එක් අංශයන්හි වගකිව යුතු පාර්ශවකරුවන් වන අමාත්‍යාංශ ඔවුනගේ වාර්ෂික අයවැය ඇස්තමේන්තුව යටතේ මූල්‍ය ප්‍රතිපාදන දැනටමත් වෙන් කර ඇති අතර, වැඩසටහන් හා ක්‍රියාකාරකම්ද ඉටු කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

එසේ සැලැස්මට අදාල සියළු ක්‍රියාකාරකම් හා වැඩසටහන්වල ප්‍රගතිය, පසුවිපරම් හා ඇගයීම් කටයුතු මෙම අමාත්‍යාංශයේ ප්‍රධානත්වයෙන් සිදු කරනු ලැබේ .



ක්‍රියාකාරී සැලැස්ම එළි දැක්වීම

**09. ප්‍රජනන සෞඛ්‍ය සඳහා ඇති හිමිකම ප්‍රවර්ධනය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයට ප්‍රතිචාර දැක්වීම සඳහා ජාතික සහ සිවිල් සමාජ/ සංවිධානවල ධාරිතාව ශක්තිමත් කිරීම (UNFPA )**

ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳව කටයුතු කිරීම සහ කාන්තාවන්ට එරෙහිව සිදුවන හිංසනයන් හා එමගින් සිදුවන ඔවුන්ගේ අයිතිවාසිකම් කඩවීම අවම කර ඔවුන්ට සංවර්ධනයේ ප්‍රතිලාභ ලබා ගැනීමට අවස්ථාව සැලසීමේ අරමුණින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ. පහත සඳහන් ක්‍රියාකාරකම් ඉටු කිරීම සඳහා රුපියල් මිලියන 0.9ක ප්‍රතිපාදන මෙම වර්ෂයේදී එම ආයතනයෙන් ලබා දී ඇත.

**9.1 ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත සිදුවන හිංසනයට හා පීඩාවට පත්වන්නන් සඳහා සේවාවන් සැපයීමට අදාළව රාජ්‍ය හා රාජ්‍ය නොවන යාන්ත්‍රණය වෙත යොමු කිරීමේ ක්‍රමවේදයක් සකස් කිරීම.** (මන්නාරම සහ හම්බන්තොට)

**9.2 ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත සිදුවන හිංසනයන් පිළිබඳව දත්ත රැස්කිරීම හා වාර්තාකරණය**

මේ සම්බන්ධව දත්ත රැස්කිරීම හා වාර්තාකරණය වීම තවමත් විධිමත් හා පොදු අකෘතියක් අනුව සිදු නොවීම හේතුවෙන් මෙම හිංසනයන් පිළිබඳව පවතින සංඛ්‍යාලේඛනයන්හි නිරවද්‍යතාවය තහවුරු කර ගැනීම අපහසු වේ. එබැවින් විධිමත් ලෙස දත්ත ලබාගැනීමේ ක්‍රමවේදයක් සකස් කරමින් එහි නියමු ව්‍යාපෘතිය කොළඹ දිස්ත්‍රික්කය තුළ මෙම දත්ත ඒකරාශී කිරීමට යෝජිත ආයතන විධිමත් අකෘතියකට අනුව දත්ත රැස් කිරීම සඳහා පුහුණු කර දත්ත රැස් කරමින් පවති.

**10. ග්‍රාමීය ආර්ථික සංවර්ධනය උදෙසා ක්‍රියාත්මක වන ව්‍යාපෘති ආයෝජනයන්ගෙන් 25%ක් කාන්තාවන් උදෙසා යෙදවීම.**

- ග්‍රාමීය ආර්ථිකය නැංවීම සඳහා වූ ව්‍යාපෘති වෙනුවෙන් රජය ආයෝජනය කිරීමේදී යොදවන ප්‍රතිපාදනවලින් අවම වශයෙන් 25% ක් සෘජුවම කාන්තාවන් උදෙසා හා ඔවුන්ගේ දායකත්වය ලබා ගන්නා පරිදි ආයෝජනය කිරීම සඳහා ප්‍රතිපත්තිමය තීරණයක් ගැනීම.
- මේ සඳහා මහා භාණ්ඩාගාරය හා ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව මගින් ජාතික ප්‍රතිපත්ති සම්පාදනය කිරීම.
- දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින් පිහිටුවා ඇති ළමා හා කාන්තා සංවර්ධන ඒකක හරහා කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය මගින් මෙම ව්‍යාපෘතීන් සඳහා කාන්තාවන් යොමු කිරීම, අධීක්ෂණය හා පසුවිපරම් කටයුතු සිදු කිරීම.

ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අයවැයකරණය පිළිබඳ වැඩමුළු පැවැත්වීම, ප්‍රධාන කාර්ය සාධක දර්ශක සකස් කිරීම **(KPI)** සිදු කරන ලදී.

## 10.1 කාන්තා ගෘහමූලික පවුල් සඳහා වන ජාතික සැලැස්ම

අමාත්‍ය මණ්ඩල අනුමැතියකට අනුව පිළියෙල කෙරෙන මෙම ජාතික සැලැස්ම අංශ 6කින් සමන්විත වන අතර එය බහු පාර්ශවීය ඒකාබද්ධ ප්‍රවේශයකින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය. යෝජිත අංශ 06 වන්නේ සෞඛ්‍ය හා පෝෂණය, ජීවනෝපාය සංවර්ධනය, සහායක සේවාවන් (නීති, නිවාස, ළමා රැකවරණ), ආරක්ෂාව, සමාජ රැකවරණය සහ ප්‍රතිපත්ති සම්පාදනය හා දැනුවත් කිරීම යන ක්ෂේත්‍රයන්ය.

අමාත්‍යාංශය විසින් මේ වන විට කාන්තා ගෘහමූලික පවුල් සඳහා වන ජාතික සැලැස්ම කෙටුම්පත් කර ඇත. කෙටුම්පත් කරන ලද මෙම සැලැස්මට සිවිල් සංවිධාන ඇතුළු සියළු පාර්ශව ආයතන වලින් තොරතුරු ලබාගෙන තවදුරටත් පෝෂණය කෙරේ.

## 10.2 කාන්තාවන්ට එරෙහිව සියලු ආකාරයේ වෙනස්කම් පිටුදැකීමේ ජාත්‍යන්තර සම්මුතිය (CEDAW)

ශ්‍රී ලංකාව විසින් ඉදිරිපත් කල 08 වෙනි කාලීන වාර්තාව (Periodic Report) සඳහා CEDAW කමිටුව මඟින් ඔවුන්ගේ නිර්දේශයන් ලබා දී ඇත. ඒ අනුව එම නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යාංශය විසින් අතිරේක ලේකම් (සංවර්ධන)ගේ ප්‍රධානත්වයෙන් යුතු කමිටුවක් පත් කර ඇත. එම කමිටුව මඟින් උක්ත නිර්දේශයන් සම්බන්ධව අදාල වන සියළු අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු දැනුවත් කර ඇත. මෙම නිර්දේශ යටතේ තවදුරටත් ඉටු කළ යුතු කාර්යයන් සම්බන්ධව උක්ත කමිටුව මැදිහත්වීම සිදු කරනු ඇත.

# 11.ශ්‍රී ලංකා කාන්තා කාර්යංශය

## දැක්ම

**සවිබල ගැන්වුනු කාන්තා පරපුරක් අනාගතය සඳහා නිර්මාණය කරන ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම ආයතනය බවට පත්වීම.**

## මෙහෙවර

කාන්තාවන් සමාජ ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම සඳහා ඔවුන් සංවිධානගත කිරීම, ඔවුන්ගේ දැනුම, කුසලතාවන් හා හැකියාවන් වර්ධනය හා ආයෝජන අවස්ථා ප්‍රවර්ධනය ඇතුළු සේවාවන් සැලසීම සඳහා වැඩසටහන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය හා නියාමනය කිරීම.

## අරමුණු

- ආර්ථික,සමාජයීය,අධ්‍යාපනික, දේශපාලනික හා සංස්කෘතික ආදී ක්ෂේත්‍රයන් තුළ ශ්‍රී ලාංකීය කාන්තාවන්ට සමාන අයිතිවාසිකම් භුක්ති විඳීමට අවස්ථාව සලසා දීම.
- කාන්තාවන් වූ නිසාම නොයෙකුත් ක්ෂේත්‍ර තුළ දැනට අත්විඳින බාධා ඉවත් කිරීම සඳහා ඔවුන් සවිබල ගැන්වීම.
- කාන්තාවන්ට සම අයිතිවාසිකම් හා සම අවස්ථා තහවුරු විය යුතු අංශ හඳුනා ගැනීම,ඒ සඳහා අවශ්‍ය රාජ්‍ය ප්‍රතිපත්ති සකස් කිරීමට සහය දීම සහ ඒ සඳහා විවිධ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.

## ප්‍රධාන කාර්යභාරය

1. ශ්‍රී ලාංකීය කාන්තාවන් ආර්ථික හා සමාජීය වශයෙන් බලගැන්වීම සඳහා සුදුසු වැඩසටහන් හා ව්‍යාපෘති හඳුනා ගැනීම, සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ඇගයීම.

2. කාන්තාවන් වීම නිසාම ඔවුන් මුහුණදෙන සමාජීය දුෂ්කරතා මඟ හැරවීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.


3. සේවාලාභීන්, කාන්තාවන් හා සැපයෙන සේවාවන් අදාල දත්ත හා තොරතුරු රැස්කිරීම, පවත්වාගෙන යාම.

4. ඉහල වෘත්තීමය නිපුනතාවයකින් යුතුව ඵලදායී සේවාවක් ඉටුකිරීම තහවුරු කිරීම සඳහා මානව සම්පත් සංවර්ධනය කිරීම.

5. සමස්ත කාන්තා පරපුරේ දැනුම, කුසලතා සහ ආකල්ප ඉහළ තලයකට නංවාලීම
සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.


6.කාන්තාවන් ගම් මට්ටමේ සිට ජාතික මට්ටම දක්වා විවිධ තලයන් ඔස්සේ ජාලගත කරමින් ඔවුන් වඩාත් ශක්තිමත් කිරීම.

## සංවිධාන ව්‍යුහය




**කාන්තා සංවිධාන ජාලය**

පර්යේෂණ නිලධාරි (01), උපදේශන නිලධාරි (10), සංවර්ධන නිලධාරි (22), වනිතා සංවර්ධන නිලධාරි (338), උපදේශන සහකාර (220), සහන සොයුරිය (124), කළමණාකාර සහකාර (2), පුස්තකාළ සහකාර (01), කාර්යාල කාර්ය සහායක (4), මධ්‍යස්ථාන පාළිකා (01), සහකාර මධ්‍යස්ථාන පාළිකා (01), උපදේශන මධ්‍යස්ථාන තුළ කාර්යාල කාර්ය සහායක (08)



ආර්ථික, සමාජීය, ගෘහමූලික කාන්තාවන් සවිබල ගැන්වීම , ස්ත්‍රීපුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය වැළැක්වීම හා සමානාත්මතාවය යන ප්‍රධාන අංශයන් යටතේ ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සිදු කරයි.

# ක්‍රියාත්මක කළ ප්‍රධාන සංවර්ධන වැඩසටහන් - 2017

## 01. වැන්දඹු හා ගෘහමූලික කාන්තාවන් සවිබල ගැන්වීම

රැකියා විරහිත ගෘහමූලික කාන්තාවන් සඳහා ආදායම් උත්පාදන මාර්ග හඳුන්වාදීම, හඳුනාගත් ගෘහමූලික කාන්තාවන් ව්‍යාපෘති ගැන්වීම හා ඔවුන්ගේ ආදායම් මට්ටම ඉහළ නැංවීම හා ගෘහමූලික කාන්තාවන් සඳහා ව්‍යාපෘති උපදේශන සේවාවන් සැපයීම හා අදාළ සේවාවන්ට යොමු කිරීම යන අරමුණු ඇතිව මෙම වැඩසටහන ක්‍රියාත්මක වේ.

කාන්තා කාර්ය සංවිධාන / වැන්දඹු හා ගෘහමූලික කාන්තා සංගමය මූලික කර ගනිමින් වයස අවු 18-65 අතර අඩු ආදායම්ලාභී ගෘහමූලික කාන්තා පවුල් සවිබල ගැන්වීමේ ස්වයං රැකියා ව්‍යාපෘති ලෙස තෝරා ගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල පොලී රහිත සහන චක්‍රීය ණය ලබා දේ. ගෘහමූලික කාන්තාවක් වීම, ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට ඇති හැකියාව, අඩු ආදායම් මට්ටම හා යැපෙන දරුවන් සංඛ්‍යාව මෙහිදී නිර්ණායක ලෙස සලකා බැලේ.

මේ යටතේ තෝරා ගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ස්වයං රැකියා ණය ව්‍යාපෘති 32ක් හා දේශීය නිෂ්පාදන ව්‍යාපෘති 9ක් සඳහා රු. මිලියන 9.36ක වැය කොට ගෘහ මූලික කාන්තාවන් 535 ක් සඳහා ප්‍රතිලාභ ලබාදී ඇත.

## 02.වැන්දඹු කාන්තාවන් හා ගෘහ මූලික කාන්තාවන් සවිබල ගැන්වීමේ ජාතික මධ්‍යස්ථානය (කිළිනොච්චිය)

කිළිනොච්චිය නගරයේ 2015 වසරේ නොවැම්බර් 13 දින මෙම ජාතික මධ්‍යස්ථානය පිහිටුවන ලදී. මෙහි ප්‍රධාන අරමුණ වුයේ යුද්ධයෙන් වැන්දඹු වූ සියලු ජන කොටස්වල කාන්තාවන් හා ඔවුන්ගෙන් යැපෙන්නන් හට විශේෂ රැකවරණ ක්‍රමයක් හඳුන්වාදීමය. දැනට මෙම මධ්‍යස්ථානය මඟින් දිවයින පුරා විසිරි සිටින වැන්දඹු හා ගෘහමූලික කාන්තාවන් සවිබල ගැන්වීම සඳහා ශක්තිමත් රාජ්‍ය යාන්ත්‍රණයක් ස්ථාපිත කර ඇත.

කිළිනොච්චිය දිස්ත්‍රික්කයේ සියළු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ක්‍රියාත්මක කරන ශිල්පීය ව්‍යාපෘති සම්බන්ධීකරණය, ප්‍රදේශයට ආවේණික කර්මාන්ත වන තල් නිෂ්පාදන, විසිතුරු භාණ්ඩ නිෂ්පාදන හා

මැහුම් හා රුපලාවන්‍ය වැනි ශිල්පීය පුහුණු මඟින් ආදායම් උත්පාදන අවස්ථා ලබාදීම, උපදේශනය සේවා සඳහා යොමු කිරීම හා ජාතික මධ්‍යස්ථානය පවත්වාගෙන යාම / නඩත්තු කටයුතු මේ යටතේ සිදුකර ඇත.

කිළිනොච්චිය දිස්ත්‍රික්කයේ සියළු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ගෘහමූලික කාන්තා පවුල්වල තොරතුරු ලබා ගෙන, තෝරා ගත් කොට්ඨාශ සඳහා ආදායම් උත්පාදන ව්‍යාපෘති ආරම්භ කිරීමට ශිල්පීය පුහුණු පාඨමාලා 5ක් සිදු කර ගෘහ මූලික කාන්තාවන් 92 ක් සඳහා ප්‍රතිලාභ ලබාදී ඇත. ජාතික මධ්‍යස්ථානය පවත්වා ගෙන යාම/ නඩත්තු කටයුතු සිදු කිරීම හා ශිල්පීය පුහුණු සඳහා රු. මිලියන 1.235ක ප්‍රතිපාදන වැය කර ඇත.

## 03. ‘‘තිරසර කෘෂි ’’ වැඩසටහන

මෙම වැඩසටහනේ අරමුණ පවුලේ ආර්ථිකයේ තිරසාරභාවය ඇති කිරීමයි. මේ මගින් දේශීය කෘෂි ආර්ථික බෝග වගාවන් සඳහා කාන්තාවන් යොමු කිරීම හා සමබර වූ ග්‍රාමීය පරිසරයක් තුළින් පවුලේ ආදායම් මට්ටම ඉහළ නැංවීම වේ.

- මෙම ව්‍යාපෘතිය මඟින් ඖෂධ, පළතුරු, මල් හා විසිතුරු පැළ, ධාන්‍ය වගාවන්, බීජ, කාබනික පොහොර/ සත්ත්ව පාලන හා සත්ත්ව ආහාර නිෂ්පාදන මෙන්ම වාණිජ බෝග වගාවන් කාබනික කෘෂි වගා ව්‍යාපෘති ලෙස වැඩිදියුණු කිරීම හා බීජ, පැළ, කාබනික පොහොර සහ පුහුණුව ලබාදීම සිදු කෙරේ.

- තාක්ෂණික/ සහාය ආයතන ලෙස කෘෂිකර්ම අමාත්‍යාංශය, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව, විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය, පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය හා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශවලින් සම්පත් දායකත්වය ලබාගනී.

- 2017 වසරේ අනුරාධපුරය, මාතලේ, බදුල්ල, අම්පාර, මොණරාගල, කුරුණෑගල යන දිස්ත්‍රික් 06 ක් තුළ ව්‍යාපෘතීන් ක්‍රියාත්මකයි.

2017 වර්ෂයේ කෘෂි ව්‍යාපෘති 20ක් සඳහා රු. මිලියන 2.177ක ප්‍රතිපාදන වැය කොට ඇති අතර කාන්තාවන් 382 ක් සඳහා ප්‍රතිලාභ ලබාදී ඇත.

## 04. ආදායම් උත්පාදන මාර්ග සඳහා පෙළඹවීමේ පුහුණු වැඩසටහන

චක්‍රීය ණය යෝජනා ක්‍රම තුළින් ප්‍රතිලාභ ලබාදීමට ප්‍රථම සාර්ථක ව්‍යාපාරයක් කරගෙන යාමට අවශ්‍ය කළමනාකරණ දැනුම හා කුසලතාවය ලබාදීම හා යැපුම් මානසිකත්වයෙන් මුදවා ගෙන අඩු ආදායම්ලාභී කාන්තාවන් ව්‍යවසායකයන් ලෙස ආර්ථික වශයෙන් සක්‍රීය පිරිසක් බවට පත් කිරීම වැඩසටහනේ අරමුණයි.

ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශයේ සියළු ණය වැඩසටහන් සාර්ථකව කිරීම සඳහා සහාය වැඩසටහනක් වන මෙම වැඩසටහන ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණුව හා ගිණුම් පුහුණු ලබාදීම සඳහා කුඩා ව්‍යාපාර සංවර්ධන අංශයේ සහ කාර්මික සංවර්ධන මණ්ඩලයේ සම්පත්දායකත්වය ලබා ගනී.

2017 ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණුව හා ගිණුම් පුහුණු 120ක් සඳහා රු. මිලියන 3.0627ක ප්‍රතිපාදන වැය කොට කාන්තාවන් 5458 සඳහා ප්‍රතිලාභ ලබාදී ඇත.




කන්තලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පැවති ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණුව හා ගිණුම් පුහුණුව

## 05. ශිල්පීය පුහුණු වැඩසටහන

කාන්තාවන්ගේ නිෂ්පාදනවල ගුණාත්මකභාවය වර්ධනය හා එකතුකළ අගය ඉහළ නැංවීමට කාන්තාවන් දිරිගැන්වීම මෙම පුහුණුව මඟින් අරමුණු කෙරේ.

දැනුම හා කුසලතාව, තාක්ෂණික ශිල්පීය ක්‍රම හා උපකරණ ලබාදීම සඳහා තාක්ෂණික හා සම්පත් දායකත්වය හස්ත කර්මාන්ත ආයතනය, ජාතික ශිල්ප සභාව, ලක්සල හා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් ලබා ගැනේ.

2017 වසර අවසන් වන විට ශිල්පීය පුහුණු 20ක් සඳහා රු. මිලියන 0.996 ක ප්‍රතිපාදන වැය කොට කාන්තාවන් 200ක් සඳහා පුහුණුව ලබාදී ඇත.

## 06. කාන්තා නිෂ්පාදන ප්‍රදර්ශනය හා අලෙවිපොළ

ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශයේ ලියාපදිංචි කාන්තා කාර්ය සංවිධානවල සමාජිකාවන්ගේ ආර්ථික හා සමාජීය තත්ත්වය නඟා සිටුවීම වෙනුවෙන් ඔවුන්ගේ නිෂ්පාදනවල ගුණාත්මකභාවය වර්ධනය සඳහා හා එකතුකළ අගය ඉහළ නැංවීමට කාන්තාවන් දිරිගැන්වීමත් නිර්මාණ හා නිෂ්පාදන සඳහා තරඟකාරී වෙළඳපොළක් ඇති කිරීමත් අරමුණු වේ.

- කාන්තා දින ජාතික උත්සවයට සමගාමී නිෂ්පාදන ප්‍රදර්ශනය හා වෙළඳපොළ, ලිය ශක්ති අවුරුදු පොළ, දළදා පෙරහැරට සමගාමී නිෂ්පාදන ප්‍රර්ශනය හා වෙළඳපොළසෙත්සිරිපාය නිෂ්පාදන , දප්‍රර්ශනය හා වෙළඳපොළ ජාතික මට්ටමින් ක්‍රියාත්මක කෙරේ .

- ගාල්ල, මන්නාරම, ගම්පහ, කළුතර, නුවරඑළිය, මොණරාගල, අනුරාධපුරය, ත්‍රිකුණාමලය, හම්බන්තොට, කිලිනොච්චි, මුලතිව්, බදුල්ල, කුරුණෑගල, පොළොන්නරුව දිස්ත්‍රික් 13 හා ප්‍රාදේශීය මට්ටමින් අලෙවිපොළ ක්‍රියාත්මක කර ඇත.
- කාන්තා කාර්ය සංවිධානවල ව්‍යවසායිකාවන්, කාන්තා කාර්යංශයේ සම්පත් දායකත්වයෙන් සහ විවිධ මාධ්‍ය ආයතන ප්‍රචාරණ සහාය මේ සඳහා ලබා ගෙන ඇත.

2017 නිෂ්පාදන ප්‍රදර්ශනය හා වෙළඳපොළ 18ක් සඳහා රු. මිලියන 1.45ක ප්‍රතිපාදන වැය කොට කාන්තාවන් 2177ක් සඳහා ප්‍රතිලාභ ලබාදී ඇත.



මාතර සනත් ජයසූරිය ක්‍රීඩාංගණයේ පැවති ජාත්‍යන්තර කාන්තා දිනයට සමගාමී නිෂ්පාදන ප්‍රදර්ශනය හා වෙළඳපොළ

## 07. ආහාර නිෂ්පාදන වෙළඳ මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම (ලිය ශක්ති රස බොජුන්හල)

වස විසෙන් තොර දේශීය ආහාර මහජනතාව අතර ප්‍රචලිත කිරීම, ආහාර තාක්ෂණය පිළිබඳ දැනුම ලබාදීම තුළින් ගුණාත්මක උසස් තත්ත්වයේ නිෂ්පාදන සැකසීම. වෙළඳපොළ අවස්ථා ලබාදීම තුළින් ආදායම් මට්ටම ඉහළ නැංවීමේ අරමුණින් ලිය ශක්ති රස බොජුන් අලෙවිසැල් ඉදි කරනු ලබයි.

- අම්පාර දිස්ත්‍රික්කයේ ලාහුගල මඟුල් මහ විහාර පුදබිමෙහි අවිධිමත්ව වෙළඳාමේ නියැලෙන අඩු ආදායම්ලාභී කාන්තාවන්ට විධිමත් වෙළඳකුටි හා යටිතල පහසුකම් ඇති කිරීමමෙම ව්‍යා .පෘතියේ පළමු අදියර ලෙස වෙළඳකුටි .ක් ඉදි කිරීම04
- දැනුවත් කිරීම හා පුහුණු වැඩසටහන් පැවැත්වීම
- සම්පත් දායකත්වය ලාහුගල ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලයආහාර ප්‍ර ,වර්ධන මණ්ඩලය කුඩා , කර්මාන්ත හා ග්‍රාමීය කටයුතු අමාත්‍යාශය මඟින් සැපයේ.

දේප්‍රා (මඟුල්මහ විහාර පුදබිම) වර්ෂය අවසන් වන විට අම්පාර ලාහුගල 2017ශීය ලේකම් කොට්ඨාශයේ ලිය ශක්ති වෙළඳ මධ්‍යස්ථානයේ වෙළඳ කුටි ක් ඉදිකිරීම හා4ව්‍යවසායක කාන්තාවන් ක් සඳහා පුහුණු වැඩසටහනක් පවත්වා ඇත 45



කාන්තාවන් දැනට පවත්වාගෙන යන
අව්‍යිමත් වෙළඳපොලක්

## 08. චක්‍රිය ණය වැඩසටහන

කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම හා ග්‍රාමීය ණයගැතිභාවය අඩු කිරීම මෙහි අරමුණ වේ. චක්‍රීය ණය යෝජනා ක්‍රමය 1992 සිට දිස්ත්‍රික්ක 22ක ක්‍රියාත්මක වන අතර ප්‍රතිපාදන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වෙත ලබා දී ඇත. එක් කාන්තාවකට අවමය රු. 5,000 සිට උපරිමය රු. 30,000 දක්වා ණය ලබා දේ. රු. 5,000 සිට රු. 10,000 දක්වා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ණය අනුමත කරන අතර රු. 20,000 සිට රු. 30,000 දක්වා ණය කාන්තා කාර්යාංශ අධ්‍යක්ෂතුමියගේ අනුමැතියෙන් ලබා දෙනු ලැබේ.

එමෙන්ම චක්‍රීය ණය හා අපේක්ෂා ණය ලබාදීම හා චක්‍රීය ණය යෝජනා ක්‍රම යාන්ත්‍රණය ශක්තිමත් කිරීම සඳහා අධීක්ෂණය හා ගිණුම් පුහුණු වැඩසටහන සිදු කරනු ලබයි. 2017 වර්ෂයේ දී අධීක්ෂණය සඳහා රු.මිලියන 0.115ක මුදලක් වෙන් වී ඇත. මහනුවර, මාතලේ, නුවරඑළිය, පොළොන්නරුව ගාල්ල, මාතර, හම්බන්තොට, පුත්තලම, රත්නපුර, කෑගල්ල, ගම්පහ, කොළඹ, අම්පාර, ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්ක 13හි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 50ක අධීක්ෂණ සිදු කර ඇත. මෙම වසරේ ජනවාරි මස සිට දෙසැම්බර් 31 දක්වා රු.මිලියන 7.463 ක චක්‍රීය ණය ලබා දී ඇති අතර ඉන් ප්‍රතිලාභ ලැබූ සංඛ්‍යාව 690 කි.

## 09. ගිණුම් පුහුණුව

චක්‍රීය ණය ක්‍රියාත්මක ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශවල නිවැරදි ගිණුම් තැබීම සඳහා පුහුණුව ලබා දීම, ගිණුම් තැබීමේදී පවත්වා ගත යුතු මූලික පොත් පත් හා ගණුදෙනුවල විශ්වාසනීයත්වය ඇතිකරවන මූලික ලියවිලි පිළිබඳ අවබෝධය ලබාදීම සඳහා අවසන් ගිණුම් සැකසීමට අවශ්‍ය දැණුම ලබාදීමේ අරමුණින් ගිණුම් පුහුණු වැඩසටහන ක්‍රියාත්මක කෙරේ. 2017 වසරේ පළමු අදියරේ පුහුණු වැඩසටහන් 25ක් සඳහා රු. මිලියන 0.356ක ප්‍රතිපාදන වැයවී ඇති අතර ඉන් ප්‍රතිලාභී කාන්තාවන් 1251ක් සඳහා ප්‍රතිලාභ ලබා දී ඇත.

## 10. වනිතා ශක්ති පදනම

ග්‍රාමීය කාන්තාවන්ගේ හා එම පවුල්වල ආදායම හා ඉතිරි කිරීම් ඉහළ නැංවීම, මුදල් පාලනය පිළිබඳ හැකියාවක් ඇති කිරීම, හිතකර හා පහසු කොන්දේසි මත කාන්තාවන්ට තමන්ගේම සංවිධානාත්මක රාමුවක් හරහා ණය ලබා ගැනීමට අවස්ථාව සැලසීම හා ඔවුන්ගේ ඉතුරුම් ගම තුළම රඳවා තබා ගැනීම මෙහි අරමුණ වේ.

මෙම වසරේදී සුළු මූල්‍ය ශාඛා ක්‍රියාකාරිත්වය හා ගිණුම් පොත් අධීක්ෂණය , අක්‍රීය සුළු මූල්‍ය ශාඛා ඇවර කිරීම, පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව හා එක්ව සුළු මූල්‍ය ශාඛා නිත්‍යානුකූලව ලියාපදිංචි කිරීම මෙන්ම සාමාජික තැන්පත්, කොටස් තැන්පත්, ඉතුරුම්, ළමා හා කණ්ඩායම් තැන්පත් යන ඉතුරුම් ක්‍රම හඳුන්වාදීම ද සිදුකර ඇත.

මේ වන විට දිස්ත්‍රික්ක 9 ක, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 21 ක වනිතා ශක්ති සුළු මූල්‍ය ශාඛා 56 ක් ක්‍රියාත්මක වන අතර, ඉන් 35 ක් සක්‍රීය මට්ටමේ පවතී. වයඹ හා සබරගමු පළාත්වල සුළු මූල්‍ය ශාඛා පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව හා එක්ව නිත්‍යානුකූලව ලියාපදිංචි කිරීමට නියමිතය.

2017 ජනවාරි මස සිට සැප්තැම්බර් 30 දිනට වනිතා ශක්ති සුළු මූල්‍ය ශාඛා 14ක රු. මිලියන 9.154 ණය ප්‍රමාණයක් ප්‍රතිලාභීන් 618ක් අතර සංසරණය වෙමින් පවතී.අධීක්ෂණ 10 ක් සිදුකර ඇත .

## 11. වතුකරයේ කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම

ශ්‍රී ලංකාවේ ආර්ථික වශයෙන් දරිද්‍රතා රේඛාවෙන් පහළ සිටින ජනගහණයෙන් 24.3% ක් වතු අංශයේ සේවයේ නියුතු ජනතාව වේ. වතු ක්ෂේත්‍රයේ ශ්‍රම බලකායෙන් වැඩි ප්‍රමාණයක්ම කාන්තාවන්ය. එම නිසා වතුකරයේ කාන්තාවන් සඳහා ඵලදායී අතිරේක ආදායම් මාර්ග හඳුන්වාදීම හා නව අලෙවිපොළ අවස්ථා ඇතිකිරීම සඳහා මෙම වැඩසටහන ක්‍රියාත්මක කෙරේ.

වතුකරයේ කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබල ගැන්වීමට ශිල්පීය දැනුම ලබාදීම, ව්‍යවසායකත්ව පුහුණුව හා ව්‍යාපෘති ආධාර ලබාදීම වෙනුවෙන් 2017 වසරේදී රු.මිලියන 1.990 ප්‍රතිපාදන ව්‍යාපෘති 39ක් සඳහා යවා ඇති අතර අගෝස්තු මස අවසන් වන විට ඇඳුම් මැසීම, කෙටි ආහාර නිෂ්පාදනය, පාසැල් නිල ඇඳුම් මැසීම, ගෙවතු හා සත්ත්ව පාලන ව්‍යාපෘති හා රූපලාවන්‍ය ආදී පුහුණු වැඩසටහන් 20 ක් අවසන් කොට ප්‍රතිලාභී කාන්තාවන් 319ක් ව්‍යාපෘති ගන්වා ඇත.

## 12. විදේශගතවීමට අපේක්ෂිත කාන්තාවන් සඳහා විකල්ප ආදායම් උත්පාදන වැඩසටහන

කාන්තාවන් විදේශගත වීම නිසා පවුලේ සමාජිකයන්ට මෙන්ම දරුවන්ගේ අනාරක්ෂිතභාවයෙන් ඇතිවන අවදානම දුරුකිරීම හා විදේශයන්හි සිදුවන විවිධ හිංසන හා සෞඛ්‍ය ආදී ගැටළු තත්වයන්ගෙන් ඔවුන් මුදවා ගැනීම හා විදේශගත වීමට ආදේශකයක් වශයෙන් මෙරට තුළදී ස්වයං රැකියා අවස්ථා ලබාදීම මෙහි අරමුණ වේ.

- ව්‍යපෘති දැනුවත්භාවය සහ ස්වයං රැකියා ව්‍යාපෘති ණය හා උපකරණ ලබාදීම



**බමුණාකොටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මැටි කර්මාන්තය, කොහු කර්මාන්තය හා බුලත් වගාව සඳහා ණය ආධාර ලබා දුන් විකල්ප ආදායම් මාර්ග ව්‍යාපෘති**

2017 වසරේදී රු.මිලියන 3.49775ක ප්‍රතිපාදන ව්‍යාපෘති 140 ක් සඳහා ප්‍රතිලාභී කාන්තාවන් 140ක් ස්වයං ව්‍යාපෘති ගන්වා ඇත. රෙදි හා සම් ආශ්‍රිත නිෂ්පාදන, හස්ත කර්මාන්ත, ගෙවතු වගාවන්, සත්ත්ව පාලන, ආහාර හා වෙනත් අළෙවි කිරීම් හා කාලීන ව්‍යාපෘති ආදී ව්‍යාපෘති සඳහා රු. 25,000 බැගින් , මුදලින් අඩක් අය කිරීමේ පදනම මත ණය ආධාර ලබා දේ. අගෝස්තු මස අවසන් වන විට ප්‍රතිලාභී කාන්තාවන් 43ක් ස්වයං රැකියා ව්‍යාපෘති ගන්වා ඇත.

## 13. පුනරුත්ථාපන ආයතන තුළ රැඳී සිටින කාන්තාවන් ආර්ථික හා සමාජීය වශයෙන් සවිබල ගැන්වීමේ වැඩසටහන ‘‘)හෙට මහට (’’කතට සුවසෙත -

දිළිඳුකම හා වෙනත් පෙළඹවීම් මත සමාජ විරෝධී ක්‍රියාවන්හි නිරතවන අවදානම් තත්ත්වයේ පසුවන කාන්තාවන් සමාජයට හිතකර ආදායම් මාර්ග පිළිබඳ නිසි මඟපෙන්වීම හා ව්‍යවසායක කාන්තාවක් ලෙස සමාජගත කිරීම මෙහි අරමුණ වේ.

බන්ධනාගාර, මෙත්සෙවන නිවර්තන නිවාසය යන ආයතන තුළ රැඳී සිටින කාන්තාවන්ට ස්වඅභිමානයෙන් නැඟී සිටීමට උපදේශනය ලබාදීම හා ප්‍රජා විශෝධනය සඳහා යොමුකර ඇති හා බලපත්‍ර මත මුදා හැර සිටින කාන්තාවන් ස්වයං රැකියා පුහුණුව හා ඊට අදාළ ව්‍යාපෘති ආධාර, අමුද්‍රව්‍ය උපකරණ ලබාදීම මේ යටතේ සිදුකර ඇත.



**ත්‍රිකුණාමලය බන්ධනාගාරයේ රැඳී සිටින කාන්තාවන්ට පැවති පාසැල් නිල ඇඳුම් මැසීමේ ව්‍යාපෘතිය සඳහා ජුකී මැෂිමක් ලබාදීමේ අවස්ථාව.**

2017 වසරේදී රු.මිලියන 0.899 ක ප්‍රතිපාදන ව්‍යාපෘති 5 ක් සඳහා කාන්තාවන් 312 පුහුණු කර ඇත. නිල ඇඳුම්, ළදරු ඇඳුම්, රෙදි බෑග්, තිර රෙදි මැසීම, කඩදාසි බෑග්, ලියුම් කවර සැකසීම, සපත්තු නිෂ්පාදනය, කේක් සෑදීම, අත්කම් නිර්මාණ ආදී ස්වයං රැකියා ව්‍යාපෘතිවල කාන්තාවන් නිරත කර ඇත.

## 14. දිස්ත්‍රික් හා ප්‍රාදේශීය බලමණ්ඩල කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම

ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය මඟින් ජාලගත කර ඇති කාන්තා කාර්ය සංවිධානවල කාන්තාවන් ආර්ථික සවිබල ගැන්වීමේ අරමුණින් පෘතිවල වර්ෂයට සමගාමීව කණ්ඩායම් ව්‍යා දිළිඳුකමින් තුරන් කිරීමේ 2017 .නියුක්ත කිරීම මෙම වැඩසටහනින් සිදුකරනු ලබයි

2017 වසරේදී රු. මිලියන 2.0ක ප්‍රතිපාදන ව්‍යාපෘති 10ක් සඳහා යවා ඇති අතර කාන්තාවන් 10කින් සමන්විත කණ්ඩායමක් එක් ව්‍යාපෘතියක නිරත කර ඇත. කොහු ආශ්‍රිත නිෂ්පාදන, බතික් හා ඇඳුම් නිර්මාණය, බ්ලොක් ගල් නිෂ්පාදනය, බිම්මල් වගාව, කජු තැලීම, සත්ත්ව පාලනය, කරවල වියලීම හා පැකට් කිරීම වැනි කණ්ඩායම් ව්‍යාපෘති 10 සඳහා රු.මිලියන 1.98197ක් වියදම් කර ප්‍රතිලාභී කාන්තාවන් 140ක් සඳහා අමුද්‍රව්‍ය හා උපකරණ ලබාදීම සිදු කර ඇත.

## 15. ඉතාමත් දිළිඳු නාගරික පවුල්වල ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා ‘‘ජීවිතයට නව මඟක්’’ - නව කැළණිය පාලමට අනුබද්ධිත වැඩසටහන.

නව කැළණි පාලම හා නව මාර්ග ඉදිකිරීම හේතුවෙන් සේදවත්ත, වදුල්ලවත්ත හා ඔරුගොඩවත්ත යන ග්‍රාමනිලධාරී කොට්ඨාශවල ජීවත් වූ පවුල් 350ක් කොළොන්නාව සාලමුල්ල ලක්සඳ නව නිවාස සංකීර්ණයේ නැවත පදිංචි කිරීම සිදු කර ඇත. මෙම කාන්තාවන් මුල් කර ගෙන මාර්ග සංවර්ධන අධිකාරිය සමඟ ඒකාබද්ධව ‘‘ජීවිතයට නව මඟක්’’ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරේ.

මෙහි මූලික අදියර ලෙස ප්‍රජනන සෞඛ්‍ය වැඩසටහන් හා ජංගම උපදේශන සායන පැවැත්වීමත්, සමීක්ෂණ දත්ත අනුව වැඩි පිරිසකගේ දෛනික ආදායම ස්වයං රැකියා ආශ්‍රිතව බැඳී පවතින බැවින් දෙවන අදියරේදී කාන්තාවන් දිරිගැන්වීම සඳහා ව්‍යවසායකත්ව පුහුණුව හා ස්වයං රැකියා වැඩිදියුණු කර ගැනීමට අදාල උපකරණ ලබා දීමටත් සැලසුම් කර ඇත.

අදාල ප්‍රදේශයේ ව්‍යාපෘති හඳුනාගැනීම හා ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශයේ ලියාපදිංචි කාන්තා කාර්ය සංවිධානයක් පිහිටුවීම සිදුකර ඇති අතර ආකල්ප සංවර්ධනය කිරීම සඳහා උපදේශන වැඩසටහනක් පවත්වා ඇත. දැනුවත් කිරීම් 04 ක් හා පුහුණු වැඩසටහන් 04 ක් පැවැත්වීම හා උපකරණ මිලදී ගැනීම සඳහා රු.මිලියන 0.58468ක ප්‍රතිපාදන යොදවා ඇත.

## 16.රැකවරණ මධ්‍යස්ථාන පවත්වාගෙන යාම

ලිංගික හා ගෘහස්ථ හිංසනය හා තැනැත්තන් වෙළඳාමට කාන්තාවන් ලක්වීමෙන් වැලැක්වීම සහ දැනටමත් එසේ පීඩනයට ලක්වී ඇති කාන්තාවන් ඉන් මුදවා ගැනීම සඳහා අවශ්‍ය මඟපෙන්වීම සහ රැකවරණය ලබාදීම පිණිස සුදුසු ආයතනික ව්‍යුහයක් පවත්වාගෙන යාම අරමුණු වේ. වින්දිත කාන්තාවන්ට හා දරුවන්ට තාවකාලික නවාතැන්, මානසික සෞඛ්‍ය ප්‍රතිකාර, උපදේශනය, නීතිමය මඟ පෙන්වීම, ආහාර, බෙහෙත් හා ඇඳුම් සැපයීම, අවශ්‍ය කාන්තාවන්ට ඔවුන්ගේ අධ්‍යාපන මට්ටමට සුදුසු රැකියා සඳහා යොමු කිරීම, ස්වයං රැකියා පුහුණු ලබාදීම හා බිඳුනු පවුල් සංස්ථාව යළි ගොඩනැංවීම මෙම වැඩසටහන යටතේ ප්‍රධාන වශයෙන් සිදුකර ඇත. කොළඹ හා ගම්පහ රැකවරණ මධ්‍යස්ථාන නඩත්තුව සඳහා රු.මිලියන 1.5ක ප්‍රතිපාදන වෙන්කොට ඇති අතර රු.මිලියන 0.652 ක් වැයකොට ඇත. මෙම මධ්‍යස්ථානය පරිපාලනය සිදු කෙරෙනුයේ අමාත්‍ය මණ්ඩල අනුමැතිය යටතේ රාජ්‍ය අංශය හා පෞද්ගලික අංශය ඒකාබද්ධවය.

| රැකවරණ මධ්‍යස්ථානය පිහිටි දිස්ත්‍රික්කය | 2013 සිට 2017 දක්වා රැකවරණය ලැබූ සංඛ්‍යාව | පරිපාලන වියදම් | ගොඩනැගිලි අයිතිය |
|---|---|---|---|
| කොළඹ (මධ්‍යස්ථාන 02) | කාන්තාවන් 53<br>දරුවන්50 | අමාත්‍යාංශය විසින් | කාන්තා පිහිට ආයතනයට පවරා ඇත |
| මාතර | කාන්තාවනු 16<br>දරුවන් 14 | | |
| ගම්පහ | කාන්තාවන් 01 | අමාත්‍යාංශය විසින් | බස්නාහිර පළාත් සභාව සතුය |
| යාපනය | කාන්තාවන් 15 | අමාත්‍යාංශය විසින් | Jaffna Social Action Center පවරා ඇත. ගොඩනැගිල්ල අමාත්‍යාංශය සතුය |
| මුලතිව් | කානතාවන් 001 | | |
| මඩකලපුව | කාන්තාවන් 02 | අමාත්‍යාංශය විසින් | අමාත්‍යාංශය සතුය |
| සුළු සේවාලාභීන් | කාන්තාවන් 88,<br>දරුවන් 64 | | |

## .17ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය වැළැක්වීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන

ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා ලිංගිකත්වය මත පදනම් වූ හිංසනයන් ආමන්ත්‍රණය කිරීම සඳහා වන ජාතික ක්‍රියාකාරී සැලස්මට අනුව කාන්තාවන් සවිබල ගැන්වීම හා හිංසනය වැළක්වීම යන අංශික සැලැස්මෙහි ක්‍රමෝපාය යටතේ සමාජ සවිබල ගැන්වීම, ප්‍රජා සජීවීකරණය, සංවිධානය හා ධාරිතා සංවර්ධනය සහ ප්‍රාදේශීය මට්ටමින් අවධි කණ්ඩායම් ගොඩනැගීම අපේක්ෂා කෙරේ.

OXFAM අනුග්‍රහය යටතේ කරච්චි, කන්දාවලි, මීගමුව, ඇහැළියගොඩ, අඹගමුවකෝරලේ හා කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල නියමු වැඩසටහන් 08ක් සංවිධානය කර ඇත, රැකියාවල නියුතු කාන්තාවන් සම්බන්ධයෙන් හිංසන සිද්ධීන් ඉහළයාම නිසා ඇඟළුම් කර්මාන්ත, වැවිලි ක්ෂේත්‍රය හා රාජ්‍ය හා පෞද්ගලික අංශ මුලික කර ගෙන වැඩසටහන් 39ක් සඳහා ප්‍රතිපාදන යවා ඇත.

## .18උපදේශන මධ්‍යස්ථාන පවත්වාගෙන යාම හා නඩත්තුව

පීඩාවට පත්වූ කාන්තාවන්ට හා ළමුන්ට මනෝ විද්‍යාත්මක උපදේශනය ලබාදෙමින් ඔවුන්ට සේවා ලබා ගත හැකි පුද්ගලයින් සහ ආයතන වෙත යොමු කිරීම සහ තම ගැටළුවට සාර්ථක විසඳුම් සොයා ගැනීමට ඔවුන් ශක්තිමත් කිරීම මෙහි අරමුණු වේ.

රටේ වත්මන් අවශ්‍යතාවයන්ට ගැළපෙන පරිදි අමාත්‍යාංශය මඟින් සැපයෙන උපදේශන සේවාවල කාර්යක්ෂමතාව හා ගුණාත්මකභාවය ඉහළ අගයක පවත්වාගෙන යාමට දිස්ත්‍රික් මට්ටමින් මධ්‍යස්ථාන 11 ක උපදේශන නිලධාරින් 09ක්ද ප්‍රාදේශීය මට්ටමින් ළමා හා කාන්තා සංවර්ධන ඒකකවල උපදේශන සහකාරවරුන් 220ක්ද ක්‍රියාකාරි වී සිටියි. ඒ අනුව ඉහල ප්‍රමිතියක සේවාවක් ලබා ගැනීමට කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම් සිදුකර ඇත. 2017 දෙසැම්බර් මස දක්වා සේවාලාභීන් 1541 ක් සඳහා සේවා ලබා දී ඇත.

## .19සාධනීය මිතුරු ගමක් '')සුමිතුරු ගම්මාන වැඩසටහන(''

ගැටළුවලින් අවම, පවුල්වලින් සමන්විත ගමක් නිර්මාණය කිරීම සඳහා තිරසාර සංවර්ධන ප්‍රවේශ හඳුනා ගැනීම, සැලසුම් සකස් කිරීම හා විසඳුම් ලබාදීම මෙහි අරමුණ වේ. ගැටළු බහුල ග්‍රාම නිලධාරී වසමක් (ගමක්) තෝරාගෙන වැඩි වශයෙන්ම ගැටළුවලට මුහුණපා ඇති පවුල් කිහිපයක් අධ්‍යයනය කර තෝරාගත් පවුල්වලට අදාළව මානසික, අධ්‍යාත්මික, ආර්ථික, කායික රෝග නිවාරණය හා සෞඛ්‍ය සංවර්ධනය,

අධ්‍යාපන, නිවාස හා මාර්ග හා ඊට අදාළ පහසුකම්, සෞන්දර්ය හා කලාව, නීතිය හා සාමය යන තේමාවන් ඔස්සේ ගැටළු හඳුනාගැනීම, යටිතල පහසුකම් සැපයීම හා විසඳුම් ලබාදීමට අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතුත් සිදු කෙරේ.

මෙම ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 2.0ක ප්‍රතිපාදන වෙන්කර ඇත. 2017 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ව්‍යාපෘති 12ක් සඳහා රු.මිලියන 1.8249 ක මුදල් වියදම් කර පවුල් 5602 කට ප්‍රතිලාභ ලබා දී ඇත.

## 20. ''යොවුන් වසන්තයට අරුත්බර හෙටක් '' වැඩසටහන

අවම පහසුකම් යටතේ ජීවත්වන තරුණ සමාජ කණ්ඩායම් සමඟ අත්දැකීම් හුවමාරු මඟින් ජීවිතය පිළිබඳ ප්‍රායෝගික අවබෝධය ලබාදීම හා තරුණ කණ්ඩායමක් හරහා සමාජයේ අනෙක් තරුණ තරුණියන්ගේ මානසික සහ ආකල්පමය ගැටළු හඳුනාගත හැකි සමාජ විපර්යකාරක නියමු කණ්ඩායමක් නිර්මාණය කිරීම මෙහි අරමුණ වේ.

වයස අවුරුදු 12-20 අතර තරුණ පරපුර සඳහා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරේ. මනෝවිද්‍යාත්මක උපදේශන ක්‍රම හා ප්‍රතිකාර විධි හඳුන්වාදීම, ආගමික සහජීවනය සඳහා සර්ව ආගමික ඉගැන්වීම් පිළිබඳ අවබෝධයක් ලබාදීම, සෞඛ්‍ය පෝෂණය සඳහා මත්ද්‍රව්‍ය නිවාරණය, සමාජරෝග, පිළිකාවන් පිළිබඳ අවබෝධයක් ලබාදීම, නායකත්ව කුසලතා සඳහා නව යොවුන්වියේ දරුවන් සඳහා ජීවන කුසලතා සංවර්ධනය හා අත්දැකීම් හුවමාරුව (වැඩිහිටි නිවාස, ළමා නිවාස, පරිවාස හා බන්ධනාගාර නිරීක්ෂණ චාරිකා) අධ්‍යාපනය හා විනෝදය සඳහා නිර්මාණාත්මක චින්තනය, අධ්‍යාපන ශිල්ප ක්‍රම, මතක වර්ධන උපක්‍රම සහ ගැටළු විසඳීමේ අදාළ ප්‍රායෝගික ක්‍රියාකාරකම්, සමාජ සංවේදීභාවය හා වගවීම සඳහා ශ්‍රමදාන, රසාස්වාදන, දානමය ක්‍රියාකාරකම් හා විවිධ කුසලතා සංවර්ධනය සඳහා තරඟ හා ප්‍රසංග සංවිධානය මේ යටතේ සිදු කෙරේ.

මෙවැනි ව්‍යාපෘති 27ක් සඳහා රු.මිලියන 2.0ක ප්‍රතිපාදන වෙන්කර ඇත. 2017 දී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ව්‍යාපෘති 23ක් තෝරා ගෙන රු.මිලියන 1.998ක මුදලක් වැය තරුණ තරුණියන් 1591 කට ප්‍රතිලාභ ලබා දී ඇත.
ජල ගැලීමේ ස්වාභාවික ආපදාවන්ට ගොදුරු වූ කළුතර, රත්නපුර, මාතර, ගාල්ල හා හම්බන්තොට දිස්ත්‍රික්කවල 3,419 දෙනෙකු සඳහා උපදේශන වැඩසටහන් පැවැත්වීය.

## '' .21දිරිය මංපෙත ''වැඩසටහන

ශ්‍රී ලංකාව පුරා විසිර සිටින ව්‍යවසායක කාන්තාවන් තම ප්‍රදේශයට ආවේණික දේශීය සම්පත් ඇසුරින් නිෂ්පාදන කෙරෙහි යොමු කිරීම හා ආර්ථික සවිබල ගැන්වීමේ ස්වයං රැකියා ව්‍යාපෘති සවිමත් කිරීමේ අරමුණින් ක්‍රියාත්මක වන වැඩසටහනකි.

2017 වසරට රු.මිලියන 5.0ක ප්‍රතිපාදන වෙන් කර ඇත. දිස්ත්‍රික්ක 18ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 19ක කාන්තාවන් 576කට ප්‍රතිලාභ ලබා දී ස්වයංරැකියා ව්‍යාපෘති 20ක් පවත්වා ඇත. රු.මිලියන 4.998ක් යවා ඇත.

### හා ප්‍රමාධ්‍ය .22වාරණ හා පුස්තකාලය පවත්වාගෙන යාම

ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය තුළින් සලසනු ලබන සේවාව පිළිබඳ සමාජය දැනුවත් කිරීම හා විවිධ ක්ෂේත්‍ර ඔස්සේ කාන්තාවගේ දැනුම හා ආකල්ප වර්ධනය/ කාන්තාවන්ට හා ළමුන්ට හිතකාමී මාධ්‍ය සංස්කෘතියකට යොමු කිරීම සඳහා ක්‍රියාවට නැංවෙන වැඩසටහන්, පුස්තකාලය පවත්වාගෙන යාම, ‘කාන්තා සවිය’ සඟරාව සැකසීම හා ප්‍රචාරණ කටයුතුත් මේ යටතේ සිදුකර ඇත. ‘කාන්තා සවිය’ මුද්‍රණය හා පුස්තකාලය නඩත්තු වියදම රු.මිලියන 0.653666 කි.

## 23. ප්‍රගති සමාලෝචනය හා පසුවිපරම

කාන්තා කාර්යාංශය මඟින් ප්‍රාදේශීය මට්ටමින් සිදු කරන සියලු වැඩසටහන් දිස්ත්‍රික් මට්ටමින් මාණ්ඩලික නිලධාරීන්ගේ අධීක්ෂණය මත පසුවිපරම හා ප්‍රගති සමාලෝචනය මින් අපේක්ෂා කෙරේ.

දැනට රත්නපුර, මාතලේ, කුරුණෑගල, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්වල ප්‍රගති රැස්වීම් 4 ක්ද වනිතා සංවර්ධන නිලධාරීන් හා උපදේශන සහකාර නිලධාරීන් සඳහා ව්‍යාපෘති වාර්තා පිළිබඳ රැස්වීම 03ක්ද ක්ෂේත්‍ර නිරීක්ෂණ 6 කද පවත්වා ඇත.

### .24විශේෂ ව්‍යාපෘති

### (විදේශ සංවිධාන හා රාජ්‍ය නොවන සංවිධාන ආධාර ලබාදෙන ව්‍යාපෘති)

### 24.1 ගෘහමූලික කාන්තාවන් සවිබල ගැන්වීම (KOICA Hope Farm Project )

කාන්තා ගෘහමූලික පවුල්වල මූලික අවශ්‍යතා ඉටුකර ගැනීමේ හැකියාව වර්ධනය සඳහා ක්‍රියාත්මක වන වැඩසටහනකි.

කොරියානු ජාත්‍යන්තර සහයෝගිතා ආයතනයේ ස්වෙච්ඡා සේවික කිම් යුන්හා මෙනවිය විසින් කරච්චි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කොනවිල්, කරච්චි සහ අක්කරායන් කුලම් ගම්මානවල තෝරාගත් ගෘහමූලික කාන්තාවන් සඳහා පශු සම්පත් ව්‍යාපෘතියක් ලෙස (කිරිගව පාලනය) ක්‍රියාත්මක කෙරේ. මේ යටතේ තෝරාගත් කාන්තාවන් 20ක් සඳහා ස්වයං අභිප්‍රේරණය, ව්‍යවසායකත්ව සහ තාක්ෂණික පුහුණුව ලබාදීම සහ කිරි ගවදෙනුන් සහ ගවමඩු ලබාදීම සහ එම පවුල්වල සුභසාධන කටයුතු සිදු කර ඇත.

### 24.2 ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් හිංසනය පිළිබඳ ජාතික සැලැස්ම ක්‍රියාත්මක කිරිම (OXFAM ආයතනයේ සහාය)

ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනයට එරෙහිව සමාජ සවිබලකරණය කිරීම උදෙසා ප්‍රජාව බල ගැන්වීම, සංවිධානය කිරීම හා ධාරිතා සංවර්ධනය මේ යටතේ ක්‍රියාවට නැංවේ.

ක්ෂේත්‍රයේ විශේෂඥයින්ගෙන් සැදුම් ලත් කමිටුවක් පත්කිරීම, ප්‍රජා අවධි කණ්ඩායම් (Vigilant Groups) ගොඩ නැංවීම හා බල ගැන්වීම සඳහා ඔවුන්ගේ කාර්යභාරය වගකීම් හා ආචාර ධර්ම ඇතුලත් මාර්ගෝපදේශ අත්පොතක් සැකසීම සිදුකර ඇත. වැඩිම ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් කරගත් හිංසනයන් වාර්තා වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 08ක නියමු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම. අදාල ප්‍රතිඵල මත අනෙකුත් කොට්ඨශවලද ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

### 24.3 ගෘහමූලික කාන්තාවන් සඳහා ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන (UN Women අනුග්‍රහයෙන්)

ව්‍යවසායකත්ව සංවර්ධනය තුළින් ආර්ථික සවිබල ගැන්වීම මෙහිදී සිදු කරයි. ඇඟළුම් හා කෘෂි නිෂ්පාදන කර්මාන්තයේ නියැලෙන ව්‍යවසායක කාන්තාවන් සඳහා අවස්ථාවන් සහ අවශ්‍යතාවයන් හඳුනාගැනීමේ අගයදාම සමීක්ෂණයක් පුත්තලම හා මාතර දිස්ත්‍රික්ක පදනම් කර සිදු කර ඇත. එමෙන්ම අගයදාම විශ්ලේෂණයේ ප්‍රතිඵල මත, සොයා ගැනීම්, යෝජිත මැදිහත්වීම් පාර්ශවකරුවන් 82ක් හා සාකච්ඡා කිරීමට වැඩමුළු 02ක් පුත්තලම හා මාතර දිස්ත්‍රික්කයන්හි පවත්වා ඇත. වැඩමුළුවල නිරීක්ෂණ පාදක කර අවසන් වාර්තාව හා ව්‍යාපෘති සැලැස්ම සැකසීම හා ව්‍යවසායකත්ව සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නියමිතයි.

### 24.4 නව වෙළඳපොළ අවස්ථා හඳුනා ගැනීම (ඩේවිඩ් පීරිස් ආයතනය හා ඒකාබද්ධව)

කාන්තා කාර්යාංශයේ ලියාපදිංචි කාන්තා කාර්ය සමාජ සාමාජිකාවන් සවිබල ගැන්වීම සඳහා අත්කම්, ඇඟළුම් හා ආහාර නිෂ්පාදනයේ නියුතු කාන්තාවන්ගේ නිෂ්පාදනවල ගුණාත්මකභාවය, ප්‍රමිතිකරණය, නව තාක්ෂණය සහ දේශීය හා විදේශීය වෙළඳපොළ අවස්ථා ලබාදීම මෙහි අරමුණ වේ.

දිස්ත්‍රික්ක 05ක ආහාර නිෂ්පාදනයේ නියුතු කාන්තාවන් 85ක් සඳහා වැඩමුළුවක් පවත්වන ලද අතර කාන්තා කාර්ය සංවිධාන සාමාජිකාවන් 22ක් සඳහා ආහාර නිෂ්පාදන වෙළඳපොළ අවස්ථා ලබා දී ඇත. ව්‍යවසායක කාන්තාවන් තාක්ෂණික දැනුමින් පරිපූර්ණ කිරීම හා එතුළින් ඔවුන්ගේ ආර්ථිකය ශක්තිමත් කිරීමේ

අරමුණින් ඩේවිඩ් පීරිස් ආයතනය හා ශ්‍රී ලංකා කාන්තා කාර්යංශය එක්ව බස්නාහිර පළාත් කාන්තාවන් 25කු සඳහා ත්‍රිවීල් තාක්ෂණික පුහුණු පාඨමාලාව බණ්ඩාරගම ඩේවිඩ් පීරිස් ශ්‍රවණාගාරයේදී සිදු කරන ලදී.

## 24.5 ව්‍යවසායකත්ව පුහුණු වැඩසටහන (යුනිලීවර් ආයතනය හා ඒකාබද්ධ)

යුනිලීවර් නිෂ්පාදන අළෙවිය සඳහා නියෝජිතයින් ලෙස බඳවා ගැනීම තුළින් කාන්තා කාර්ය සංවිධාන සාමාජිකාවන්ගේ ආදායම් මට්ටම ඉහළ නැංවීම වැඩසටහනේ අරමුණයි.

වනිතා සංවර්ධන නිලධාරීන් දැනුවත් කිරීම හා එක් දිස්ත්‍රික්කයකින් ව්‍යවසායක කාන්තාවන් 100ක් තෝරා ගෙන අළෙවි නියෝජිතයන් ලෙස ඔවුන් පුහුණු කර ඇත. කොළඹ, ගම්පහ, මහනුවර, කුරුණෑගල හා ගාල්ල යන දිස්ත්‍රික්කවල ව්‍යවසායක කාන්තාවන් 762ක් පුහුණු කර ඇත.

## 24.6 ආපදා තත්ත්ව මත අවතැන් කාන්තාවන් පදනම් කරගත් පශ්චාත් ආපදා සහන සේවා සැලසීමේ .වැඩසටහන ''ලිය සහන''

ආපදාවන්ට ගොදුරුව අවතැන් වූ කාන්තා ව්‍යවසායකයින් පවත්වාගෙන ගිය ස්වයං රැකියා හා ආදායම් උත්පාදන මාර්ග නැවත නඟා සිටුවීම හා ඔවුන් සවිමත් පිරිසක් බවට පත් කිරීම මින් අපේක්ෂිතයි.

හදිසි ආපදා තත්ත්වය මත අවතැන් වූ කළුතර, රත්නපුරය, මාතර, ගාල්ල හා හම්බන්තොට යන දිස්ත්‍රික්කයන්හි කාන්තාවන්ගේ තොරතුරු ලබා ගැනීම, සිව් පුද්ගල කමිටුවක් පත් කොට අදාළ ක්‍රමවේද හා මාර්ගෝපදේශයන් සැකසීම, නිර්දේශිත නාම ලේඛන සඳහා ඇස්තමේන්තු ලබා ගැනීම, අනුමත කිරීම හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත ප්‍රතිපාදන යැවීම, ස්වයං රැකියා ප්‍රදාන ලබාදීම, වැඩසටහන ක්‍රියාත්මක කිරීම පිළිබඳ අධීක්ෂණය හා පසුවිපරම් සිදු කිරීම වැඩසටහනේ ක්‍රියාදාමයයි.

**මූල්‍ය හා භෞතික ප්‍රගතිය**

| දිස්ත්‍රික්කය | බැදිම් මඟින් ප්‍රතිපාදන යවා ඇති නිර්දේශිත මුදල (රුපියල්) | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|
| කළුතර | 16,725,078.00 | 642 |
| රත්නපුර | 14,876,930.00 | 575 |

| | | |
|---|---|---|
| මාතර | 19,253,791.00 | 578 |
| ගාල්ල | 5,572,620.00 | 261 |
| හම්බන්තොට | 3,615,275.00 | 133 |
| මුළු එකතුව | 60,043,694.00 | 2,189 |

# 12.ජාතික කාන්තා කමිටුව


## දැක්ම

**සමානාත්මතාවය තහවුරු වූ, හිංසනයෙන් තොර, කාන්තාවන්ට හිතකර ශ්‍රී ලාංකීය සමාජයක්**

## මෙහෙවර

**ශ්‍රී ලාංකික කාන්තාවන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කර ප්‍රවර්ධනය කිරීම, සමානාත්මතාවය තහවුරු කිරීම හා පූර්ණ සංවර්ධනයට ඉවහල් වන ප්‍රතිපත්ති හා නීති පද්ධතීන් සකස් කිරීම සඳහා නිර්දේශ හා සහාය ලබා දීම සහ නිසි ලෙස ක්‍රියාත්මක කිරීමට පෙළඹවීම හා අධීක්ෂණය කර ඇගයීම.**

## සංවිධාන ව්‍යුහය



## ප්‍රධාන කාර්යභාරය

- ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත ඇති වන වෙනස්කම් පිළිබඳ වූ පැමිණිලි පිළිගැනීම , සම්බන්ධ ,බලධාරීන් ,සංනිරීක්ෂණය හා ඒවා අදාල පාලක ීත තැනැත්තන් හෝ මණ්ඩල වෙත අවශ්‍ය ක්‍රියාමාර්ග සඳහා යොමු කිරීම
- අමාත්‍ය මණ්ඩලය මගින් අනුමත කාන්තා ප්‍රඥප්තියේ ඇතුළත් විධිවිධාන කඩ කිරීම සම්බන්ධයෙන් වන පැමිණිලිනෛතික ආධාර හෝ සමථ සේවා සඳහා රජයේ ,සහන , .හෝ රජයේ නොවන සංවිධාන වෙත යොමු කිරීම
- එම ක්‍රියාමාර්ග සමීක්ෂණයඅදාල , පාලන බලධාරීන්ගෙන් වාර්ෂික ප්‍රගති වාර්තා ලබාගැනීම සහ එම වාර්තා රට තුළ ප්‍රචලිත කිරීම ආදියට අවස්ථා සැලසීම.
- ප්‍රඥප්තියේ අන්තර්ගතව ඇති පරිදිකාන්තා අයිතිවාසිකම් සහ වගකී ,ම් විෂයෙහි නෛතික සහ සංවර්ධන ප්‍රතිපත්තිවලින් ඇතිවන බලපෑම ඇගයීම.
- අදාළ පර්යේෂණදිරිගැන්වීම තුළින් ප්‍ර ඥප්තියේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට උපකාරී වීම සහ ඒ පර්යේෂණ පදනම් කර ගත් ප්‍රතිසංශෝධන සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම.
- කාන්තාවන්ගේ තත්ත්වය පිළිබඳව විෂයභාර අමාත්‍යවරයාඇමතිනිය විසින් කමිටුවේ / අවධානයට යොමු කෙරෙන කරුණු පිළිබඳව හෝ උචිතයැයි කමිටුව සිතන කටයුතු කිරීමට උපදෙස් දීම
- ස්ත්‍රී පුරුෂ සමාජභාවීය පැමිණිලි මධ්‍යස්ථානයේ කාර්යභාරයේ ප්‍රසාරණය වීමක් වශයෙන් 2014 වර්ෂයේ ආරම්භ කරන ලද කාන්තා උපකාරක දුරකථන සේවය දැක්විය හැකි 1938 බෙන පැමිණිලිඅතර ලැ සහනනෛතික ආධාර හෝ සමථ සේවා සඳහා රජයේ හෝ , .රජයේ නොවන සංවිධාන වෙත යොමු කිරීම
- කාන්තා කටයුතු අමාත්‍යාංශයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම යටතේ පැවරී ඇති ව්‍යාපෘතීන් හා ක්‍රියාකාරකම් දියත් කිරීම

# ක්‍රියාත්මක කළ ප්‍රධාන සංවර්ධන වැඩසටහන් - 2017

## 1. ප්‍රතිපත්තිමය වැඩසටහන්

1.1.1 ජාතික කාන්තා කමිටුව විසින් දරණ ගෘහස් 34 අංක 2005ථ ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීමේ පනතනීති , ක්ෂේත්‍රයේ විද්වත් මණ්ඩලයක් විසින් නැවත සංශෝධනය කිරීමේ කටයුතු අවසන් කරන ලදී . මෙම පනත කි්‍රයාත්මක කිරීමේදී ලැබී ඇති අත්දැකීම් හා කරන ලද පර්යේෂණ මෙම සංශෝධන කිරීම සඳහා උපයෝගී කර ගන්නා ලදී .

1.1.2 2005 අංක 34 දරණ ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීමේ පනත ක්‍රියාත්මක කිරීම සඳහා සකස් කරන ලද ක්‍රියාකාරී සැලැස්ම විද්වත් මණ්ඩලයක් මඟින් යාවත්කාලීන කරන ලදී. පසුගිය වසර 10 තුළ පනත ක්‍රියාත්මක කිරීමේදී පැහැදිලි වූ ගැටළු ආශ්‍රිතව මෙම යාවත්කාලීන කිරීම සිදු කරන ලදී.

1.1.3 එම යාවත්කාලීන කරන ලද ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් පරිදි ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත මෙම අමාත්‍යාංශයේ නිලධාරීන් දැනුවත් කිරීම සඳහා ගම්පහ, රත්නපුරය සහ මොණරාගල යන දිස්ත්‍රික්කයන්හි වැඩසටහන් පවත්වනු ලැබේ.

ගෘහස්ථ හිංසනය වැළැක්වීමේ පනත පිළිබඳ පොලිස් නිලධාරීන් දැනුවත් කිරීම උදෙසා පුහුණු මොඩියුලයක් සකස් කරමින් පවතී.

ඒ අනුව ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සංකල්පය ආශ්‍රිතව ගෘහස්ථ හිංසන පනත පිළිබඳවත්, එහි නෛතික ප්‍රතිපාදන පිළිබඳවත් පොලිසියේ කාර්යභාරය යන කරුණු පාදක කර මෙම මොඩියුලය සකස් කරනු ඇත.

### 1.2 රජයේ පාසැල් විෂය නිර්දේශිත ග්‍රන්ථ තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ විශ්ලේෂණය

ජාතික කාන්තා කමිටුවේ සාමාජිකයන් විසින් මෙම විශ්ලේෂණය සිදු කර අදාළ වාර්තාව ගරු අධ්‍යාපන අමාත්‍යතුමාට ඉදිරිපත් කිරීමෙන් පසු, එතුමාගේ උපදෙස් මත ජාතික අධ්‍යාපන ආයතනය හා ග්‍රන්ථ ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සමග සාකච්ඡා කර එම විශ්ලේෂණයේ අඩංගු නිර්දේශ පෙළ පොත් සකස් කිරීමේදී භාවිතා කරන ලෙසට කරුණු ඉදිරිපත් කරන ලදී. තවද, ජාතික අධ්‍යාපන ආයතනයේ පෙළ පොත් සකස් කරන නිලධාරීන් සඳහා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳව දැනුවත් කිරීම් සිදුකිරීමට සැලසුම් කොට ඇත.

## 1.3 උප්පැන්න සහතිකය සංශෝධනය කිරීම

ජාතික කාන්තා කමිටුව, නීත්‍යානුකූලව විවාහ වී නොමැති මව්පියන්ට දරුවන් පාසලට ඇතුළත් කර ගැනීමට අපහසු වීම, දූෂණයට ලක්වූ කාන්තාවන්ට දරු උපත් ලියාපදිංචි කිරීමේදී ගැටළුවලට මුහුණ පෑමට සිදු වීම හා ඒ හේතුවෙන් දරුවන්ට හිමිවිය යුතු සමාජයීය හා නීතිමය රැකවරණය හා ආරක්ෂාව නොලැබීම හා ස්වාමියා නොමැති අවිවාහක කාන්තාවන් සමාජයේ හෙළා දැකීමට ලක් නොවී ඔවුන්ගේ සමානාත්මතාවය තහවුරු කිරීම සඳහා ද "දෙමාපියන් විවාහකද?" යන තීරුව උප්පැන්න සහතිකයෙන් ඉවත් කිරීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව සඳහා එකඟතාවය ලබා ගැනීමට පාර්ලිමේන්තුවේ ස්ත්‍රීපුරුෂ සමාජභාවය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලදී. අදාල අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සමඟ මේ පිළිබඳව සාකච්ඡා කරන ලදී. තවද එම කාරක සභාවේ උපදෙස් පරිදි එම යෝජනාවට මහජනතාවගේ උපදෙස් ලබා ගැනීම සඳහා පහත සඳහන් වැඩසටහන් ජාතික කාන්තා කමිටුව විසින් දියත් කරන ලදී.

1. ගුවන් විදුලි සංස්ථාවේ ස්වදේශීය සේවයේ වැඩසටහනක්
2. රූපවාහිනී සංස්ථාවේ සාකච්ඡාවක්
3. Twitter හා Facebook සමාජ මාධ්‍ය හරහා අදහස් ලබා ගැනීම
4. කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ වෙබ් පිටුවේ විස්තර පළකිරීම

මෙම වැඩසටහන් තුළින් විද්‍යාමාන වූයේ උප්පැන්න සහතිකයේ 6 වන තීරුව වන "දෙමාපියන් විවාහකද?" යන තීරුව ඉවත් කිරීම පිළිබඳව වැඩි දෙනෙකුගේ එකඟත්වය ඇති බවය. ඒ අනුව උප්පැන්න සහතිකයේ 6

වන තීරුව ඉවත් කිරීම පිළිබඳව සිය අදහස ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීමට නියමිතය.

### 1.4 බන්ධනාගාර කාන්තා රැඳවියන්ගේ අයිතිවාසිකම් හා සුභසාධනය තහවුරු කිරීම.

වැලිකඩ බන්ධනාගාරයේ කරන ලද නිරීක්ෂණයකින් පැහැදිලි වූයේ කාන්තාවන් ප්‍රධාන වශයෙන් බන්ධනාගාරගත වී ඇත්තේ හෙරොයින් සම්බන්ධව මුදල් වංචා, ගණිකා වෘත්තිය, සොරකම හා මිනීමැරුම යන හේතූන් මත බවයි. එහි රැඳවියන් 477 ක් පමණ සිටින අතර, වයස අවුරුදු 5ට අඩු දරුවන් 16ක් පමණ සිටි. ඔවුන්ට ඇති පහසුකම් ඉතා අල්ප වේ.

- ඇපය ගෙවා ගැනීමට නොහැකි වූ කාන්තාවන් සිරගත වීම/ රිමාන්ඩ් බාරයේ සිටීම
- නියම ලෙස සාක්ෂි ඉදිරිපත් කිරීමට නොහැකි වීම හේතුවෙන් සිරගත වීමට සිදුවීම
- අධිකරණය, බන්ධනාගාරය සමඟ සම්බන්ධතාවයක් නොමැති වීම.

නඩු විසදීම සඳහා ඉතා විශාල - කාලයක් ප්‍රමාද වීම

- අඩු ආදායම්ලාභී චූදිතයන් සඳහා නීති ආධාර ලබා ගැනීමට නොහැකිවීම
- එසේම ඇපැල් උසාවියට කරුණු ඉදිරිපත් කිරීමට අවශ්‍ය පසුබිමක් නොමැති වීම

ඉදිරියේදී මෙකී ගැටළුවලට යම් සාධනීය විසඳුම් ලබා දීමට හැකි පියවර යෝජනා කිරීමට නියමිතය.

### 1.5 ශ්‍රී ලංකාවේ අවිධිමත් අංශයේ රැකියාවන්හි නියුතු කාන්තාවන්ගේ සමාජ ආරක්ෂණ ක්‍රමවේද පිළිබඳව සිදු කෙරෙන පර්යේෂණය

ශ්‍රී ලංකාවේ විධිමත් අංශයේ සහ අවිධිමත් අංශයේ සේවයේ නියුතු කාන්තාවන් වෙනුවෙන් වර්තමානයේ පවතින සමාජ ආරක්ෂණ ක්‍රමවේදයන් සැසඳීම සහ අවිධිමත් අංශය සඳහා කාන්තාවන්ට සමාජ ආරක්ෂණ ප්‍රතිපත්ති සකස් කිරීමට අවශ්‍ය නිර්දේශ සැපයීම යන අරමුණු මූලික කර ගනිමින් මෙම පර්යේෂණය සිදු කරනු ලබයි.

මෙම පර්යේෂණය සිදු කිරීම සඳහා දත්ත ලබා ගැනීමට ශ්‍රී ලංකාවේ පළාත් 9ම නියෝජනය වන පරිදි දිස්ත්‍රික්ක 9 ක් තෝරා ගන්නා ලදී. මෙහිදී ඒ ඒ පළාතට අයත් දිස්ත්‍රික්ක අතරින් අවිධිමත් අංශයට ඉහළම ප්‍රතිශතයකින් දායක වන දිස්ත්‍රික්කය පර්යේෂණය සඳහා තෝරා ගැණිනි. පර්යේෂණයේ දත්ත රැස්කිරීමේ කටයුතු හා දත්ත විශ්ලේෂණය අවසන් කර ඇත.

### 1.6 ජාතික කාන්තා කමිටු මාසික රැස්වීම

මෙය ජාතික කාන්තා කමිටු කාර්යභාරය පිරික්සීම සඳහා මාසිකව පවත්වනු ලබන කමිටු රැස්වීමයි. මෙහි ප්‍රධාන අරමුණ වන්නේ කාන්තාවන්ගේ අභිවෘද්ධිය සඳහා නීති, ප්‍රතිපත්ති හා වැඩසටහන් තුළින් පවතින විෂමතාවයන් අවම කිරීම හා සමානාත්මතාවය තහවුරු කිරීමයි.ඒ සඳහා අවශ්‍ය සාකච්ඡාවන් ජාතික කාන්තා කමිටු සාමාජිකයන්ගේ සහභාගීත්වයෙන් මාසිකව සිදු කරයි.2017 වර්ෂයේ සාකච්ඡාවන් 11ක් පවත්වා ඇත.

## 2. ස්ත්‍රී පුරුෂ සමාජභාවීය හිංසනය වැළැක්වීමේ වැඩසටහන්

### 2.1 මණ්ඩප සාකච්ඡා

### 2.1.1 කාන්තාවන්ට එරෙහි සියළු ආකාරයේ වෙනස් කොට සැලකීම තුරන් කිරීමේ ප්‍රඥප්තිය (CEDAW) හා සිඩෝ නිරීක්ෂණ පිළිබඳ නිලධාරීන් දැනුවත් කිරීමේ සංසද සාකච්ඡාව

කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස් කොට සැලකීම් දුරුකිරීමේ (CEDAW) ප්‍රඥප්තිය ආශ්‍රිතව හා නිරීක්ෂණ පිළිබද රාජ්‍ය අංශයේ හා රාජ්‍ය නොවන අංශවල සහභාගීත්වයෙන් මෙම සාකච්ඡාව පවත්වන ලදී.



ලේකම්තුමිය විසින් කරුණු දක්වමින්



සංසද සාකච්ඡාවට සහභාගීවූවන් සවන් දෙමින්

### 2.1.2 වැඩිහිටි කාන්තාවන්ගේ සුභසාධනය පිළිබඳ වන සංසද සාකච්ඡාව

%56 වසරේ ජන හා නිවාස සංගණන දත්ත අනුව මුළු ජනගහනයෙන් 2012ක් වන වැඩිහිටි කාන්තාවන්ගේ වර්තමාන තත්ත්වයඒ පිළිබඳව , රාජ්‍ය හා සිවිල් සමාජවල කාර්යභාරයවැඩිහිටි කාන්තා ගැටළු හා , ඔවුන්ගේ ඉදිරි කටයුතු සැලසුම් කිරීම පිළිබඳ අවධානය යොමු කිරීමේ අරමුණ පෙරදැරි කොටගෙන රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවල නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් 2017.07.04 ,දින මෙම සංසද සාකච්ඡාව පවත්වන ලදී.

මෙහිදීවැඩ ,ිහිටි කාන්තාවන්ගේ වර්තමාන තත්ත්වය , සම්බන්ධයෙන්වියපත් බව හා මානසික සෞඛ්‍ය , සංස්කෘතිය හා සමාජ වටපිටාව හා වියපත් - වියපත් කාන්තාව , ගැටළුවියපත් කාන්තාව මුහුණපාන සෞඛ්‍ය .ය පිළිබඳ කරුණු ඉදිරිපත් කරන ලදීකාන්තා සුභසාධනය පිළිබඳ රජයේ කාර්යභාරය ආදි

### 2.1.3පරිසරය සුරැකීම සඳහා කාන්තාවන් බලගැන්වීම පිළිබඳ පවත්වන ලද මණ්ඩප සාකච්ඡාව

කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ ජාතික කාන්තා කමිටුව විසින් පරිසරය සුරැකීම සඳහා කාන්තාවන් බලගැන්වීම පිළිබඳව සාකච්ඡාවක් 9.00.ව.දින පෙ වන 26 ඔක්තෝබර් 2017සිට ප 2.30.ව.දක්වා බත්තරමුල් සෙත්සිරිපාය .අදියරේ පවත්වන ලදී 2

වර්තමාන ශ්‍රී ලංකාව තුළ පවතින උග්‍රතම පාරිසරික ගැටළු වන කසළ කළමණාකරණය ,ඩෙංගු උවදුර, ආපදා කළමණාකරණය සහ ජල කළමණාකරණය යන මාතෘකා තේමාකොට ගෙන මෙම සාකච්ඡාව %52 තව මුළු ජනගහනයෙන්මෙම මාතෘකා ආශ්‍රි,පවත්වනු ලැබූ අතරපමණ ප්‍රතිශතයක් උසුලන ශ්‍රී ලාංකේය කාන්තාවන්ට දායක විය හැකි ආකාරය විමසා බැලීම මෙම සාකච්ඡාවේ ප්‍රධානතම අරමුණ විය.

### 2.2 ප්‍රජනන සෞඛ්‍ය වැඩසටහන්

ප්‍රජනන සෞඛ්‍ය අධ්‍යාපනය සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කිරීම උදෙසා පවුල් සෞඛ්‍ය කාර්යාංශය හා ජාතික කාන්තා කමිටුව ඒකාබද්ධව මොඩියුලයක් සකස් කර ඇත. එම මොඩියුලය උපයෝගී කර ගනිමින් වනිතා සංවර්ධන නිලධාරීන් හා උපදේශන නිලධාරීන් පුහුණු කිරීම මඟින් ග්‍රාමීය මට්ටමේ ජනතාව දැනුවත් කිරීම මෙම වැඩසටහන මඟින් සිදු කරයි.

මෙම පුහුණු වැඩමුළුවේදී නව යොවුන්විය, ලිංගිකත්වය හා ප්‍රජනන සෞඛ්‍යය, ශරීරයේ අංග හඳුනා ගැනීම, අඩු වයස් ගැබ් ගැනීම් හා එහි ප්‍රතිවිපාකයන්, පවුල් සැලසුම්, සෞඛ්‍ය සම්පන්න දරුවකු බිහිකිරීම හා මේ සඳහා පවතින සේවාවන් යන කරුණු ඔස්සේ නිලධාරීන් දැනුවත් කිරීම සිදු කරන අතර, ඔවුන්ගේ රාජකාරිවලදී පැන නගින ගැටළු විසඳා ගන්නා ආකාරය පිළිබඳව ද දැනුවත් කිරීම සිදු කරයි. මෙම වැඩසටහන බස්නාහිර පළාත, උතුරුමැද පළාත හා මධ්‍යම පළාතේ දැනට සිදු කර ඇත.

## 2.3 සේවා ස්ථානවල හිංසන වැළැක්වීමේ වැඩසටහන්

පෞද්ගලික අංශවල රැකියාවන්හි නියුතු කාන්තාවන්ට තම සේවා ස්ථානයන්හිදී සිදු වන හිංසනයන් අවම කිරීම සඳහා කාන්තාවකට පවතින අභියෝග, හිංසනය යනු කුමක්ද, අන්තර්ජාලය තුළින් ඇති වන කාන්තා හා ළමා හිංසනය පිළිබඳව, පොදු ප්‍රවාහනයේදී කාන්තාව හිංසනයට පත්වන ආකාරය, හිංසනයට පත් වූ අවස්ථාවක ගත යුතු ක්‍රියාමාර්ග හා හිංසනයන්ගෙන් ආරක්ෂා විය යුතු ආකාරය මෙන්ම කාන්තා හිංසන පිළිබඳව ක්‍රියා කරන ආයතන පිළිබඳව දැනුවත් කිරීමද මෙම වැඩසටහන් මාලාව තුළදී සිදු කරනු ලබයි. 2017 වසරේ ආයෝජන ප්‍රවර්ධන කලාපයන්හි වැඩසටහන් 09 ක් පවත්වා ඇත.




පොල්ගහවෙල සිදු කරන ලද සේවා ස්ථානවල හිංසන වැළැක්වීමේ වැඩමුළුව

## 2.4 කාන්තාවන්ට එරෙහි හිංසනය වැළැක්වීම පිළිබඳ අන්තර්ජාතික දින 16 වැඩසටහන

කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ හිංසන වැළැක්වීම සඳහා වන එක්සත් ජාතීන්ගේ දින 16 වැඩසටහනට සමගාමීව කාන්තා හිංසනය අවම කිරීමේ වැඩසටහන් නොවැම්බර් 25 සිට දෙසැම්බර් 10 දක්වා පැවැත්වේ. ඒ අනුව දින 16 වැඩසටහන යටතේ හිංසනයට පත් කාන්තාවන්ට නීතිමය සහන පිළිබඳව දැනුවත් කිරීම, පැමිණිලි මධ්‍යස්ථානය හා 1938 කාන්තා උපකාරක දුරකථන සේවාව පිළිබඳ ප්‍රජාව දැනුවත්

කිරීම මෙන්ම ජනතාවට විවිධ වූ සේවාවන් සැපයීමේ අරමුණින් පුත්තලම හා අනුරාධපුර දිස්ත්‍රික්කයේ ජංගම සේවාවන් 02ක් පවත්වන ලදී.

# 03.ස්ත්‍රී පුරුෂ සමාජභාවීය මූල්‍ය ප්‍රවාහකරණ වැඩසටහන්

## 3.1. ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සංකල්පය පිළිබඳ තීරණ ගන්නා මට්ටම්වල පළාත් සභා නිලධාරීන් පුහුණු කිරීම

ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සංකල්පය මත පදනම්ව පළාත් සභා නිලධාරීන්ගේ අවධානය යොමු විය යුතු ක්ෂේත්‍රයන් පිළිබඳ අවධානය යොමු කිරීම, පළාත් සභා සමඟ ඉදිරි සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ආකාරය නිවැරදිව සැලසුම් කිරීම, පළාත් කාන්තා කටයුතු අමාත්‍යාංශ සමඟ අන්තර් සම්බන්ධතා වර්ධනය කර ගැනීමේ අරමුණින් මෙම වැඩසටහන පැවැත්වීය. පළාත් සභා 08 ක පළාත් සභාවන්හි සැලසුම්කරණයේ නිරත නිලධාරීන් 50 දෙනෙකුගේ සහභාගීත්වයෙන් ජූලි මස 31 හා අගෝස්තු මස 01 යන දෙදින මෙම වැඩසටහන හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ ආයතනයේදී පවත්වන ලදී.





නිලධාරී දැනුවත් කිරීමේ වැඩමුළු

## 3.2. දූ ... සම්බන්ධ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මූලප්‍ර ... වැඩසටහන්

මෙම වැඩසටහන යටතේ ශ්‍රී ලංකා රජය විසින් එක්සත් ජාතීන්ගේ සංවිධානය සමඟ එළඹ ඇති 1325 ගිවිසුම සම්බන්ධයෙන් ක්‍රියා කරන අතර සාමය, ආරක්ෂාව හා සංවර්ධනය යන කටයුතුවලදී ස්ත්‍රී පුරුෂ සමාජභාවිය මූල ප්‍රවාහකරණය කිරීම මෙහි මූලික අරමුණ වේ. මේ සම්බන්ධයෙන් ක්‍රියා කරන ජාතික ඒකාබද්ධතා හා ප්‍රතිසංධාන අමාත්‍යාංශය, බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීමේ, හිංදු ආගමික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය හා ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශයන්හි ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් 03ක් පවත්වා ඇත. මෙම අමාත්‍යාංශයන්හි වැඩසටහන්වල ස්ත්‍රී පුරුෂ සමාජභාවය අන්තර්ගත වී ඇති ආකාරය පිළිබව විශ්ලේෂණය කරන ලදී.

## 3.3. ස්ත්‍රී පුරුෂ සමාජභාවීය හිංසන දත්ත පද්ධතිය

ස්ත්‍රී පුරුෂ සමාජභාවීය හිංසන දත්ත පද්ධතිය සඳහා දත්ත ලබා දීම ජාතික කාන්තා කමිටුවේ 1938 කාන්තා උපකාරක දුරකථන සේවය හා පැමිණිලි මධ්‍යස්ථානය මඟින් අඛණ්ඩව සිදු වේ. 2017 අප්‍රේල් මාසයේ දී 1938 හා පැමිණිලි මධ්‍යස්ථාන නිලධාරීන්ට දත්ත ඍජුවම පරිගණක පද්ධතියට ලබා දීම සඳහා පුහුණුවක් ලබා දී ඇත. තවද දත්ත පද්ධතිය වෙත දත්ත ලබා ගැනීම සඳහා කොළඹ දිස්ත්‍රික්කයේ සියළුම අමාත්‍යාංශ නිලධාරින්, පොලිස් නිලධාරීන් හා දත්ත පද්ධතියට සම්බන්ධ නිලධාරීන් පුහුණු කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී. ඒ අනුව 2017 ජූලි මාසයේ සිට කොළඹ දිස්ත්‍රික්කයේ දත්ත, දත්ත පද්ධතියට ඇතුළත් කිරීම සිදු වේ.

# .04දේශපාලනයේ කාන්තා නියෝජනය ඉහළ නැංවීම උදෙසා ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්

## 4.1. දේශපාලනයේ කාන්තාවන් සවිබල ගැන්වීමේ සහතිකපත් පාඨමාලා පැවැත්වීම

කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස්කම් පිටුදැකීමේ සම්මුතිය හා ශ්‍රී ලංකා කාන්තා ප්‍රඥප්තිය අනුව ශ්‍රී ලංකාවේ කාන්තාවන් දේශපාලනමය වශයෙන් සවිබල ගැන්වීමේ අවශ්‍යතාවය මත ජාතික කාන්තා කමිටුව විසින් වසර ගණනාවක සිට දේශපාලනයේ කාන්තාවන් බලගැන්වීමේ ඩිප්ලෝමා/ සහතිකපත්‍ර පාඨමාලා පවත්වා ඇත.

එමෙන්ම 2017 වර්ෂයේදී ද පේරාදෙණිය විශ්වවිද්‍යාලය හා ඒකාබද්ධව සිංහල මාධ්‍ය සහතිකපත් පාඨමාලාවක් ආරම්භ කරන ලදී.

.



**සහතික පත් පාඨමාලාව සාර්ථකව නිම කරන ලද කාන්තාවන්, සම්පත් දායකයින්**

## 4.2 දේශපාලන ක්ෂේත්‍රයේ නිරතවන්නා වූ හා අවතීර්ණ වීමට කැමති කාන්තාවන්ගේ සන්නිවේදන කුසලතා වර්ධනය කිරීමේ පුහුණු වැඩමුළුව

මැතිවරණ සඳහා ඉදිරිපත් වන්නා වූ කාන්තා නියෝජිතවරියන් ඉන් ජය ගෙන දේශපාලන ක්ෂේත්‍රයට පිවිසීමටත්, ප්‍රතිපත්ති සම්පාදනයේදී ඵලදායී හා සක්‍රීය දායකත්වයක් ලබා ගැනීම සඳහාත් කාන්තා නායිකාවන්ගේ සන්නිවේදන කුසලතා වර්ධනය කිරීම තුළින් දේශපාලන ක්ෂේත්‍රයට පිවිසෙන කාන්තාවන්ගේ ගුණාත්මක තත්ත්වය වර්ධනය කිරීමත් මෙම වැඩසටහනේ මූලික අරමුණු වේ.

ඒ අනුව සන්නිවේදන කුසලතා ප්‍රවර්ධනය සහ අවශ්‍ය වන ප්‍රායෝගික හා න්‍යායික දැනුම ලබා දීම සඳහා වැඩසටහන් 04ක් පවත්වන ලදී.මෙම වැඩසටහන් කුරුණෑගල,නුවර එළිය ,බදුල්ල දිස්ත්‍රික්කයන්හි ප්‍රධාන දේශපාලන පක්ෂවල පළාත් පාලන ආයතන අපේක්ෂිකාවන්ගේ සහභාගීත්වයෙන් IFES ආයතනයේ සම්පත් දායකත්වයෙන් පවත්වන ලදී.

### 4.3 කාන්තා දේශපාලන සහභාගීත්වය පුළුල් කිරීම සඳහා වනිතා සංවර්ධන නිලධාරීන් පුහුණු කිරීමේ වැඩසටහන

කාන්තා දේශපාලන සහභාගීත්වය පුළුල් කිරීම සඳහා ඡන්දදායකයින් දැනුවත් කිරීම හා ඡන්දදායකයෙකු ලෙස ඡන්දය දීමේ වැදගත්කම පිළිබඳව හා නිවැරදි ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳව සංවේදී ප්‍රතිපත්තිගරුක ජනතා නියෝජිතයෙකු තෝරාපත් කරගන්නේ කෙසේද යන්න පිළිබඳව ජනතාව දැනුවත් කිරීමේ අරමුණින් වනිතා සංවර්ධන නිලධාරීන් පුහුණු කිරීම මෙම වැඩසටහන මඟින් සිදු කරයි. මේ වනවිට වැඩසටහන් 02ක් දකුණු පළාතේ ,උතුරුමැදපළාතේ හා බදුල්ල දිස්ත්‍රික්කයේ වනිතා සංවර්ධන නිලධාරීනගේ සහභාගීත්වයෙන් පවත්වා ඇත. තවද කුරුණෑගල, පුත්තලම හා අනුරාධපුර දිස්ත්‍රික්කයන්හි ඡන්ද දායකයන් දැනුවත් කිරීමේ වැඩසටහන් තුනක් බලමණ්ඩල කාන්තාවන්ගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී.


## 05ජාතික කාන්තා කමිටුව සිදුකරන ලද පර්යේෂණවල නිර්දේශ ක්‍රියාත්මක කිරීම

### 5.1. සයිබර් අපරාධ පිළිබඳ පර්යේෂණයේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම

මේ වන විට පවතින සයිබර් අපරාධ සම්බන්ධ නීතිය සංශෝධනය කිරීම හා නව නීති හඳුන්වාදීම සඳහාත්, සයිබර් අපරාධ සම්බන්ධව කටයුතු කරන ආයතන සම්බන්ධීකරණය කිරීම හා මෙම පවතින නීතිය පිළිබඳ සමාජය දැනුවත් කිරීම මෙහි අරමුණයි.

එහිදී සයිබර් අපරාධ සම්බන්ධව කටයුතු කරන ආයතනවල සහභාගීත්වයෙන් සාකච්ඡා පවත්වා දත්ත එක් රැස් කිරීම සඳහා විධිමත් ආකෘතියක් සකස් කර දත්ත රැස් කර, මොඩියුලයක් සකසා සයිබර් අපරාධ සම්බන්ධ කටයුතු කරන පොලිස් නිලධාරීන් හට පුහුණුවක් ලබා දීමට අපේක්ෂාකරයි. ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ හා ජාතික කාන්තා කමිටුවේ නිලධාරීන් සඳහාද දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.





සාකච්ඡාවට සහභාගී වූ නිලධාරීන් කරුණු දක්වමින්

### 5.2. වතුකරයේ පවතින කාන්තාවන්ට එරෙහි හිංසනය පිළිබඳ පර්යේෂණයේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම

බදුල්ල දිස්ත්‍රික්කය මූලික කරගෙන සිදු කරන ලද මෙම පර්යේෂණය මඟින් කාන්තාවන්ට එරෙහි හිංසනය සඳහා බලපාන ගැටළු හඳුනාගෙන, එම ගැටළු වැළැක්වීම සඳහා මෙම පර්යේෂණය මත පදනම්ව නිර්දේශ හඳුනාගෙන ඇත. මෙම නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික කාන්තා කමිටුව වැවිලි මානව සංවර්ධන භාරය සමග සාකච්ඡා කර ව්‍යාපෘති සැලැස්මක් සකස් කරන ලදී. ඒ අනුව ප්‍රථමයෙන් නියමු ව්‍යාපෘතියක් වශයෙන් හපුතලේ වතුයාය ආශ්‍රිතව වැඩසටහන් 2ක් ක්‍රියාත්මක කරන ලදී.

### .5.3ළමා මවුවරු පිළිබඳ පර්යේෂණයේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම

2016 වර්ෂයේදී සිදුකරන ලද මෙම පර්යේෂණයෙන් මතුවූ නිර්දේශයන් අනුව, නව යෞවන යෞවනියන් සඳහා ප්‍රජනන සෞඛ්‍ය පිළිබඳ දැනුම ලබා දීම හා ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණයට අදාළ නීතීන් පිළිබඳ වැඩසටහන් පවත්වා ඇත.

එමෙන්ම හය වන ශ්‍රේණියේ සිටම ප්‍රජනන සෞඛ්‍යය පිළිබඳ පාසැල් විෂය නිර්දේශයට ඇතුළත් කිරීමට ප්‍රතිපත්ති සම්පාදකයින් සමග සාකච්ඡා කර ඇත. පවුල් සෞඛ්‍ය කාර්යාංශය හා ඒකාබද්ධ වී මොඩියුල සකස් කර ප්‍රජනන සෞඛ්‍ය වැඩසටහන් පවත්වා ඇත.

## .06මාධ්‍ය වැඩසටහන්

### 6.1. කාන්තා ප්‍රබෝධය-සාකච්ඡාමය ගුවන් විදුලි වැඩසටහන් මාලාව 2017

කාන්තාවන් මුහුණපාන ගැටළු, විශේෂයෙන්ම ස්ත්‍රී පුරුෂ සමාජභාවීය හිංසනය ආශ්‍රිත කරුණු පිළිබඳව ශ්‍රාවකයින් දැනුවත් කිරීම උදෙසා "කාන්තා ප්‍රබෝධය" ගුවන් විදුලි වැඩසටහන් විසුරුවා හරිනු ලැබේ. ශ්‍රාවකයින් දැනුවත් කිරීම හා ඔවුන්ගේ ගැටළුවලට පිළිතුරු සැපයීම මෙම වැඩසටහනේ අරමුණ වේ. මෙම සාකච්ඡා තුළින් හුදෙක්ම මහජනතාව දැනුවත් කිරීමත්එමගින් සමාජයේ එදිනෙදා ඇතිවන ගැටළු , වර්ෂයේදී 2017 .කරගැනීම හා වළක්වා ගැනීමත් අපේක්ෂා කෙරේ අවම ස්වදේශීය සේවය හරහා සිංහල මාධ්‍ය වැඩසටහන් 08ක් ද තෙන්ඩ්‍රල් එෆ්එ.ම් හරහා දෙමළ මාධ්‍ය වැඩසටහන් 04ක්ද ප්‍රචාරය කර ඇත . .ක් ඉදිරි මාසයන්හිදී සිදු කිරීමට සැලසුම් කර ඇත 04 එමෙන්ම තවත් වැඩසටහන්

-

## 6.3. කාන්තාව පිළිබඳව ජනමාධ්‍ය තුළ යහපත් ප්‍රතිරූපයක් ගොඩනැඟීම සඳහා වන මාධ්‍ය සාකච්ඡාව

සමාජය තුළ කාන්තාව පිළිබඳව සංවේදීභාවය හා ධනාත්මක චින්තනය ගොඩනැගීම තුළින් කාන්තාව පිළිබඳව ජනමාධ්‍ය තුළ යහපත් ප්‍රතිරූපයක් ගොඩනැගීම, කාන්තා හිංසනය අවම කිරීම, කාන්තාව සම්බන්ධයෙන් ජනමාධ්‍ය හරහා බොහෝ මතවාදයන් සමාජගත කරන බැවින් යහපත් මාධ්‍ය ප්‍රතිපත්තියක් සකස් කිරීම යන අරමුණු පදනම් කර ගනිමින් මාධ්‍ය ක්ෂේත්‍රයේ තීරණ ගන්නා මට්ටම්වල නියුතු නිලධාරීන් සම්බන්ධ කර ගනිමින් සැප්තැම්බර් මෙම මාධ්‍ය සාකච්ඡාව ජනමාධ්‍ය අමාත්‍යාංශය හා ඒකාබද්ධව පවත්වන ලදී.

## 6.4. වනිතා විභව සඟරාව මුද්‍රණය කිරීම.

කාන්තාවගේ සංවර්ධනය හා ඇගේ අනන්‍යතාවය තේමා කොට ගත් නිර්මාණ කෙරෙහි යොමු වීම, නිර්මාණාත්මක හැකියා වර්ධනය හා සංවර්ධන වැඩසටහන් අත්දැකීම් බෙදාගැනීමේ අරමුණින් මෙම සඟරාවේ කලාප 04ක් 2017 වර්ෂයේදී මුද්‍රණය කරන ලදී.

## 6.5. ප්‍රගතියේ හවුල්කරුවෝ සඟරාව මුද්‍රණය කිරීම

කාන්තාවන් සම්බන්ධ කාලීන මාතෘකාවලට අනුකූලව ශාස්ත්‍රීය අදහස් රැස්කරමින් , අන්තර් ආයතනික සම්බන්ධතා වර්ධනය කිරීම හා ශාස්ත්‍රීය දැනුම පාඨකයින්ට ලබාදීම උදෙසා ප්‍රගතියේ හවුල්කරුවෝ සඟරාව මුද්‍රණය කර බෙදා හරින ලදී.


# .07පැමිණිලි මධ්‍යස්ථානය හා කාන්තා උපකාරක දුරකථන සේවාව 1938

## 7.1 ස්ත්‍රී පුරුෂ සමාජභාවීය පැමිණිලි මධ්‍යස්ථානය

කාන්තාවන්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය වන අවස්ථාවල හා විශේෂයෙන්ම හිංසනයට ලක්වන කාන්තාවන්ට ඒ පිළිබවඳ පැමිණිලි කොට සහනය ලබා ගැනීමට මින් හැකිවේ. ඒ අනුව කාන්තා අයිතිවාසිකම්උල්ලංඝනයකදී එවන් පැමිණිලි බාරගැනීමටත් ඒවා විමර්ෂණය කොට ප්‍රතිකර්ම ලබාදීම සඳහා අදාල රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන වෙත යොමු කිරීමටත්, අවශ්‍ය අවස්ථාවන්හිදී නීති හා උපදේශනය වැනි සහන සේවා සැලසීමට ක්‍රියාමාර්ග ගැනීමටත් කටයුතු කරන අතර නීතිඥවරුන්ගේ සහාය මෙම පැමිණිලි මධ්‍යස්ථානයෙන් සේවාදායකයන්ට හිමි වේ.

මෙරට ඕනෑම ප්‍රදේශයක කාන්තාවන්ට හෝ පිරිමින්ට මෙම මධ්‍යස්ථානය වෙත පැමිණ හෝ ලිපි මඟින්, දුරකථන හෝ ෆැක්ස්, විද්‍යුත් තැපැල් මඟින් තමාගේ භාෂා මාධ්‍යයෙන් පැමිණිලි ඉදිරිපත් කල හැකිය. කාන්තාවන්ට එරෙහි හිංසන ක්‍රියා, ලිංගික අතවර, පවුල් ආරවුල්, නඩත්තු පිළිබඳ ගැටළු, රැකියා ස්ථානවල සිදුවන ගැටළු ඇතුළු විවිධ ක්ෂේත්‍රයන්හිදී කාන්තාව මුහුණපාන හිරිහැර මෙම පැමිණිලි මධ්‍යස්ථානයට යොමු කිරීමට ඕනෑම සේවාදායකයෙකුට හැකියාව ඇත.

මෙම පැමිණිලි මධ්‍යස්ථානය වෙත ලැබෙන පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී අදාල පාර්ශවයන් ගෙන්වා සමථ කිරීම, උපදේශනය මඟින් පවුල තුල ඇති වූ මානුෂීය ගැටළු විසදා ගැනීමට උපකාර කිරීම, ගැටළු විසදා ගැනීම සඳහා අදාල ආයතනයන් වෙත යොමු කිරීම වැනි ක්‍රියාමාර්ගයන්වලට යොමු වේ. මේ වන විට පැමිණිලි මධ්‍යස්ථානය වෙත ලැබෙන පැමිණිලිවල වර්ධනයක් දක්නට ලැබේ. 2017 වසරේදී අගෝස්තු මස දක්වා පැමිණිලි 293 ක් ලැබී ඇත.




### 7.2 1938 - කාන්තා උපකාරක දුරකථන සේවාව


ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත හිංසනයට පත් කාන්තාවන්ට පැමිණිලි මධ්‍යස්ථානයේ තවත් පුළුල් කිරීමේ ව්‍යාපෘතියක් ලෙස 1938 ක්ෂණික ඇමතුම් අංකය යටතේ කාන්තා උපකාරක දුරකථන සේවාව 2014 මාර්තු මාසයේ ආරම්භ කරන ලදී.

කාන්තා උපකාරක දුරකථන සේවාව සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැමිණිලි ලබා ගැනීම සිදු කරන අතර පෙ.ව 8.30 සිට 5.15 දක්වා රාජකාරී දිනයන්හි පමණක් ක්‍රියාත්මක වේ. තම ගැටළුව ඉදිරිපත් කළ විට එම ගැටළුවට අදාළව තොරතුරු සියල්ල සටහන් කරගෙන අදාල ආයතනවලට යොමු කිරීම සිදු කරනු ලැබේ. ඒ අනුව පොලිසිය, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි කාර්යාල, පොලිස් ළමා හා කාන්තා අපයෝජන නිවාරණ කාර්යාංශය, නීති ආධාර කොමිසම, ජාතික ළමා ආරක්ෂක අධිකාරිය, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව, අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාල, විදේශ සේවා නියුක්ති කාර්යාංශය ආදී අදාල රේඛීය අමාත්‍යාංශ වෙත ලැබෙන පැමිණිලි සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට යොමු කරනු ලබයි.

ප්‍රධාන කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල මෙම අමාත්‍යාංශයට අනුබද්ධ නිලධාරීන් සම්බන්ධ කරගෙන සේවාවන් සැලසීම හා නීතිමය ගැටළු අවස්ථාවන්හීදි නීති උපදෙස් සෘජුවම ලබාදීම සිදු කරන අතර වැඩිදුර නීති ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය වූ විටදී අදාළ ආයතනවලට යොමු කරනු ලැබේ. ගැටළු වෙනත් ආයතන වලට යොමු කළද ඔවුන් හා සම්බන්ධ වී හිංසනයට ලක් වූ පුද්ගලයාට සහන සැලසෙන තෙක් පසුවිපරම් කිරීමද කරනු ලබන තවත් සේවාවකි. ඒ අනුව මෙම සේවාවට ලැබෙන පැමිණිලි ඉහළ ගොස් ඇත .ඒ අනුව 2014 වර්ෂයේදි පැමිණලි 398 ක්ද, 2015 වර්ෂයේදි 777ක්, 2016 වර්ෂයේදි 1,382ක් හා 2017 වර්ෂයේදී 1204ක් පැමිණිලි ලැබී ඇත.

**1938 කාන්තා උපකාරක දුරකථන සේවයට ලද පැමිණිලි යොමු කළ ආයතන - 2017**

| | |
|---|---|
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ | 179 |
| පොලිස් දෙපාර්තමේන්තුව | 63 |
| නීති ආධාර කොමිෂන් සභාව | 90 |
| අභ්‍යන්තර අංශය | 827 |
| ශ්‍රී ලංකා සර්ව | 26 |
| වෙනත් ආයතන | 19 |




**7.2.1.**

**1938 කාන්තා උපකාරක දුරකථන සේවාව හා පැමිණිලි මධ්‍යස්ථානයේ නිලධාරීන් සඳහා ආතති කළමණාකරන වැඩසටහන**

1938 කාන්තා උපකාරක දුරකථන සේවාව හා පැමිණිලි මධ්‍යස්ථානය ශක්තිමත් කිරීම හා සේවාලාභීන්ට වඩා කාර්යක්ෂම ඵලදායී සේවාවක් ලබා දීමේ අරමුණින් එහි නිලධාරීන් ආතති කළමනාකරණය හා ධාරිතා සංවර්ධන වැඩසටහන පැවැත්විය.
මේ වැඩසටහන සඳහා නීති නිලධාරීන්, පැමිණිලි මධ්‍යස්ථානයේ නිලධාරීන්, 1938 කාර්ය මණ්ඩලය, දත්ත පද්ධතියට සම්බන්ධ නිලධාරීන්ද සම්බන්ධ කර ගන්නා ලදී.




**හොරණ තේවර් ලවර් නිවාඩු නිකේතනයේ දී පවත්වන ලද ආතති කළමනාකරණ වැඩසටහන**

## .8ජාත්‍යන්තර කාන්තා දින වැඩසටහන්

### කාන්තා හඬ අවදි කිරීමේ පා ගමන

වර්ෂයේ ජාත්‍ය 2017න්තර කාන්තා දිනයට සමගාමීව කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාශය විසින් සමස්ත ශ්‍රී ලාංකීය කාන්තාවන්ගේ සුභසිද්ධිය පිළිබඳව නව අරුතක් ලබාදීම අරමුණු කර ගනිමින් කාන්තා හඬ අවදිකිරීමේ උද්දේශන පා ගමනක් මාර් 2017තු ජාවම ලංකාවේ සමස්ත ප්‍රථය ශ්‍රී .වන දින පවත්වන ලදී01 ඉලක්ක කරගනිමින් දිස්ත්‍රික්ක කට වැඩි පිරිසක් 7,000 නවමු ආකාරයකින් පැවැත්වූ අතර එමගින් 25 .දැනුවත් කෙරිණි






2017.03.01 පවත්වන ලද කාන්තා හඩ අවදිකිරීමේ පා ගමනට ගරු කාන්තා හා ළමා කටයුතු අමාත්‍යතුමිය, අගමැති ආර්යා මෛත්‍රී වික්‍රමසිංහ මැතිණිය, ගරු විදේශ කටයුතු අමාත්‍ය තලතා අතුකෝරාළ මැතිතුමිය, කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ ලේකම් චන්ද්‍රානි සේනාරත්න මහත්මිය, අතිරේක ලේකම් (සංවර්ධන) සහ කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ සන්නාම තානාපතිනි ජයන්ති කුරුඋතුම්පාල මෙනෙවිය එක්වෙමින්...




**පාගමනට සහභාගී වූ පිරිස...**

# 13.ළමා ලේකම් කාර්යාලය


## දැක්ම

ශාරීරික ,මනෝසමාජයීය සහ ප්‍රජානනසංවර්ධනයෙන් පිරිපුන් ශ්‍රී ලාංකීය මුල් ළමාවිය දරු පරපුරක් බිහි කිරීම

## මෙහෙවර

ජාතික මට්ටමේ කේන්ද්‍රීය ආයතනය ලෙස ප්‍රතිපත්ති හා වැඩසටහන් සම්පාදනය, ක්‍රියාත්මක කිරීම, ඇගයීම හා පසුවිපරම් කිරීම තුළින් ශ්‍රී ලාංකීය මුල් ළමාවිය දරුවන්ගේ සමස්ත සංවර්ධනය සහතික කිරීම.

### ළමා ලේකම් කාර්යාලයේ සංවිධාන ව්‍යූහය



## ප්‍රධාන අරමුණු/ කාර්යභාරය

- මුල් ළමාවිය සත්කාරය හා සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණය ලෙස කටයුතු කිරීම.
- රාජ්‍යරාජ්‍ය , නොවන සංවිධාන හා පෞද්ගලික අංශයේ මුල් ළමාවිය සංවර්ධන වැඩසටහන් සම්බන්ධීකරණය හා ජාලගත කිරීම.
- මුල් ළමාවිය සත්කාරය හා සංවර්ධනයට අදාල වන පර්යේෂණ සිදු කිරීමදත්ත , .රැස්කිරීම සහ වැඩසටහන් සම්පාදනය කිරීම
- මුල් ළමාවියේ දරුවන්ගේ සමස්ත සංවර්ධනය සඳහා අදාළ වන පුහුණු වැඩසටහන් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම.
- මුල් ළමාවිය සංවර්ධනයට අදාල මානව සම්පත් සංවර්ධනය.

## ක්‍රියාත්මක කළ ප්‍රධාන සංවර්ධන වැඩසටහන් - 2017

### 01. ගර්භනී හා කිරිදෙන මව්වරුන්ට රු.20,000ක පෝෂණ දීමනාවක් ලබාදීමේ වැඩසටහන

2015 වසරේදී ආරම්භ කරන ලද මෙම වැඩසටහන මඟින් ගර්භනී සමයේ හා කිරිදෙන මවකට අවශ්‍ය පෝෂ්‍ය පදාර්ථ අඩංගු ආහාර ද්‍රව්‍යවලින් සමන්විත රු. 2,000ක් වටිනා පෝෂණ ඇසුරුමක් ලෙස සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ ලියාපදිංචි වන සෑම ගර්භනී මවකටම මාස 10 ක් සඳහා (කූපන්පත් භාවිතය මඟින්) 2016 වසරේ අප්‍රේල් මස දක්වා හිමිවිය. එහෙත් මව්වරුන්ට නිර්දේශිත ආහාර ද්‍රව්‍ය මිලදී ගැනීම පහසු කිරීම හා වැඩසටහන ක්‍රියාත්මක කිරීම පහසු කිරීමේ අරමුණින් පසුගිය වසරේ මැයි මාසයේ සිට කූපන්පත් වෙනුවට වවුචර්පත් නිකුත් කිරීමේ නව ක්‍රමවේදයක් හඳුන්වා දී ඇත.

මේ යටතේ රු.2000ක වටිනාකමින් යුතු වවුචර් 10ක් එකවර ලබා දේ. ගර්භනී සමයේ අවසන් මාස 06 හා කිරි දෙන සමයේ පළමු මාස 04 සඳහා එම පෝෂණ ද්‍රව්‍ය සමස්තය ලබා ගැනීමට හැකියාව ඇත. මේ සඳහා රු.මිලියන 5,500ක් වෙන් කර ඇති අතර 2017 වර්ෂය අවසන් වන විට දරා ඇති වියදම රු.මිලියන 5,408,109 කි. ඒ අනුව ආසන්න වශයෙන් පෝෂණ ඇසුරුම් 2,703,881 ක් ප්‍රතිලාභීන් අතර බෙදී ගොස් ඇත.

ලබන වසරේ සිට මෙම වැඩසටහන නවීන තාක්ෂණය ඔස්සේ ඩිජිටල් ක්‍රමවේදයකට සිදුකිරීමට සැලසුම් කරමින් පවතින අතර මෙම වසරේ නොවැම්බර් මාසය වන විට බදුල්ල, කොලොන්නාව, තිහගොඩ යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ කේන්ද්‍ර කරගනිමින් ඒ සම්බන්ධයෙන් වන නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය.

## 02. පෙරපාසල් දරුවන්/ මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සඳහා උදෑසන ආහාර වේලක් ලබාදීමේ වැඩසටහන

2016 වසර වනතෙක් ක්‍රියාත්මක කළ පෙර පාසල් දරුවන්/ මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සඳහා නැවුම් කිරි වීදුරුවක් ලබාදීමේ වැඩසටහන වෙනුවට 2017 වර්ෂයේ මාර්තු මස සිට පෝෂණ ඌනතාවයෙන් පෙළෙන පෙරපාසල් දරුවන්ට උදෑසන ආහාර වේලක් ලබාදීමේ වැඩසටහන ආරම්භ කරන ලදී.

පෙරපාසල් වියේ පසුවන අඩුබර සහිත දරුවන්ගේ පෝෂණ තත්ත්වය නංවාලීම මෙම වැඩසටහනේ මූලික අරමුණ වන අතර දරුවන් පෙර පාසලට පැමිණීමට උනන්දුවක් ඇති කිරීම, පෙරපාසල් වියේ සිටම සෞඛ්‍ය සම්පන්න පුරුදු පුහුණු කිරීම, දිළිඳු පවුල්වලට ආර්ථික වාසි සලසාදීම සහ පූර්ණ සංවර්ධනය හරහා රටේ මානව සම්පත් සංවර්ධනයෙහි රාජ්‍ය අංශයේ දායකත්වය පිළිබඳව ජනතාව දැනුවත් කිරීම ආදිය මෙම වැඩසටහනේ සෙසු අරමුණු අතර වේ.

සෞඛ්‍ය අමාත්‍යාංශයේ හා දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්ගේ දත්තවලට අනුව අඩු බර සහිත දරුවන් වැඩි ප්‍රතිශතයක් වාසය කරන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාශයන්හි පෝෂණ මට්ටම අවම තත්ත්වයේ සිටින දරුවන් ඉගෙනුම ලබන මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයන් සඳහා මෙම වැඩසටහන ක්‍රියාත්මක වේ. ඒ අනුව දිවයිනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 206 ක පෙරපාසල් 2,050 ක දරුවන් 51,213 ක් මෙම වැඩසටහන යටතේ ප්‍රතිලාභ ලැබීමට සුදුසුකම් ලබා ඇත. 2017 වර්ෂය තුළ මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා රු.මිලියන 300 ක් වෙන්ව ඇති අතර එම වර්ෂය අවසන් වන විට පෙර පාසල් දරුවන් 49,320 ක් ප්‍රතිලාභීන් බවට පත්ව ඇත. මේ සඳහා දරා ඇති වියදම රු.මිලියන 166.747 කි.

පෙර පාසල් දරුවන් සඳහා උදෑසන ආහාරය ලබා දීමේ වැඩසටහන

## 03. පෝෂණය පිළිබඳ පෙරපාසල් ගුරුවරියන් දැනුවත් කිරීමේ වැඩසටහන

මෙම වසරේ සිට ක්‍රියාත්මක පෙරපාසල්/ මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන දරුවන් සඳහා උදෑසන ආහාර වේල ලබාදීමේ වැඩසටහනට සමගාමීව එහි වැදගත්කම හා පෝෂණය පිළිබඳ පෙරපාසල් ගුරුවරියන් දැනුවත් කිරීම මෙම වැඩසටහනෙහි මූලික අරමුණයි. ඒ අනුව වැඩසටහන ක්‍රියාත්මක කරන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ කේන්ද්‍ර කර ගනිමින් දැනුවත් කිරීමේ වැඩසටහන් 215 ක් පැවැත්වීම සඳහා කටයුතු සැලසුම් කොට ඇත. මේ සඳහා ප්‍රතිපාදන රු.මිලියන 2.15 ක් වෙන් කරන ලද අතර මේ වසරේ දෙසැම්බර් මාසය අවසන් වන විට එම මුදලින් රු. මිලියන 1.866ක වියදමක් දරමින් වැඩසටහන් 100% ක් සිදු කර ඇත.

## 04. ළමුන් සඳහා දිවා සුරැකුම් හා ප්‍රජා පාදක සැදෑ සුරැකුම් මධ්‍යස්ථාන සංවර්ධනය කිරීමේ වැඩසටහන

2014 වසරේ ළමා අපයෝජනය හා කාන්තා හිංසනය වැළැක්වීම පිළිබඳ ව්‍යාපෘතිය (මිලියන 700) යටතේ පෙරපාසල් දරුවන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා භෞතික පහසුකම් සංවර්ධනය කිරීමට දිවා සුරැකුම් මධ්‍යස්ථාන 07ක් ඉදිකිරීම ආරම්භ කරන ලදී. ඒ අනුව කිලිනොච්චිය, පොළොන්නරුව, මාතලේ, මඩකලපුව, නුවරඑළිය, අනුරාධපුරය සහ මොණරාගල යන දිවා සුරැකුම් මධ්‍යස්ථාන ඉදිකිරීම සිදු කරන ලද අතර 2016 වසරේ පානදුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය කේන්ද්‍ර කර ගනිමින් තවත් දිවා සුරැකුම් මධ්‍යස්ථානයක ඉදි කිරීම් කටයුතු ආරම්භ කරන ලදී.

2017 වසරේදී දිවා සුරැකුම් මධ්‍යස්ථාන ඉදිකිරීම් සහ වැඩි දියුණු කිරීම සඳහා රු.මිලියන 20 ක් වෙන් වී ඇති අතර එයින් රු.මිලියන 17.214 ක් නව දිවා සුරැකුම් මධ්‍යස්ථාන ඉදිකිරීම සහ සංවර්ධනය, හා විවෘත කිරීම සඳහා ප්‍රතිපාදන ලබා දී ඇත. ඒ අනුව බදුල්ල, ගම්පහ යන දිස්ත්‍රික්කවල නව දිවා සුරැකුම් මධ්‍යස්ථාන 02 ක් සහ දෙහිඕවිට , දඹුල්ල යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ දෙකෙහි දිවා සුරැකුම් මධ්‍යස්ථාන 02 ක් ඉදිකිරීමට අවශ්‍ය මූලික කටයුතු සිදු කරන ලදී.ඒ අනුව මෙහි ප්‍රගතිය රු.මි.15,429 කි.







මඩකලපුව දිවා සුරැකුම් මධ්‍යස්ථානය විවෘත කිරීම

## 05. ළමා දිරිය පෙරපාසල් ගුරුවරියන් සඳහා රු. 250 ක් ලබාදීමේ වැඩසටහන

පෙරපාසල්/ මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සේවාවන් වඩාත් ශක්තිමත් හා වැඩිදියුණු කිරීමේ අරමුණින් 2015 අතුරු අයවැය යෝජනා යටතේ පෙරපාසල්/ මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන ගුරුවරියන් සඳහා මාසිකව රු.250ක දීමනාවක් ලබා දීම ආරම්භ කෙරිණි. ඒ අනුව 2017 වසරේදී රු.මිලියන 30ක් මෙම වැඩසටහනට වෙන් කරන ලද අතර 2017 අගෝස්තු මාසය අවසන් වන විට සුදුසුකම් ලැබූ පෙරපාසල් ගුරුවරියන් 5,499 ක් සඳහා මෙම දීමනාව ලබා දීමට රු.මිලියන 16.819 ක ප්‍රතිපාදන අදාල දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත නිදහස් කර ඇත.එම නිදහස් කරන ලද ප්‍රතිපාදන මුදලින් රු.මි.16.099 මෙම වැඩසටහන සඳහා වියදම්ව ඇත.

## 06. මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ අනෙකුත් වැඩසටහන්

මේ යටතේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා රු.මිලියන 65ක ප්‍රතිපාදන වෙන් කර ඇති අතර පහත පරිදි වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

### 6.1 "සෙනෙහෙ තටාක" නිවස පදනම් කරගත් මුල් ළමාවිය සංවර්ධන වැඩසටහන

මෙම වැඩසටහනේ ප්‍රධාන අරමුණ වන්නේ නිවස ආශ්‍රිත පරිසරය සහ නිවසේ එදිනෙදා සිදුකරනු ලබන කාර්යයන්වලදී මුල් ළමාවියේ දරුවන් සම්බන්ධ කරගැනීම මඟින් ඔවුන්ගේ සමස්ත සංවර්ධනය ඇති කිරීමයි. ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් දෙමාපියන් දැනුවත් කිරීම, රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම, තරුණ කණ්ඩායම් දැනුවත් කිරීම වැනි කාර්යයන් මේ යටතේ සිදු කරනු ලබයි. 2017 වර්ෂයේ දී ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් වැඩසටහන් 324ක් සඳහා රු.මිලියන 1.31 ප්‍රතිපාදන වෙන් කරන ලද අතර 2017 වර්ෂය අවසන් වන විට වැඩසටහන් 310 ක් පවත්වා ඇත. එහි මූල්‍ය ප්‍රගතිය රු.මිලියන 1.175කි.

එමෙන්ම මේ යටතේ දිස්ත්‍රික් මට්ටමේ වැඩසටහන් 25ක් පැවැත්වීම සඳහා රු.මිලියන 0.356 ක ප්‍රතිපාදන නිදහස් කර ඇති අතර 2017 වර්ෂය අවසන් වන විට වැඩසටහන් 22ක් පවත්වා ඇත. එහි මූල්‍ය ප්‍රගතිය රු.මිලියන 0.313 කි.




රාජ්‍ය නිලධාරීන් හා දෙමාපියන් දැනුවත් කිරීමේ වැඩසටහන්

## 6.2 දිස්ත්‍රික් කාන්තා හා ළමා සංවර්ධන කමිටු

මේ දක්වා පැවති දිස්ත්‍රික් ළමා සංවර්ධන කමිටු 2017 වසරේ සිට දිස්ත්‍රික් කාන්තා හා ළමා සංවර්ධන කමිටු ලෙස එහි කාර්යභාරය පුළුල් කරන ලදී. ඒ අනුව සෑම වගකිව යුතු අංශයකම සහභාගීත්වයෙන් කාන්තාවන්ට සහ ළමුන්ට හිතකර පරිසරයක් නිර්මාණය කිරීම සඳහා 2017 වර්ෂයේදී දිස්ත්රික් කාන්තා හා ළමා සංවර්ධන කමිටු රැස්වීම් පැවැත්වීම සඳහා වෙන්ව ඇති මුළු ප්‍රතිපාදන ප්‍රමාණය රු.මිලියන 0.75කි. ඒ අනුව 2017 සැප්තැම්බර් මාසය අවසාන වන විට කමිටු 62ක් පවත්වා ඇති අතර ඒ සඳහා දරා ඇති වියදම රු. මිලියන 0.571 කි.

## 6.3 මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ජාතික/ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු ක්‍රියාත්මක කිරීම.

මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය 2004 ප්‍රතිපත්තියට අනුකූලව මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ජාතික හා ප්‍රාදේශීය කමිටු පැවැත්වීම සඳහා රු.මිලියන 1.163 ක ප්‍රතිපාදන වෙන්ව ඇත. ඒ අනුව මේ වන විට ජාතික මට්ටමේ කමිටු 4ක්, ප්‍රාදේශීය මට්ටමේ කමිටු 569 ක් සහ දිස්ත්රික් මට්ටමේ සම්බන්ධීකරණ කමිටු 08 ක් පවත්වා ඇති අතර එහි වියදම රු.මිලියන 0.7345 කි.

## 6.4 මුල් ළමාවිය සංවර්ධන නිලධාරීන්ගේ ප්‍රගති සමාලෝචන රැස්වීම.

ක්ෂේත්‍රය තුළ රාජකාරි කටයුතුවල නිරත වන දිස්ත්‍රික් මුල් ළමාවිය සම්බන්ධීකරණ නිලධාරීන් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල රාජකාරි කටයුතුවල නිරත මුල් ළමාවිය සංවර්ධන සහකාර නිලධාරීන්ගේ

දිස්ත්‍රික් මට්ටමේ ප්‍රගති සමාලෝචන රැස්වීම් 139ක්, පළාත් මට්ටමේ ප්‍රගති සමාලෝචන රැස්වීම් 07 ක් සහ ජාතික මට්ටමේ රැස්වීම් 04ක් පවත්වා ඇති අතර මේ සඳහා 2017 වර්ෂය අවසන් වන විට  විට රු. මිලියන 0.7345ක වියදමක් දරා ඇත.




දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචන රැස්වීම

## 6.5 මුල් ළමාවිය සංවර්ධන නිලධාරීන්ගේ වාර්ෂික සමුළුව

දිවයින පුරා දිස්ත්‍රික් මට්ටමේ සහ ප්‍රාදේශීය මට්ටමේ රාජකාරි කටයුතුවල නිරත මුල් ළමාවිය සංවර්ධන නිලධාරීන් සඳහා ළමා ලේකම් කාර්යාලයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම හඳුන්වාදීම, දිස්ත්‍රික් මට්ටමේ සහ ප්‍රාදේශීය මට්ටමේ වැඩසටහන් වඩාත් කාර්යක්ෂම සහ ඵලදායී කිරීමත් ආදිය අරමුණු කරගෙන මෙම වාර්ෂික සමුළුව 2017 පෙබරවාරි මාසයේ දී කොළඹ දී පවත්වන ලදී. මේ සඳහා රු.මිලියන 0.382 ක් වෙන් කරන ලද අතර  එම මුදලම මේ වනවිට වියදම් වී ඇත.

## 6.6 මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සමාලෝචනය සහ යාවත්කාලීන කිරීම.

මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ 2004 දී එළි දක්වන ලද  ජාතික ප්‍රතිපත්තිය දැනට ක්‍රියාත්මක කරමින් පවතින අතර එම ජාතික ප්‍රතිපත්තිය වර්තමානයේ මුල් ළමාවිය සංවර්ධන හා රැකවරණ අවශ්‍යතාවලට ගැළපෙන පරිදි සංශෝධනය කර නැවත මුද්‍රණය කිරීමට මේ වන විට කටයුතු කරමින් පවතී. එමෙන්ම  මේ සඳහා අදාළ පාර්ශවවල අදහස් ලබා ගනිමින් පවතින අතර ඉන් අනතුරුව මෙම ජාතික ප්‍රතිපත්තිය සඳහා කැබිනට් මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට බලාපොරොත්තු වේ. මෙය 2018 වසරේ දී මුද්‍රණය කර එළිදැක්වීමට නියමිතය.

### 6.7 මුල් ළමාවිය රැකවරණය පිළිබඳ ජාලය පවත්වා ගැනීම.

ශ්‍රී ලංකාවේ මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳව කටයුතු කරන රාජ්‍ය, රාජ්‍ය නොවන හා පුද්ගලික අංශයේ ආයතනයන් හා පුද්ගලයන් සම්බන්ධ කර ගනිමින් මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාලයක් (ECCD Network) ළමා ලේකම් කාර්යාලය මඟින් ස්ථාපිත කර ඇති අතර ඒ වෙනුවෙන් රු.මිලියන 0.11ක් වෙන්කර ඇත. ඒ අනුව ඊට අදාළ වන මූලික රැස්වීම් වාර 02 පවත්වා ඇති අතර ඒ සඳහා වැය වී ඇති මුදල රු.මිලියන 0.107 කි.

### 6.8 "නිවැරදි ආරම්භයට" මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සඳහා අවම ප්‍රමිතීන් ග්‍රන්ථය යාවත්කාලීන කිරීම.

මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සඳහා අවම ප්‍රමිතීන් ග්‍රන්ථය සංශෝධනය කර මුද්‍රණය කිරීමට අවශ්‍ය මූලික කටයුතු මේ වන විට සිදුකර ඇති අතර ඒ සඳහා රු.මිලියන 1.2133ක් වෙන්කර ඇත.

### 6.9 මුල් ළමාවිය සංවර්ධන ප්‍රමිතීන් හඳුන්වා දීමේ වැඩසටහන

මුල් ළමාවිය සංවර්ධන ප්‍රමිතීන් 2015 වසරේදී ජාතික මට්ටමින් එළිදක්වන ලද අතර (වයස අවු. 3 - 5 වයස් කාණ්ඩයේ ළමුන් සඳහා) ඒවා "ජාතික ප්‍රමිතීන්" බවට නම් කර මේ වනවිට කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන ඇත. මෙම මුල් ළමාවිය සංවර්ධන ප්‍රමිතීන්, පෙරපාසල් ගුරු පුහුණු අත් පොතක් වශයෙන් සකස් කර ඇති අතර එය පෙරපාසල් ගුරුවරියන්ට හඳුන්වාදීම සඳහා පළාත් මට්ටමේ පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් 2016 වසරේදී ක්‍රියාත්මක කරන ලදී.

එමෙන්ම දකුණ, බස්නාහිර, මධ්‍යම, ඌව යන පළාත්වල සියලු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල පෙර පාසල් ගුරුවරියන් සඳහා පුහුණු වැඩසටහන් 149ක් 2016 වසරේ පැවැත්වූ අතර 2017 වසරේදී සබරගමුව, වයඹ, උතුරු මැද, උතුරු හා නැගෙනහිර යන පළාත්වල එම වැඩසටහන් 182ක් 2017 වර්ෂය අවසන් වන විට පවත්වා ඇති අතර මූල්‍ය ප්‍රගතිය රු. මිලියන 3.472 කි.

### 6.10 මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ පෙරපාසල් ගුරුවරුන් සඳහා ජාතික ඩිප්ලෝමා සහතික පත්‍ර පාඨමාලාව සඳහා විෂය මාලාවක් සැකසීම හා පෙරපාසල් ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා ආධාර ලබා දීම.

මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ පෙර පාසල් ගුරුවරුන් සඳහා ජාතික ඩිප්ලෝමාව හා සහතික පත්‍ර පාඨමාලාව සඳහා විෂයමාලාවක් සකස් කිරීමේ මූලික කටයුතු මේ වන විට ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය (NAITA) සමඟ එක්ව අවසන් කර ඇත. මීට අමතරව නොමිලේ පවත්වන පෙර පාසල් ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා ආධාර ලබාදීම වෙනුවෙන් රු.මිලියන 0.2ක් වෙන් කර ඇති අතර එහි මූල්‍ය ප්‍රගතිය රු.මිලියන 0.2කි.

### 6.11 මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලා ලියාපදිංචි කිරීමේ වැඩසටහන.

මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ එක් අවුරුදු ඩිප්ලෝමා (පෙර පාසැල් ගුරු පුහුණු) පාඨමාලා ජාතික මට්ටමේ ප්‍රමිතීන්ගෙන් යුක්ත බවට සහතික කොට ළමා ලේකම් කාර්යාලය යටතේ ලියාපදිංචි කිරීම මෙහි ප්‍රධාන අරමුණ වේ. මේ යටතේ ජාතික මට්ටමේ ඩිප්ලෝමා පාඨමාලා 62 ක් ලියාපදිංචි කර ඇත. ඒ සඳහා රු.මිලියන 0.01ක් වෙන් කර ඇති අතර එහි මූල්‍ය ප්‍රගතිය රු.මිලියන 0.003 කි.

### 6.12 මුල් ළමාවිය සංවර්ධනය හා රැකවරණය සම්බන්ධ පර්යේෂණ

මුල් ළමාවිය සංවර්ධනය හා රැකවරණය සම්බන්ධව පර්යේෂණ 5ක් සිදු කරන ලදී. පුත්තලම,කොළඹ,ගම්පහ, යාපනය සහ නුවර එළිය යන දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි ඉතාමත් සාර්ථකව මෙම පර්යේෂණයන් සිදු කරන ලදී. මෙහි මූල්‍ය ප්‍රගතිය රු.මි. 0.003කි.

### 6.13 ‘‘අරුණ දකින රටා’’ මුල් ළමාවියේ දරුවන්ගේ සිතුවම් ප්‍රදර්ශනය සහ වැඩමුළුව

මුල් ළමාවියේ දරුවන්ගේ නිර්මාණාත්මක කුසලතාවයන් ඔප් නැංවීම සඳහා වාර්ෂිකව දීප ව්‍යාප්ත මට්ටමින් සිතුවම් ප්‍රදර්ශනයක් පවත්වනු ලබයි. මේ සඳහා දිවයිනේ සෑම පළාතක්ම නියෝජනය වන පරිදි පෙරපාසල් දරු දැරියන්ගේ සිතුවම් ලැබෙන අතර, ඒ අතරින් තෝරාගනු ලබන චිත්‍ර 500කින් යුක්තව මෙම ප්‍රදර්ශනය කොළඹ දී පවත්වා අදාල දරු දැරියන්ට ත්‍යාග සහ සහතිකපත් ලබාදීම සිදුකෙරේ.

මෙම වසරේදී එය සැප්තැම්බර් මස 11 වන දින මහරගම ජාතික තරුණ සේවා පරිශ්‍රයේදී පවත්වන ලදී. මෙම වැඩසටහන සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය රු.මිලියන 4.775කි. ඒ අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් චිත්‍ර ඇඳීමේ වැඩසටහන් 331 ක් සිදු කිරීම සඳහා රු.මිලියන 2.317ක ප්‍රතිපාදන නිදහස් කර ඇති අතර මූල්‍ය ප්‍රගතිය රු.මිලියන 2.246කි. ප්‍රාදේශීය වැඩසටහන් පවත්වා තෝරාගනු ලබන

චිත්‍ර මගින් ජාතික මට්ටමේ "අරුණ දකින රටා" චිත්‍ර වැඩමුළුව හා ත්‍යාග ප්‍රදානෝත්සවය සඳහා චිත්‍ර තෝරා ගැනීමේ දිස්ත්‍රික් වැඩසටහන් 25 ක් පවත්වා ඇති අතර එහි මූල්‍ය ප්‍රගතිය රු.මිලියන 0.0669 කි. එමෙන්ම මෙහි ජාතික වැඩසටහන යටතේ චිත්‍ර ප්‍රදර්ශනය හා ත්‍යාග ප්‍රදානෝත්සවය සඳහා දරා ඇති මුළු වියදම රු.මිලියන 4.544කි.



**"අරුණ දකින රටා" සිතුවම් දැක්ම, ත්‍යාග ප්‍රදානෝත්සවය**

## 6.14 මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ජාතික සතිය

ජූලි මස 14 සිට 20 දක්වා මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබද ජාතික සතිය මෙවරද සාර්ථකව පවත්වන ලදී. මෙහි ඉලක්ක කණ්ඩායම් වන්නේ මුල් ළමාවිය ප්‍රතිපත්ති සම්පාදකයන්, පෙරපාසල් දරුවන්, පෙරපාසල් ගුරුවරියන්, ක්ෂේත්‍රයේ නියුතු නිලධාරින්, දෙමාපියන්, ගැබිණි මව්වරුන් ආදියයි. ඒ අනුව එම ඉලක්ක කණ්ඩායම් වෙත ප්‍රතිලාභය වශයෙන් පෙරපාසල් සඳහා අධ්‍යාපන උපකරණ ලබාදීම, ආදර්ශ ගම්මාන යටතේ පෙර පාසල් ගොඩනැගිලි ඉදිකිරීමට ආධාර ලබාදීම, දැනුවත් කිරීමේ වැඩසටහන්, ළමයින් සඳහා සෞන්දර්යාත්මක වැඩසටහන් යනාදී කාර්යයන් 2017 වසරේදී ද සිදු කරන ලදී.

මෙම ජාතික සතිය තුළදී ජනමාධ්‍යයන් තුළින් මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳව ජනතාව දැනුවත් කිරීමද සිදුවිය. මෙවර "හෙට දින හිනැහෙන පිවිතුරු දරු කැළ සුරකිමු නිරතුරු" යන්න තේමා කර ගනිමින් මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ජාතික සතිය සමරන ලදී. එහිදී දැනට ළමා ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක"වැලි කෙළියෙන් පිටු අතරට" වැඩසටහන යටතේ දරුවන් පෙරපාසල් අවධියේ සිට පාසල් අධ්‍යාපනය දක්වා යොමුවීම ළමුන්ට වඩාත් පහසු හා හිතකාමී ලෙස සිදුකිරීමේ වාතාවරණයක් ගොඩනැඟීම සඳහා ළමා හිතකාමී අධ්‍යාපනය පිළිබද සංකල්පය සමාජගත කිරීම කෙරෙහි අවධානය යොමු කෙරිණි.

2017 වර්ෂයේ මුල් ළමාවිය ජාතික සතිය වැඩසටහන යටතේ ජාතික මට්ටමේ වැඩසටහන් 07 ක් සඳහා රු.මිලියන 2.161ක් ඇස්තමේන්තුගත කර ඇති එහි මූල්‍ය ප්‍රගතිය රු.මිලියන 2.09කි. ප්‍රාදේශීය මට්ටමේ වැඩසටහන් සඳහා රු. මිලියන 7.247ක ප්‍රතිපාදන මුදලක් ඇස්තමේන්තු කර ඇති අතර වාර්තාගත වියදම රු.මිලියන 6.9542 කි. ඒ අනුව මේ වනවිට සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ආවරණය වන පරිදි ප්‍රාදේශීය වැඩසටහන් 311ක් ළමයින් සඳහා ද වැඩසටහන් 310ක් දෙමාපියන් සඳහා ද සහ ජාතික මට්ටමේ වැඩසටහන් 07 ක් ද පවත්වා ඇත.



**මුල් ළමාවිය ජාතික සතිය වැඩසටහන්**

## 6.15 මුල් ළමාවිය සංවර්ධන ආදර්ශ ගම්මාන ව්‍යාපෘතිය

දිවයිනේ ග්‍රාම නිලධාරී කොට්ඨාශ අතුරින් තෝරාගත් ගම්මානවල ජනතාව මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ දැනුවත්භාවයෙන් සහ සංවේදීතාවයෙන් යුක්ත පිරිසක් බවට පත්කිරීමේ අරමුණින් එම ගම්මාන "ආදර්ශ මුල් ළමාවිය සංවර්ධන ගම්මාන" ලෙස දියුණු කිරීම කරනු ලැබේ.

2017 වර්ෂයේ මෙවැනි ආදර්ශ ගම්මාන පිහිටුවීම සඳහා රු.මිලියන 12 ක් වෙන් කරන ලදී. 2017 අගෝස්තු මාසය අවසන් වන විට වෙන් කරන ලද මුදලින් ආදර්ශ ගම්මාන 22 ක් ක්‍රියාවට නැංවීම සඳහා රු.මිලියන 11.83433 ක ප්‍රතිපාදන ලබා දී ඇත. ඒ අනුව ලබා දෙන ලද ප්‍රතිලාදන වියදම් මුදල් යොදවා මුල් ළමාවිය ආරර්ශ ගම්මාන 22 ක් සංවර්ධන කටයුතු ක්‍රියාවට නංවන ලදී. එහි මූල්‍ය ප්‍රගතිය රු.මිලියන 10.367කි.



### 6.16 හදිසි අවස්ථාවකදී මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ වැඩසටහන.

මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳව මුලින් සැලසුම්කර නොමැති, හදිසියේ ඇතිවන අවශ්‍යතා සහ ඒ ඒ අවස්ථාවන්වලදී සිදුකරනු ලබන ඉල්ලීම් අනුව කටයුතු කිරීමට රු.මිලියන 3.711ක ප්‍රතිපාදන වෙන්කරන ලදී. මේ යටතේ හදිසියේ ඇති වූ ගංවතුර තත්ත්වය නිසා ආපදාවට පත් රත්නපුර, කළුතර, කෑගල්ල, ගාල්ල, මාතර, හම්බන්තොට හා කොළඹ යන දිස්ත්‍රික්කවල මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සඳහා ඉගෙනුම් උපකරණ, ලිපිද්‍රව්‍යමය ආධාර ලබා දීමේ වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව 2017 වර්ෂය අවසන් වන විට රු.මිලියන 3.680 ක් වැය වී ඇත. එසේම ආපදාවට පත් මෙම පෙරපාසල් ප්‍රතිසංස්කරණයට හා අදාල උපකරණ ලබා දීමට යුනිසෙෆ් සංවිධානයද ඉදිරිපත් වී ඇත.

### 6.17 මුල් ළමාවිය සංවර්ධනය සඳහා නිවස පදනම් කරගත් ක්‍රියාකාරකම් අත්පොත සහ ඊට අයත් පුහුණු අත්පොත මුද්‍රණය කිරීම

මුල් ළමාවිය සංවර්ධනය සඳහා නිවස පදනම් කරගත් ක්‍රියාකාරකම් අත්පොත සහ ඊට අයත් පුහුණු අත් පොත මුද්‍රණය කිරීම සඳහා වෙන් කර ඇති මුදල රු. මිලියන 0.43කි. වර්ෂය අවසන් වන විට මුල් ළමාවිය සංවර්ධනය සඳහා නිවස පදනම් කරගත් ක්‍රියාකාරකම් අත්පොත හා ඊට අයත් පුහුණු අත්පොතෙහි සිංහල පිටපත මේ වන විට මුද්‍රණය කර ඇත.

### 6.18 මාධ්‍ය හා ප්‍රකාශන

මේ යටතේ මුල් ළමාවිය සංවර්ධනය හා සම්බන්ධව ජනතාව හා ක්ෂේත්‍රයේ නියුතු පිරිස් දැනුවත් කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා පත්‍රිකා මුද්‍රණය කිරීමටද මුල් ළමාවිය දරුවන් සඳහා විනෝදාත්මක ප්‍රකාශන නිකුත් කිරීමද සිදු කරන ලදී. ඒ සඳහා රු.මිලියන 1.156 ක් වෙන් කරන ලද අතර මේ වන විට මූල්‍ය ප්‍රගතිය රු.මිලියන 1.156කි.

### 6.19 මුල් ළමාවිය සම්පත් මධ්‍යස්ථානය හා ලේඛනාගාරය සංවර්ධනය

ළමා ලේකම් කාර්යාලයේ මුල් ළමාවිය සම්පත් මධ්‍යස්ථානයේ පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය උපකරණ ලබා ගැනීමටත්, ලේඛනාගාරය විධිමත් පරිදි පවත්වාගෙන යාමටත් රු.මිලියන 0.3ක් ඇස්තමේන්තුගත කර ,එම කටයුතු 2018 වර්ෂයේ සිදු කිරීමට බලාපොරොත්තු වේ .

### 6.20 දරුවන් හදා වඩා ගැනීමේ යහපත් ක්‍රමවේද ග්‍රන්ථය ඇසුරින් කරනු ලබන දැනුවත් කිරීමේ වැඩසටහන

දරුවන් හා දෙමව්පියන් අතර ගොඩනගාගත යුතු යහපත් අන්තර් සම්බන්ධතාවය තුළ සමස්ත සංවර්ධනයෙන් යුතු මුල් ළමාවිය දරුවකු දැයට දායාද කිරීමේ අරමුණින්, දරුවන් හදා වඩා ගැනීමේ යහපත් ක්‍රමවේද පිළිබඳව දෙමව්පියන් හා ප්‍රජාව දැනුවත් කිරීම මේ යටතේ සිදු කරනු ලබයි .

වර්ෂය පුරා ප්‍රධාන කොටස් තුනක් යටතේ වැඩසටහන් සංවිධානය කර ඇත. වර්ෂය ආරම්භයේ දී ජාතික මට්ටමින් දිස්ත්‍රික්ක 25ට අයත් මුල් ළමාවිය සංවර්ධන දිස්ත්‍රික් සම්බන්ධීකාරක නිලධාරීන් පුහුණුකරුවන් ලෙස පුහුණු කරනු ලැබූ අතර එහි මූල්‍ය ප්‍රගතිය රු.මිලියන 0.0335කි. අනතුරුව, දිස්ත්රික් නිලධාරීන් විසින් දිස්ත්‍රික්කයට අයත් සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල මුල් ළමාවිය සංවර්ධන නිලධාරීන් පුහුණු කිරීම සඳහා රු.මි.0.730 ක ප්‍රතිපාදන වෙන්කර ඇත. ප්‍රාදේශීය මට්ටමේ මුල් ළමාවිය සංවර්ධන නිලධාරීන් විසින් සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකටම අයත් දෙමව්පියන්, දරුවන් හදාවඩා ගැනීමේ නිවැරදි ක්‍රමවේද පිළිබඳව දැනුවත් කරනු ලැබේ. මෙම තෙවන අදියර සඳහා වෙන්වී ඇති ප්‍රතිපාදන ප්‍රමාණය රු.මිලියන 1.324කි. මේ දක්වා එහි මූල්‍ය ප්‍රගතිය රු.මිලියන 1.068 කි.

### 6.21 දරුවන් හදා වඩා ගැනීමේ යහපත් ක්‍රමවේද ග්‍රන්ථය හා ඒ ඇසුරින් කෙරෙන අත්පොත මුද්‍රණය

දරුවන් හදාවඩා ගැනීමේ යහපත් ක්‍රමවේද ග්‍රන්ථය ඇසුරින් පුහුණුකරුවන් පුහුණුකිරීමේ වැඩසටහන් පැවැත්වෙන අතර ඒ සඳහා මුල් ළමාවිය සංවර්ධන නිලධාරීන්ට හා මුල් ළමාවිය විෂය ක්ෂේත්‍රය සම්බන්ධව කටයුතු කරනු ලබන නිලධාරීන්ට බෙදා දීමට මෙම අත්පොත මුද්‍රණය කරනු ලබයි. ඒ අනුව ක්ෂේත්‍ර දැනුවත් කිරීම් සිදු කිරීමේදී දෙමව්පියන් සඳහා උපදෙස් හා මඟපෙන්වීම් සහිතව දරුවන් හදාවඩා ගැනීමේ යහපත් ක්‍රමවේද ග්‍රන්ථය ඇසුරින් අත් පොතක් මුද්‍රණය කිරීම මෙහිදී සිදු වේ. ඊට අදාළ කටයුතු මේ වන විට අවසන් වෙමින් පවතී.

### 6.23 මුල් ළමාවිය සංවර්ධනය හා රැකවරණය පිළිබඳ සම්පත් සංචිතය

මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ සම්පත් සංචිතයක් පිහිටුවීම සඳහා 2017 ක්‍රියාකාරී සැලැස්මෙන් රු.මිලියන 0.05ක ප්‍රතිපාදන වෙන් වී ඇත. මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධන ක්ෂේත්‍රයේ විශේෂඥ පුහුණුකරුවන් ඉතා විරල බැවින් දැනට දිවයිනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවයෙහි නිරත මුල් ළමාවිය සංවර්ධන නිලධාරීන්ට පුහුණුව ලබාදී ඔවුන් මඟින් දෙමාපියන්, තරුණ කණ්ඩායම්, ගැබිණි මවුවරුන් හා පෙරපාසල් ගුරුවරුන් පුහුණු කිරීමට බලාපොරොත්තු වේ.

ඒ සඳහා මුල් ළමාවිය රැකවරණ හා සංවර්ධනය සම්බන්ධයෙන් කටයුතු කරන ක්ෂේත්‍ර නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවා ඇත. ඉදිරියේදී ඔවුන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා තෝරා ගන්නා ලද අයදුම්කරුවන් සඳහා මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ උසස් පුහුණුවක් ලබාදී ක්ෂේත්‍රයේ පුහුණු විශේෂඥයින් වශයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් යොදා ගැනීමට නියමිතයි.2017 වසරේදී කොටසක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවූ අතර ඉතිරි නිලධාරීන් ලබන වසරේදී කැඳවීමට නියමිතය.

## 6.24 මුල් ළමාවිය දරුවන් සම්බන්ධ තක්සේරුකරණ මිනුම්

මුල් ළමාවිය රැකවරණ හා සංවර්ධනය පිළිබද තක්සේරුකරණ මිනුම් මේ වන විට මුල් ළමාවිය සංවර්ධන ප්‍රමිතීන් ආශ්‍රය කර ගෙන සකස් කර ඇත. මෙම තක්සේරුකරණ මිනුම් ක්ෂේත්‍රයට එළිදැක්වීමේ කර්තව්‍යය 2017.09.25 හා 26 යන දින දෙක තුළ ශ්‍රී ලංකා පදනම් ආයතනයේ දී සිදු කරන ලදී. එම එළිදැක්වීමෙන් පසු මේ වන විට තක්සේරුකරණ මිනුම් මුද්‍රණ කටයුතු සඳහා යොමුකර ඇත. මේ සඳහා රු.මිලියන 3.223 ක ප්‍රතිපාදන වෙන් වී ඇත.

ඉන්පසු තක්සේරු කරණ මිනුම් කට්ටල සකසා සියලුම මුල් ළමාවිය සංවර්ධන නිලධාරීන් ආවරණය වන පරිදි පළාත් මට්ටමෙන් පුහුණු වැඩසටහන් පැවැත්වීමටත්, පසුව ප්‍රාදේශීය මට්ටමේ නිලධාරීන් මඟින් පෙර පාසල් ගුරුවරුන් දැනුවත් කිරීමටත් 2018 වසරේදී සැලසුම් කර ඇත. මේ සඳහා වැය වූ මුදල රු.මි.0.755කි.

## 6.25 "වැලි කෙළියෙන් පිටු අතරට" ළමා හිතකාමී අධ්‍යාපනය පිළිබඳ නියමු ව්‍යාපාතිය

මුල් ළමාවිය දරුවන්ගේ වයස අවුරුදු 3 -5 අතර කාලය භාෂා සංවර්ධනය, පෞරුෂ සංවර්ධනය, සමාජානුයෝජනය ආදී කාර්යයන් කෙරෙහි වැඩි වැදගත්කමක් දක්වයි. මෙකී සියලු කාර්යයන් සඳහා මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන තුළින් සක්‍රීය දායකත්වයක් දැක්විය යුතුය. එකී පදනම තුළ සිට මුල් ළමාවිය දරුවා විධිමත් පරිදි පාසල වෙත පිවිසිය යුතුය. මෙම මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයෙන් විධිමත් පාසලට පිවිසෙන දරුවා හට එකී සංක්‍රාන්තිය සුමට සංක්‍රාන්තියක් විය යුතු නමුත් එම තත්ත්වය එසේම වේදැයි විවාදයට තුඩු දෙන කරුණකි. පෙර පාසල තුළ පෙර පාසල් ගුරුවරයා සතු කාර්යය හා විධිමත් පාසල තුළ ප්‍රාථමික අංශයේ ගුරුවරයා සතු කාර්යය හා වගකීම නිසිලෙස වෙන්කොට හඳුනා ගැනීම,

ක්ෂේත්‍රය තුළ ක්‍රියාවට නැංවීම හා පසුවිපරම සඳහා සුදුසු ක්‍රමවේදයක් සැකසීම මෙම ව්‍යාපාතිය තුළින් ඉටු කිරීමට බලාපොරොත්තු වන කාර්යයන් වේ.

මෙම නියමු ව්‍යාපෘතිය සඳහා 2017 ක්‍රියාකාරී සැලැස්ම මගින් රු.මි.0.6 ක ප්‍රතිපාදන වෙන් කරන ලද අතර කොළඹ, අනුරාධපුර, කුරුණෑගල, කෑගල්ල, මාතර සහ මොණරාගල දිස්ත්‍රික්ක කේන්ද්‍ර කර ගනිමින් වැඩසටහන් 30 ක් පවත්වා අවසන් කර ඇති අතර එහි මූල්‍ය ප්‍රගතිය රු.0.589 කි.

### 6.26. විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සිටින දිවා සුරැකුම් මධ්‍යස්ථාන සඳහා උපකරණ ලබා දීම.

විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සිටින දිවා සුරැකුම් මධ්‍යස්ථාන සඳහා අවශ්‍ය වන ඉගෙනුම් උපකරණ ලබා දීම සඳහා 2017 ක්‍රියාකාරී සැලැස්ම මගින් රු.මි.0.264 ක ප්‍රතිපාදන වෙන් කරන ලද අතර ළමා ලේකම් කාර්යාලය වෙත ලැබුණු ඉල්ලීම් සලකා බලා උපකරණමය ආධාර ලබා දීමසිදු කරන ලදි.

### 6.27 ප්‍රාදේශීය මට්ටමේ විශේෂ ව්‍යාපෘතීන්

ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් මුල් ළමාවිය හා සම්බන්ධව හඳුනාගත් ගැටළු ආශ්‍රිතව සාකච්ඡා කරන ලද විශේෂ ව්‍යාපෘති යෝජනා අතුරින් තෝරාගත් සුදුසු ව්‍යාපෘති යෝජනා ක්‍රියාත්මක කිරීම මෙහි දී සිදු කෙරිණි. ඒ අනුව මේ සඳහා රු.මිලියන 0.4 ක් වෙන් කල අතර එහි මූල්‍ය ප්‍රගතිය රු. මිලියන 0.390කි. ප්‍රතිපාදන නිදහස් කර ඇත. ඒ අනුව හොරණ, වැලිකන්ද, ඇහැළියගොඩ, තමන්කඩුව යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී.